ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 ජූලි 19 වන බදාදා
3 කාණ්ඩය 33 කලාපය
මිල රු. 80 යි

විශේෂ අතිරේකයක්
නොමිලේ



දොස්තර වෙන්න කලින් මුට්ට කරගැහුවා

දබර වෙච්ච අයව යාළු කරන කේක් සුරංගනාවී

බඹර වදය වාහනේ දාගෙන යද්දී මට කිසි බයක් දැනෙන්නේ නෑ

අනේ පනේ කියන පිරිමි තමයි ලොකුම ඇණේ

ව්‍යවසායිකා
ෂෙහානි රොෂාලියා

ඡායාරූපය - ක්‍රිෂාන් කාරියවසම්

# හරිස්චන්ද්‍ර රස මැදුර



විධායක සූපවේදී
සුජිත් ආරියරත්න



## ස්පයිසි POTATO බෝල්

- තම්බාගත් අල 350g
- හරිස්චන්ද්‍ර සුදු කැකුළු හාල් පිටි 150g
- හීනියට කපාගත් ලූනු 50g
- තම්බාගත් බිත්තර 2
- සුදු ලූනු 5g
- පොල් කිරි (අවශ්‍ය පමණ) 500ML
- හරිස්චන්ද්‍ර හාල්පිටි
- පදමට ලුණු
- ගම්මිරිස් 5g
- කෑලි මිරිස් 5g
- බේකිං පවුඩර් 3g
- බැද ගැනීමට තෙල්

❖ අල හොඳින් තම්බාගෙන පොඩිකර ගන්න. ඉන්පසුව එයට ලූනු, කැරට්, ලීක්ස්, සුදුලූනු, අමුමිරිස් එකතු කර ගන්න.

❖ ඉන්පසුව හාල්පිටි, බේකිං පවුඩර් අල සමග මිශ්‍රකර ගන්න.

❖ පොල් කිරි මිශ්‍රකර උකු මිශ්‍රණයක් සාදා ගන්න.

❖ ඉන්පසුව හැන්දකින් මිශ්‍රණය ටික ටික ගෙන රත් වූ තෙල් බැද ගන්න.

## හරිස්චන්ද්‍ර කොෆි පුඩිං

- හරිස්චන්ද්‍ර කොෆි තේ හැඳි 3
- සීනි 50g
- කෝන් පිටි 150g
- නැවුම් එළකිරි 10L
- රෝස්කරගත් රටකජු
- වියළි මිදි 50g

❖ කොෆි කෝන් පිටි සහ සීනි එකට දියකර ගන්න.

❖ දැන් මෙම මිශ්‍රණය ළිප තබා උකුවන තෙක් හොඳින් හැඳි ගාන්න.

❖ මිශ්‍රණයය උකු වුණ පසු එයට කජු වියළි මිදි එකතුකර සුදුසු භාජනවලට දමා ශීතකරණය තබා පිළිගන්වන්න.

සටහන : රුවන් අමරසේකර


# විශිෂ්ටත්වයේ විශ්වාසය




හරිස්චන්ද්‍ර කර්මාන්ත ආයතනය - මාතර

# බඹර වදය වාහනේ දාගෙන යද්දී මට කිසි බයක් දැනෙන්නේ නෑ

## මේෂා සමාධි විජේසිංහ

**'බඹරුන් පසුපස මල් දිව නොගියට අවමන් වින්දේ මල් කුලයම නොවෙදෝ' කියලා අතුල අධිකාරී මහත්මයා ගායනා කරන ගීතයක් තියනවනේ. ඒ ගීතයට මම නම් ප්‍රිය කරන්නේ ගැහැනු - පිරිමි අතර පවතින සම්බන්ධතාවල යථාර්ථය එහි ව්‍යංගාර්ථයෙන් හරි අපූරුවට මතුකරලා පෙන්වන නිසා. ඇත්ත නේන්නම්... බඹරු මල් පසු පස්සේ දිවගියා මිසක් මල් කවද්ද බඹරු පස්සේ දිව්වේ? හැබැයි මේ කියන්න යන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් කතාවක්. ඇත්තටම බඹරු පස්සේ දුවන මලක් අපිට හම්බ වුණා. එක බඹරෙක් නම් බැරියැ? දහස් ගණන් බඹර රංචු සිටින තැන් හොයාගෙන ගිහින් උන්ව වාහනේට දාගෙන එන මලක් ගැනයි මේ කතාව.**



සමාධි බඹරුන් සමඟ වාහනයේ

ඇයගේ නම තමයි මේෂා සමාධි විජේසිංහ. අම්මටයි තාත්තටයි පස්සේ පුංචි සමාධි වැඩිපුරම කිට්ටු වුණේ එයාගේ බාප්පට. මේ බාප්පාට හරි අපූරු විනෝදාංශයක් තිබුණා. ඒ තමයි ගෙදර මී මැස්සෝ ඇතිකරන එක. ඉතින් බාප්පා මී මැස්සෝ එක්ක කරන මේ අපූරු ගනුදෙනුව දිහා බලාගෙනයි සමාධි ඇතිදැඩි වුණේ. බාප්පා මී මැස්සෝ අතට ගන්න හැටි එහෙම පුංචි කෙල්ල හරි ආසාවෙන් බලාගෙන හිටියා.

දවසක් සමාධිට හිතුණා බාප්පට හොරෙන් පොඩි හිතුවක්කාර වැඩක් කරන්න. එහෙම හිතලා බාප්පා කරන විදියට ඇයත් මී මැස්සන්ව අතට ගත්තා. හැබැයි හරිහැටි මී මැස්සෝ අල්ලන සාස්තරේ නොදැන හිටපු පුංචි දැරිවිගේ මූණේ තැන් කිහිපයකටම මී මැස්සෝ දෂ්ඨ කළා. කොහොමහරි ඒකෙන් මේකෙන් වුණේ මී මැස්සෝ ගැන කෙල්ලගේ හිතේ තිබුණු අංශුමාත්‍ර බයත් නැතිවුණු එක.

**"ඔහොම යද්දි බාප්පම මට මී මැස්සෝ අල්ලන හැටි හුරුකළා. ඒත් ඉතින් ඉඳලා හිටලා විදපු වෙලාවලුත් තිබුණා. මට මතකයි ඉස්සර ඉස්කෝලේ යනකොට මාසෙකට දෙතුන්සැරයක් විතර මගේ මූණේ සමහර තැන් ඉදිමිලා. එතකොට ටීචර්ලා දන්නවා මට මී මැස්සෝ ඇනලා කියලා. සමහර දවස්වලට ටීචර්ලා මාව ඒ විදියටම අනෙක් පන්තිවලට එක්ක ගිහින් මූණ පෙන්නලා මං මෙහෙම වැඩත් කරනවා කියලා අගය කරනවා."**

මහනුවර ඔගස්ටාවත්තේ ඉන්න සමාධිට දැන් වයස අවුරුදු 26ක්. දැන් මේ තරුණියට මී මැස්සෝ විතරක් නෙවෙයි බඹරු, දෙබරු එක්ක පවා ගනුදෙනු කරන්න පුළුවන්. බාප්පාගෙන් ලැබුණු ගුරුහරුකම් වගේම බිඟු සම්පත සුරැකීමේ සංවිධානයෙන් ලැබුණු මඟපෙන්වීමත් එක්කයි ඒ හපන්කම ඇයට ලැබිලා තියෙන්නේ.

බිඟු සම්පත සුරැකීමේ සංවිධානය කියන්නේ මේ වෙනකොට ලංකාවේ ප්‍රසිද්ධ සංවිධානයක්. එහි ලේකම් විදියට කටයුතු කරන්නේ තිස්ස බණ්ඩාර මහත්තයා. ජාතික සංවිධායක වෙන්නේ සමාධිගේ බාප්පා වෙන තුෂාර මහින්ද මහත්තයා. සමාධි කියන විදියට ඔවුන් තමයි මිනිස් ආශ්‍රයේ ගැවසෙන මී මැස්සෝ, බඹරු සහ දෙබරු වගේ සත්තු ඒ ස්ථානවලින් ඉවත්කරලා පරිස්සමට පරිසරයට මුදාහරින ක්‍රියාදාමයක් පටන්අරන් තියෙන්නේ. ඒ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ලෝකයෙන් තුරන්වීගෙන යන මේ අහිංසකයන්ව රැකගැනීමේ අරමුණින්.

**"ඇත්තටම මේක හිතන තරම් ලේසි වැඩක් නෙවෙයි. මොකද බඹරු, දෙබරු වගේ සත්තු එක්ක ගනුදෙනු කරන එක ලේසි නෑ. හැබැයි හරියට මී මැසි පාලනය ඉගෙනගත්ත කෙනෙකුට ඒ සත්තුත් එක්ක වැඩ කරන්න පුළුවන්. ඒ සත්තු ගොඩාක් වෙලාවට වද බඳින්නේ මිනිස්සුන්ට බලපෑම් වෙන්න පුළුවන් තැන්වල. ඔය ගල් පර්වත එක්ක තියෙන පැරණි ආගමික ස්ථානවල එහෙම වද බඳිනවා වැඩියි. හොඳම උදාහරණය තමයි සීගිරිය, දඹුල්ල වගේ තැන්. ඒ වගේමයි තේ වතුවල එහෙම ගැවසෙනවා වැඩියි. ඉතින් මං කරන්නේ අපේ සංවිධානය හරහා ඒ අයට කිසිම හානියක් නොවෙන්න නිරුපද්‍රිතව අල්ලලා කැලෑවට මුදාහරින එක."**

හැබැයි සමාධි ඒක කරන්නේ ඇඟ කිළිපොලාගෙන යන විදියේ අවදානමක් අරන්. ඒක තමයි ඇයගේ කතාවේ තියෙන විශේෂත්වය.

"මං ඒ සත්තු අරන් යන්නේ වෑන් එකේ දාගෙන. ඒ ගිහින් වාහනේ කැලෑවක් කිට්ටුව නවත්තලා දොරවල් ඇරියම එයාලා එයාලගේ පාඩුවේ කැලෑවට යනවා. ඉන්නකෝ වෑන් එකේ ෆොටෝස් ටිකක් ඔයාට පෙන්වන්න."



සමාධිගේ වාහනය ඇතුළත සිටින බඹරුන්

එහෙම කියපු සමාධි ඇයගේ වෑන් එකේ ෆොටෝස් කීපයක් මට වට්සැප් කළා. දෙවියනේ, ඒ වෑන් එක දැකපු ගමන් මට හිතුණෙම ඒක ලෝකේ භයානකම වාහනේ කියලා. ඇයි ඉතින් බලන බලන තැන එක පොකුරට බඹරු. වීදුරුවලත් බඹරු. වහලෙත් බඹරු. සීට්වලත් බඹරු. ඒ වාහනේ බලන බලන හැමතැනකම බඹරු. ඉතින් කිසිම ආරක්ෂිත ක්‍රමවේදයක් නැතුව එහෙව් වාහනයක් කිලෝමීටර් ගාණක් අරන් යනවා කියන්නේම අවදානමක් කියලයි මට හිතුණේ.

**"බඹර වදයක් ගත්තම ඒකෙ අඩුම බඹරු දහක්වත් ඉන්නවා. එච්චර බඹරු ගොඩක් වාහනේ දාගෙන ගියාට මට බයක් දැනෙන්නේ නෑ. දැන් ඒක පුරුදු වෙලා. ඒත් වෑන් එක දන්න කියන අය නම් වැරදිලාවත් මේ වෑන් එක ළඟට එන්නේ නෑ. වැරදිලා හරි ළඟට ආපු අයත් ඇතුළ දැකපු ගමන් ආපහු හැරිලා දුවනවා. අඩුතරමේ මේ වෑන් එක පොලිසියෙන්වත් නවත්තන්නේ නෑ."**

ඒකට නම් මටත් හිනා. කොහොම හරි ඊළඟට මං ඇහුවේ ඇය මේ දේවල් කරන්නේ මොන වගේ ක්‍රමවේදයකටද කියලා. ඒකට සමාධි දුන්නේ මෙහෙම උත්තරයක්.

"අපිට කිව්වොත් අසවල් තැන තියෙන මී මැසි වද, බඹර වද, දෙබර වද අයින් කරලා දෙන්න කියලා අපි ඒක අයින් කරලා දෙනවා. දැනට ලංකාවේ කොහේ හරි එහෙම ප්‍රශ්නයක් තිබුණොත් අපට තමයි ඉතින් කතා කරන්නේ. මීට අවුරුදු කීපයකට උඩදි වික්ටෝරියා වේල්ලේ හිටපු බඹරු අයින් කරන්නත් මං ගියා. මොකද වේල්ලේ තිබුණු බඹර වද හින්දා ඉංජිනේරුවන්ට ඒක අලුත්වැඩියා කටයුතු කරන එක ප්‍රශ්නයක් වෙලා තිබුණේ. ඒත් එතැන ගැඹුරත් එක්කලා වැඩේ ලේසිවුණේ නෑ. ඒක තමයි දැනට මං කරපු අමාරුම වැඩේ."

එහෙම අයින් කරන මීමැස්සෝ නැත්නම් බඹරු, දෙබරු තමයිලු සමාධි ඇයගේ වාහනේ අරන් ගිහින් කැලෑවට මුදාහරින්නේ. ඒ නැත්නම් කරන්නේ ඔවුන්ව ආරක්ෂිත කුටීරවලට දාලා අරන් ගිහින් කැලෑවට මුදාහරින එකලු.

**"මී මැස්සෝ, බඹරු, දෙබරු වගේ සත්තු අපේ පරිසරයේ ඉන්න ඕනේ. ඔවුන් නැතිවුණොත් මිනිස්සු වෙන අපිට ඒක බලපානවා. ඒත් ගොඩාක් අය කරන්නේ බඹරු, දෙබරු දැක්ක ගමන් ඒ වද පුච්චලා දාන එක. මං කියන්නේ එහෙම කරන්න එපා. මොකද පරිසරයේ ඉදිරි පැවැත්මට ඔවුන් අත්‍යවශ්‍ය සාධකයක්."**

මෙහෙම මී මැස්සෝ, බඹරු, දෙබරු එක්ක ගැවසෙන සමාධිට අමතක නොවෙන සිදුවීම් නොතියෙන්න විදියක් නෑනේ. ඉතින් මම ඒ ගැනත් ඇහුවා.

"බාප්පා එකපාරක් මගේ මූණේ ලොකු බඹර වදයක් එල්ලුවා. එදා නම් ලොකු බයක් දැනුණා. ඒත් දැන් නම් එහෙම නෑ."

සමාධි කියන්නේ පවුලේ එකම ගෑනු ළමයලු. ඇයට තව ඉන්නේ මල්ලිලා දෙන්නෙක්. සමාධි කියන විදියට මුලදි ඇය බිඟු පාලනයට යොමුවෙලා තියෙන්නේ විනෝදාංශයක් හැටියට. ඒත් දැන් ඇය ඒක කරන්නේ ජාතික මෙහෙවරක් කියලා හිතලලු.

"මේ වෙනකොට මං උසස් අධ්‍යාපනයේ නිරතවෙනවා. මගේ හීනය කවදා හරි ගණකාධිකාරිවරියක් වෙන එක. හැබැයි මී මැස්සෝ, බඹරු, දෙබරු එක්ක තියෙන ගනුදෙනුව නම් මං නවත්තන්නේ නෑ. මොකද සමහරුන්ට බල්ලෝ පූසෝ වගේ තමා මට ඒ සත්තු. එයාලා විද්දත් දැන් මට රිදෙන්නේ නෑ. ඔවුන් එක්ක ගැවසෙන එක මට ලොකු මානසික සුවයක්."



සමාධි කුඩා කාලයේදී මී මැස්සන් සමඟ

**මී මැස්සෝ, බඹරු, දෙබරු එක්ක තියෙන ගනුදෙනුව මං නවත්තන්නේ නෑ. සමහරුන්ට බල්ලෝ පූසෝ වගේ තමා මට ඒ සත්තු**

■ රුවන් එස්.සෙනවිරත්න

# රත්තරන් දුවේ



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

# රුපියල් දෙදාහ අරගෙන නාවට ඒ මිනිහා මට කුණුහරුපෙන් බැන්නා



මතුගම අපේ නිසංක පොන්නම්පෙරුම සර් හැමදාම පංතියට එන්නේ විෂය නිර්දේශයත් ජීවිතයත් එකට බද්ධ කරවන බොහෝ දේ අරගෙන. නිසංක සර් එදා කවි පාඩම උගන්වන්න කලින් අපූරු ජනකවි දෙක තුනක් කියලා දුන්නා. අද කවි ලියන අයගෙත් ගමේ අයගේ ජනකවිත් අහසට පොළොව සේ ඈත බව පෙන්වන්න තමයි සර් මේ කවි ටික කියලා දුන්නේ. සම්මාන බලාගෙන බලු පොරයකට වැටිලා කවි පොත් විකුණන ව්‍යාපාරයක් බවට සිංහල කවිය වැටිලා කියලා අපට තේරුණොත් මිල මුදලක් අය නොකොට ගැමියා කියූ මේ කවි නිසා කියලා සර් කියලා දුන්නා.

**'මිනි මිනි පොදේ ගන අඳුරේ කති මදුරු**
**බල්ලෙක් ඉඳන් උඩුබුරුලයි උගෙ නපුරු**
**කෙල්ලෙක් ඉඳන් දෙර නාරියි ඇගෙ නපුරු**
**මල්ලක් කදුරු කන්නෙමි විගස දෙර හරු**

ඔන්න දුවේ මිනිහෙක් තරුණියක් ඉන්න ගෙයක් ළඟට ගිහිල්ලා මේ කවිය කියනවා මහ රැයක. පොද වැස්සේ ඔහු තෙමෙනකොට බල්ලෙකුත් උඩු බුරන්න ගත්තා. හැබැයි ගේ ඇතුළේ සිටිය තරුණිය දොර ඇරියේ නෑ. ඒ නිසා කදුරු ගෙඩි කා දිවි නසාගන්නා බවට තරුණයා තර්ජනය කරා. ඔහු හිතුවේ ගැහැනු, හිත උණුවෙන පිරිසක් නිසා තමාට දොර හැර දේවි කියලයි. මේ කවිය ගේ ඇතුළේ සිටින තරුණියට ඇහුණා. ජීවිතේට දැකලාවත් නැති මේ නාඳුනන කොල්ලෙක්ගේ බහට රැවටී ඌට බිල්ලක් වෙන්න මේ දුව කල්පනා කරේ නැහැ. ඇය කළේ ඊට පිළිතුරු කවියක් ගේ ඇතුළෙම සිට ඔහුට ඇසෙන්න කියපු එක.

**'අට පහ නොදන්නා තෝ කාගේ කවුද**
**බසක් නැතුව එන්නට කිව්වේ කවුද**
**ගසක් නැතුව ගෙඩි හටගන්නේ කොහෙද**
**මල්ලට දෙමල්ලක් කාපිය මගෙ මොකද'**

අටසිල්වත් පන්සිල්වත් නොදන්නා උඹ මොකෙක්ද? මං එන්න කියල නොකියා ආව උඹ කවුද? මල් පිපෙන්න ගහක් තියෙන්න එපායෑ. වහකදුරු මල්ලක් බැරි නම් දෙකක් කාලා මැරියන් මට මොකද?

වහකදුරු කෑවොත් මැරෙන බවත් දකුණෙ උදවිය දන්නවනේ. ඉතින් කොල්ලා වැස්සේ තෙමි තෙමි පැනලා ගියා. ගොඩක් කොල්ලෝ කෙල්ලන් බය කරන්න යොදාගන්නේ ආවේ නැත්නම් මං මැරෙනවා කියන කීමනේ. ඉතින් දුවේ මෙන්න මේ වගේ මුහුණුපොතෙන් එන නන්නාඳුනන අයගෙන් බේරෙන්න ඕනෑය කියලා නිසංක පොන්නම්පෙරුම සර් පංතියේ නූතන කවි පිළිබඳ දේශනය පටන්ගත්තා.

පාඩම කරලා සර් එදා ගෙදර ගියාම මතුගම පන්තියේ ශිෂ්‍යාවකගෙන් ඇමතුමක් ලැබුණා. "සර් අද කිව්ව කවිය හරි හොඳයි. මටත් තියෙනවා සර්ට කියන්න කතාවක්. අපි ගොඩක් දුප්පත්. තාත්තා ගොවියෙක්. අපි හරිම අමාරුවෙන් තමයි ඉගෙනගන්නෙත්. ඉතින් සර් කිව්වා වගේ මුහුණුපොතෙන් මටත් මුණගැහුණා කෙනෙක්. මං එයාව කවදාවත් දැකලා නැහැ. අපි නිතර නිතර කතා වෙනවා. මං කෑවද කියලා අහනවා. හොඳට පාඩම් කරන්න කියනවා. ඉතින් සර් මං හිතුවේ මගේ අධ්‍යාපනයටත් අත හිත දෙන මටම ගැළපෙන කෙනා හම්බවුණා කියලා. මේ විදියට මාස දෙක තුනක් අපි මෙහෙම කතා කරා. ගෙදර අයට අහුවෙයි කියලා එයාගේ ෆොටෝ එකක්වත් මුහුණුපොතට දාන්නේ නැහැ. දවසක් එයා කිව්වා මට ඔයාට දකින්න ආසයි. අද පංති එනකොට අඳින ගවුම, ඒකෙ පාට ගැන එහෙමත් ඇහුවා. මම මතුගම පංතියට එදත් ගියා. ඒත් එයා ආවේ නැහැ. එදා රෑ එයා මට කියනවා මං දැක්කා ඔයාව එත් ආවේ නැහැ ළඟට අනිත් අයට පේන හින්දා කියලා. මට එදා නම් සර් ඒ ගැන කිසිම සැකයක් ඇති වුණේ නැහැ. මං පංතියට එන දිහා එයා බලන් ඉඳලා තියෙනවා. මොකක්දෝ හේතුවක් හින්දා මට පේන්න ආවේ නැහැ. ඔය විදියට සර් මාස දෙකක් ගත වුණා. ඉඳලා හිටලා එයාගේ දුරකතනයට රුපියල් සීය දෙසීය ඩේටා කාඩ් මං දැම්මා. එයාට ගොඩක් ආර්ථික ප්‍රශ්න තියෙනවා කියලත් එයා කිව්වා. එයාට තාත්තා නැතිලු. අම්මා කුලී වැඩ කරලලු ජීවත්වෙන්නේ. පුංචි පැල්පතකලු ජීවත්වෙන්නේ. මං සර් ඔක්කොම විශ්වාස කරා. එයා කියන්නෙත් නැතිව මං එයාගේ අංකයට ඩේටා කාඩ් දැම්මා.

> මං එදා ඒ ගමන ගියේ නෑ සර්. මං බස් එකට නැග්ග තැනින් බැහැලා තාත්තා වැඩ කරන කුඹුරට ගියා

ඔන්න ඔය අතරවාරයේ දවසක මෙයා කිව්වා අපි දෙන්නා සිකුරාදාවක හමුවෙමු කියලා. මං එකපාරටම හා කිව්වා. පංති යන විදියට මට එන්න කිව්වා. තුවායක්, අතිරේක ඇඳුමක් එහෙමත් ගේන්න කිව්වා. පුළුවන් නම් රුපියල් දෙදාහකුත් අරගෙන එන්න කිව්වා. ඇඳුම් ටික නම් හරි. ඒත් රුපියල් 2000 අපට ලොකු ගණනක්. මං ඒක මගෙ දුප්පත් තාත්තට කිව්වේ නැහැ. බ්‍රහස්පතින්දා හවස මං කිව්වා හෙට තාත්තේ අතිරේක පංතියක්. මට රුපියල් දෙදාහක් ඕන හෙට කියලා. 'අනේ පුතේ දැන් කොහොමද මං සල්ලි හොයන්නේ' කියලා තාත්තා කල්පනා කරන්න පටන්ගත්තා. මං පහුවෙනිදා උදේ නැගිට්ටම තාත්තත් මාත් එක්ක පාරට ආවා. අපේ ගෙදර ඉඳලා කිලෝමීටර් තුන හතරක් තියෙනවා බස් පාරට. මං තාත්තා එක්ක පාන්දර පහට පිටත් වුණා. අඟලෙන් අඟලට අර අයියා කෝල් කරනවා. මං දුරකතනය නිහඬ කරා. බස් එක එන්න කලින් තාත්තා මට රුපියල් දෙදාහක් දුන්නා. 'දුවේ මේ මං හදිස්සියකට කියලා තියාගෙන ඉඳපු ඉන්න රුපියල්2000 ක්.' සර් ඒ රුපියල් දෙදාහ රෝල් කරලා කොහේහරි තියාගත්තු මුදලක්. මං ඒක ගත්තා. මං දැක්කා තාත්තගෙ කකුලේ රෙදිපටියක්. 'ඇයි තාත්තේ කකුල?' 'පුතේ ඊයේ උදැල්ල පොඩ්ඩක් වැදුනා. මං සරම ඉරලා කකුල බැඳගත්තා.' බස් එකක් එනකල් ඉඳලා තාත්තා ගියා. මං මතුගමට යන බස් එකක් එනකල් බස් නැවතුම්පොළේ ඉන්නකොට එතැන හිටිය අපේ ගමේ නැන්දා කෙනෙක්. ඒ නැන්දගේ මහත්තයා උදැල්ලට කකුල කැපිලා මතුගම රෝහලේ නවත්වලා. නැන්දා යනවා මාමා බලන්න. ඉතින් සර් මතුගමට යන බස් එක ආවා. නැන්දා නැග්ගා. මං නැග්ගේ නැහැ. සර්, මං ටිකක් වෙලා ඉඳලා අපේ ගමට යන බස් එකට නැග්ගා. මං බස් එකට නැග්ග තැනින් බැහැලා තාත්තා වැඩ කරන කුඹුරට ගියා. 'තාත්තේ පංතිය නෑ කියලා කෝල් එකක් ආවා. තාත්තා තේ එකක්වත් බීලා නෙවෙයි නේද කුඹුරට ආවේ?' 'ඔව් දුව. මට බඩගිනි නෑ. දුව ගෙදර යන්න.' 'බැහැ තාත්තේ යමු ගෙදර. ඔය තුවාලයට බෙහෙත් දාන්න ඕන. යං ගෙදර.'

මං තාත්තව බලෙන්ම ගෙදරට එක්කරගෙන ආවා. තාත්තා ඇඳේ වාඩි කරලා මං අම්මට කිව්වා 'අම්මේ පංති නෑ අද. මට උණුවතුර ටිකක් බේසමට දාලා දෙන්න තාත්තගේ කකුල හෝදලා බෙහෙත් දාන්න ඕන. තාත්තගේ කකුලේ තුවාලයක්' අම්මා වතුර බේසම දුන්නම මං තාත්තගේ පතුල් දෙකම සබන් ගාලා හේදුවා. රෙදි කෑල්ල විසි කරලා මගේ ළග තිබුණ බෙහෙත් බැන්ඩේජ් අරගෙන තාත්තගේ කකුලට බෙහෙත් දැම්මා. මං කිව්වා 'තාත්තේ අද කුඹුරට යන්න යන්න එපා.' මං අම්මට කියලා හැදුවා කිරිබතක්. ඒක තාත්තට කවලා සර් මං අර අරගෙන ගිය තුවායෙන් තාත්තගේ කකුල් දෙක පිහිදැම්මා. ඊටපස්සේ මං කාමරයට ගියා. අරයා ඇමතුම් සියයකට වඩා අරන්. මං ගත්තා කෝල් එකක්. මට තිත්ත කුණුහරපෙන් බැන්නා. 'තෝ ඔහොම කරන එකියක් නම් මට තිබ්බා වෙන කෙල්ලෙක් අරගෙන යන්න. අපරාදේ උඹට මගේ කාලය නාස්ති කරගත්තේ මාස හතරක්.' ඉතින් සර් මං ඒ සිම් එක අයින් කරා. තාත්තාගේ රුපියල් දෙදාහ මම තාත්තට දුන්නා. ආයේ කවමදාකවත් මගේ අහිංසක තාත්තට අම්මට මං වැරැද්දක් කරන්නේ නැහැ. මං හොඳට ඉගෙනගන්නවා. මං නීතීඥවරියක් වෙන්න තීරණය කරලයි දැන් සර්ගේ පංතියට එන්නේ.

අත්තනායක එම්. හේරත්

# පියෝඩේල් බැතිබර දායකත්වයෙන් ඔබේ දෙමව්පියන්ට දඹදිව වන්දනා කිරීමට

# නොමිලේ අවස්ථාවක් හිමිකර ගන්න!

නොවැම්බර් මාසයේ දඹදිව පැවැත්වෙන කඨින පිංකම ඇතුළුව දින 15ක සියලු සැප පහසුකම් සහිත මෙම වන්දනා ගමන නොමිලේ ලැබෙන අනගි අවස්ථාවකි.

pure dale පියෝඩේල්
දඹදිව වන්දනා



36 දෙනෙකුට අවස්ථාව හිමිවේ. කුසපත් ඇදීම 2023 අගෝස්තු මස 30 වෙනිදා නාවල වික්‍රමසිංහාරාමයේදී පැවැත්වේ.

ඕනෑම පියෝඩේල් කිරි පැකට්ටුවක උඩු පියන්පත හෝ හිස් දවටනය සමග ඔබේ දෙමව්පියන්ගේ හෝ ඔබ පවුලේ දෙදෙනෙකුගේ

- සම්පූර්ණ නම් (උපරිම දෙදෙනෙකු පමණි)
- ලිපිනය
- දුරකථන අංකය
- ජාතික හැඳුනුම්පත් අංක

පහත ලිපිනයට එවන්න.

පියෝඩේල් - දඹදිව වන්දනා
තැ.පෙ. 12, නුගේගොඩ.




pure dale තවත් පියෝඩේල් ප්‍රජා සත්කාරයක්!

# මහත්තයාට කුද ගහගන්න කියා බිලියනපතිනියක් වූ රුත්

මහත්තයාට ඕන කුදයක් ගහගන්න කියලා හදපු අමුතු විදියේ බෝනික්කෙක් නිසා බිලියනපතිනියක් වුණු ඇමරිකානු නෝනා කෙනෙක් ගැනයි කියන්න යන්නේ. මේ නෝනාගේ නම තමයි රුත් හැන්ඩ්ලර්. රුත් බිලියනපතිනියක් වුණේ මෙන්න මෙහෙමයි.

දවසක් රුත් හැන්ඩ්ලර්, එයාගෙ පුංචි දුව බාබරා බෝනික්කන් එක්ක සෙල්ලම් කරන හැටි බලාගෙන හිටියා. එතකොට දුව කරපු විශේෂ දෙයක් ගැන ඇගේ අවධානය යොමුවුණා. ඒ තමයි දුව එයාගේ කඩදාසි බෝනික්කන්ට වැඩිහිටි චරිත ආරෝපණය කිරීම. අපේ දරුවොත් බෝනික්කෝ එක්ක සෙල්ලම් කරද්දී 'අම්මා, අක්කා' ආදී විවිධ චරිත ආරෝපණය කරනවනේ. සමහරවිට රුත්ගේ දුව කරන්න ඇත්තෙත් ඒකමයි. හැබැයි දරුවො බෝනික්කන්ට මෙහෙම වැඩිහිටි චරිත දුන්නට, වැඩිහිටි පෙනුම සහිත බෝනික්කන් වෙළඳපොළේ නැති බව රුත්ට තෙරුම්යන්න ගත්තේ මේ සිද්ධියෙන් පස්සෙ. බැරිවෙලා හරි එහෙම බෝනික්කෝ හිටියානම් පුංචි දැරිවියන්ට ඒ අයගේ අනාගත ප්‍රතිරූප ගැන යම්කිසි හැඟීමක් ඇතිකරගන්න පුළුවන් නේද කියලා ඇයට හිතුණා.

රුත් මේ අදහස මුලින්ම කිව්වේ එයාගේ මහත්තයා Elliot ට. මොකද ඒ වෙනකොටත් සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන සමාගමක් මේ දෙදෙනා සතුව තිබුණා. ඒ තමයි අද වෙනකොට ඇමරිකානු ඩොලර් බිලියන ගණනක වත්කම් හිමි Mattal සමාගම. අද එහෙම වුණාට එද ඒක බොහොම පුංචි පහේ සමාගමක්. ඊට අවුරුදු කිහිපයකට කලින් රුත්ගේ ගෙදර ගරාජයේ තමයි මේ සමාගම උපත ලබලා තිබුණේ. හැබැයි ඉතින් රුත්ගේ අදහසට සැමියා විතරක් නෙවෙයි Mattal සමාගමේ ඉඳපු කිසිම නිලධාරියෙක් කැමති වුණේ නැහැ. ඔවුන් එකහෙලාම ඇගේ අදහස ප්‍රතික්ෂේප කළා.

"මේකට ලොකු නිෂ්පාදන පිරිවැයක් යනවා. අනික මේ වගේ බෝනික්කන්ට බොහොම පුංචි වෙළඳපොළක් විතරයි තියෙන්නේ." Mattal සමාගමේ ඉඳපු පිරිමි පරාණ ටික රුත්ගේ හිතේ ඉඳපු බෝනික්කිව ඉපදෙන්නත් කලින් මරලා දැම්මේ ඒ විදියට.

කොහොමහරි තමන්ගේ අදහස ප්‍රතික්ෂේප වුණාට පස්සේ 1956 අවුරුද්දේ දවසක රුත්, එයාගේ දුව බාබරා සහ පුතා කෙන් එක්ක යුරෝපයේ සංචාරයකට ගියා. ජර්මනියේ ඉඳපු සෙල්ලම් බෝනික්කෙක් ඇවිල්ලා නොහිතපු විදියට රුත්ගේ ඇස් දෙකේ ගැටුනේ ඔය ගමනේදී. එයාගෙ නම තමයි Bild Lilli. වැඩිහිටි කාන්තාවකගේ ශරීර ශෝභාව නිරූපණය වෙන විදියට නිර්මාණය කරලා තිබුණු ලිලී හරියටම තමන්ගේ හිතේ ඇඳුනු බෝනික්කි වගේමයි කියලා රුත්ට හිතුණා. ඉතින් ඇය මොකද දන්නවාද කළේ? එයින් බෝනික්කෝ තුන්දෙනේක්ම මිලදී ගත්තා.

කොහොමහරි ආපහු ඇමරිකාවට ආපු රුත්, ජැක් රයන් කියන නිර්මාණ ශිල්පියාගේ උදව් ඇතිව, ලිලීව redesign කළා. ඒ කියන්නේ ප්‍රතිනිර්මාණය කළා. ඊටපස්සේ තමන්ගේ දියණිය බාබරාව සිහිකරගෙන ඇය මේ සුරතල් බෝනික්කිට 'බාබි/ Barbie' කියලා නමක් දැම්මා. බාබි මුල්ම වරට කලඑළි බැස්සේ නිව්යෝර්ක්වල තිබුණු 'American International Toy Fair' කියන මේ ප්‍රදර්ශනයේදි. ඒ 1959 මාර්තු 9 වැනිදා. ඒ දවස තමයි බාබි ඩෝල් කියන විලාසිතා බෝනික්කිගේ උපන්දිනය විදියට සැලකෙන්නේ.

උපදිනකොටම බාබි හිටියේ සීබ්‍රා ඉරි තියෙන ස්විම් සූට් එකකුත් ඇඳලා ලස්සන (Topknot) පෝනිටේල් එකකුත් දාගෙන. බාබිගේ අම්මා 'රුත්' ඇමරිකාවේ වුණාට බාබි ඉපදුණේ ජපානයේ. ඒ කියන්නේ පළවැනි බාබි ඩෝල්ව නිෂ්පාදනය කළේ ජපානයේ. 'ජපන් රටේ උපත ලබා ලංකාවට ආවා... මගෙ ලස්සන බෝනික්කා අම්මා ගෙන ආවා' කියලා අපිත් ඉස්සර බෝනික්කෝ නළවද්දී කියනවනේ. බලද්දී කතාව ඇත්ත. ජපානේ තමයි එයාලා උපත ලබන්නේ. ඉතින් මේ බාබි ඩෝල්ව 'Teen - age - Fashion Model' කෙනෙක් විදියටයි මුලින්ම වෙළඳපොළට හඳුන්වා දුන්නේ. මේ ලස්සන බෝනික්කිට කොච්චර ලොකු ඉල්ලුමක් නිර්මාණය වුණාද කියනවානම් පළමු වසරේදී පමණක් බෝනික්කන් 350,000ක් පමණ අලෙවි වුණා.

හැබැයි ඉතින් බාබිට පුංචි පුංචි කෙනෙහිලිකම් එහෙම සිද්ධවුණේ නැතුවමත් නෙවෙයි. ඇගේ පපු ප්‍රදේශයේ පෙනුමට එහෙම සමහර දෙමව්පියෝ මුලදී ඒ හැටි කැමති වුණේ නැතිලු. දරුවන්ට පුංචි වයසේදී ලිංගිකත්වය පිළිබඳ අනවශ්‍ය උත්තේජනයක් ඇතිවෙයි කියලා වෙන්න ඇති එහෙම අකමැති වුණේ. කොහොම නමුත් ඒ වගේ කාරණා හින්දා අවස්ථා තුනකදී විතර බාබිගේ පෙනුම වෙනස් කරන්න වුණා කියලයි Mattal සමාගම කියන්නෙ.

ඒ මොනවා වුණත්, 2006 අවුරුද්ද වෙද්දී ලෝකයේ රටවල් 150ක පමණ බාබි ඩෝල්ලා බිලියනයකට වැඩිය අලෙවි වෙලා තියනවා. සමාගම කියන විදියට නම් අදටත්, හැම තත්පරයකම ලෝකේ කොහේහරි තැනක බාබි ඩෝල්ලා තුන්දෙනෙක් අලෙවි වෙනවලු.

මේ සෙල්ලම් බෝනික්කි එක්ක සෙල්ලම් කරද්දී දරුවන්ට ලිංගිකත්වය පිළිබඳ හැඟීම් උත්තේජනය වෙන බවට චෝදනා ආවට, පස්සේ කාලෙකදී ඒක එහෙම නොවෙන බවට වෙළඳපොළ පරේයේෂණ මගින් තහවුරු වුණා. ඒ වෙනුවට කුඩා ගැහැනු දරුවන්ට ඔවුන්ගේ ස්වයං ප්‍රතිරූපය ගොඩනගාගන්න වගේම ආත්මවිශ්වාසය වැඩි දියුණු කරගන්නත් මේ බෝනික්කි යම්තාක් දුරකට උදව් වෙලා තියෙනවා කියලා අනාවරණය වුණා.

ඒ විතරක් නෙවෙයි දැන් බාබිට සහෝදර බෝනික්කෙකුත් ඉන්නවා. ඒ තමයි 'කෙන්'. Mattal සමාගම කෙන් කියන පිරිමි බෝනික්කා නිෂ්පාදනය කළේ පස්සේ කාලෙක. ඇත්තටම කෙන් කියන්නේ රුත් හෑන්ඩ්ලර් නෝනාගේ පුතාගෙ නම. මේ වෙනකොට විලාසිතා බෝනික්කන් විදියට විතරක් නෙවෙයි දොස්තර නෝනලා, ව්‍යාපාරික කාන්තාවන්, පොලිස් නිලධාරිනියන් ආදී විවිධ චරිත නිරූපණය කරන බාබි ඩෝල්ලත් වෙළඳපොළට ඇවිල්ලා ඉන්නවා.


ඉතින් බලන්නකෝ, ගැහැනියකගේ හිතට ආපු නිර්මාණාත්මක සිතුවිල්ලක් ගියපු දුර? සමහර වෙලාවට කාගෙන්හරි ප්‍රතික්ෂේප වෙන සිතුවිල්ලකින් වුණත් බිලියන ගණන් උපයන ලෝකප්‍රකට සන්නාම බිහිවෙන්න බැරිකමක් නෑ. ඒ නිසා තමන්ගේ හැකියාව සහ ආත්මවිශ්වාසය ප්‍රමාණවත් තරම් ඇති බව දැනෙනවා නම් ප්‍රතික්ෂේප වීම් සහ අකුල් හෙලීම් තුට්ටුවකටවත් මායිම් කරන්න ඕන නෑ කියන එකයි අපිට රුත්ගේ කතාවෙන් ඉගෙනගන්න තියෙන්නේ. තව දෙයක්... ඇමරිකාවේ නෝනලාට විතරක් නෙවෙයි අපේ නෝනලාටත් බිලියනපතිනියන් වෙන්න පුළුවන් බව කියන්නයි අපි මේ කතාව කිව්වේ.

■ සුරේෂ් විදානගමගේ

**බාබිට පුංචි පුංචි කෙනෙහිලිකම් එහෙම සිද්ධවුණේ නැතුවමත් නෙවෙයි. ඇගේ පපු ප්‍රදේශයේ පෙනුමට එහෙම සමහර දෙමව්පියෝ මුලදී ඒ හැටි කැමති වුණේ නැතිලු. දරුවන්ට පුංචි වයසේදී ලිංගිකත්වය පිළිබඳ අනවශ්‍ය උත්තේජනයක් ඇතිවෙයි කියලා වෙන්න ඇති එහෙම අකමැති වුණේ**



රුත් හැන්ඩ්ලර්




Mattal සමාගම පළමුවරට නිෂ්පාදනය කරණ ලද බාබි ඩෝල්


ජාවාරම්කරුවන්ට හසුනොවී
වැදගත් විදිහට වැඩ ටික කරගෙන
සතුටින්
රට යන්න
ඔබ රට රස්සාවකට යන්නෙ, ඔබේත් ඔබේ ආදරණීයයන්ගේත් සිහින ඉටු කරගෙන, ජීවිතේ සැපවත් කරගන්න. ඒ යන ගමන, වැදගත් විදිහට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා ගියොත් ඔබට පුළුවන් ඔබේ ආරක්ෂාව, රැකියාව පිළිබඳ හොඳ විශ්වාසයක් ඇතුව සතුටින් පිටව යන්න.
රට යනකොට කතා කරන්න 1989
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙන්න.
www.slbfe.lk
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# උදේ 6.30ට කෑගැහිල්ල නතර වෙද්දී දැනගත්තා මගෙ දරුවගේ හුස්ම නැවතිලා කියලා



මියගිය ලවන්ති

මිනිසුන් දේවාලවලට යන්නේ පිහිටක් බලාපොරොත්තුවෙන්ය. පිහිටක් පතන තැනිත් විපතක් වූ විට කියන්නේ වඩින්න ගිය දේවාලය ඉසේ කඩාවැටුණා වාගේ කියාය. කිරිබත්ගොඩ මාකොළ පදිංචිව සිටි 36 හැවිරිදි ලවන්ති ජයසූරියටද වූයේ නූපන් දරු තිදෙනෙකුත් සමඟ වඩින්න ගිය දේවාලයටම යටවී මැරෙන්නටය.

'මෙතැනට ගිය කෙනෙක් ආයේ පණාපිටින් ගෙදර යන්නේ නෑ'

මේ කියන දේවාලයට ඇතුළුවීමට පෙර ලවන්ති පැවසූයේ එවැන්නෙකි. වැඩිදුර නොසිතා එවැන්නක් කීවද රටම කම්පා කරමින් ඇත්තටම ලවන්ති ගෙදර ගියේ පෙට්ටියෙන්ය.

තුන්නිවුන් ගැබිනියක වූ ලවන්ති, දේවාලය නමින් මා අන්වර්ථ යෙදූ රාගම ශික්ෂණ රෝහලට ඇතුළුවූයේ පසුගිය 30 වැනිදය. ඒ ඇය පෞද්ගලිකව ප්‍රතිකාර ලබමින් සිටි රාගම රෝහලේ මහාචාර්යවරයෙකුගේ උපදෙස් මතය. යටිකයෙන් රුධිරය වහනය වීම හයමස් ගැබිනියක වූ ඇයට රෝහල්ගත වීමට තිබුණු හේතුවයි. රෝහලට ඇතුළු වී තෙදිනක් ගතවනතුරු සාමාන්‍ය රුධිර වහනයක් විනා කියන්නට තරම් ලොකු අමාරුකමක් ඇයට තිබුණේ නැත. මේ කියන සිදුවීම වුයේ ජූලි තුන්වැනිදය. එදින අලුයම 12.00ට පමණ වෙනදට වඩා ලවන්තියේ රුධිර වහනය වැඩිවන්නට විය. ඒ සමඟ අසාමාන්‍ය වේදනාවක්ද දැනෙන්නට වූයෙන් ලවන්ති ඒ බව රෝහලේ ඇගේ තනිනොතනියට හුන් ඇගේ මව ඩබ්ලිව්. ආරියවතීට දැනුම් දුන්නාය.

දියණියගේ වේදනාව ඇසූ වහාම ආරියවතී අම්මා රෑ මුරයේ සේවයේ යෙදී සිටි නර්ස් නෝනලාට ලවන්තිගේ අමාරුකම දැනුම් දුන්නේ වියපත්කම පසෙක දමා දිව ගොසින්ය.

"ඔය කාලෙට ඔහොම තමයි. ටිකක් ඉවසගෙන ඉන්න කියන්න."

පිහිට පැතූ නර්ස් නෝනලාගෙන් පිහිටක් නොවූ තැන ආරියවතී අම්මා නැවතත් ගියේ ලවන්ති ළඟටය.

"මගෙ අම්මේ.... මට ඉන්න බැහැ. මගේ කොන්දයි, යටිබඩයි රිදෙනවා. බඩෙන් මොකක්ද වැටෙන්න වගේ එනවා බුදුඅම්මේ..."

ඔරලෝසුවේ කටු කැරකෙද්දී ලවන්තිගේ වේදනාව වැඩි වූවා මිසක අඩුවූයේ නැත. ඒත් සමඟම ලවන්තිගේ සියුම් කෙඳිරිය වේදනාබරිත අඳෝනාවක් බවට පත්වූයේ වැඩි කාලයක් ගතවීමට පෙරාතුවය. රෝහලක ඉන්නා විට ලෙඩෙක් ගැන බියවිය යුතු නැතත් ලවන්තිගේ අම්මාට වූයේ කළ යුත්තේ කුමක්දැයි සිතාගත නොහැකිව අසරණවීමටයි.

"අනේ මිස් මගේ දරුවට හොඳටම ආමරුයි."

දෙවැනි වරටත්, තුන්වැනි වරටත් ලවන්තිගේ අම්මා නර්ස් නෝනලාට බැගෑපත් වූයේ නර්ස් නෝනලාට නැතත් දරු කැක්කුම නිසා ඒ අම්මාගේ පපුව පිච්චෙමින් තිබුණු නිසාය. මෙලොව බලවත්ම වේදනාව ප්‍රසූත වේදනාව යැයි කියනු ලැබේ. ලවන්තිට එවෙලේ ඒ වේදනාවටත් වඩා වේදනාවක් දැනුණා විය හැකිය. වේදනාව ඉවසිය නොහැකි තැන ඇය ඇඳුම් ඉරා විසි කළාය. රෝහලේ ඇඳක එල්ලී යටිගිරියෙන් හූ කිය කියා කෑගැසුවාය. ලවන්තිගේ අම්මා දුටුවේ මෙලොව කිසිම අම්මා කෙනෙකු නොදැකිය යුතු බිහිසුණු දසුන්ය. ඒ දසුන් ඉවසාගත නොහී ඈ නැවත නර්ස් නෝනා වෙත ගොස් කොන්ද නවා වැඳ දියණියට පිහිටක් වන ලෙස අඬ අඬා අයැද සිටියාය. සාමාන්‍ය මනුස්සයකුගේ හදවතක් තරම්වත් රෝගීන් වෙනුවෙන් සේවයට පොරොන්දු වී ඇති ඒ නර්ස් නෝනලාගේ හිත් උණු වී නැත.

පැය කිහිපයකට පසු මස් කුට්ටියක් සේ නොවැඩුණු දරුවෙකු ලවන්තිගේ යටිකයෙන් බිමට වැටුණාය. "අපොයි මේ මොකද වුණේ?" කොහේදෝ සිට පැමිණි මිඩ්වයිෆ් නෝනා කෙනෙක් ඔලුවට අත ගසාගන්නා ගමන් එහෙම කියා බෙරිහන්දෙමින් සිටි ලවන්තිව රෝද පුටුවක ඉන්දවූවාය. බිම වැටුණු ලේ පෙරෙන මස් වැදැල්ලද ලවන්තිගේ උකුලෙන් තබා ඇයව දැඩිසත්කාර ඒකකයට ඇතුළත් කළේ ඒ මිඩ්වයිෆ් නෝනාය. වාට්ටුවේ වූ නර්ස් නෝනලාගේ ඇස් ඇරෙන්නට වූයේ දැන්ය. ඒ අයගේ ඇස් ඇරෙනවිට කෝච්චිය ගොස් හමාරයි කියා ඇයට දැනුණු බව අපට කීවේ ලවන්තිගේ අම්මාය.

"පාන්දර 4 වෙනකල් මගේ දරුවා ලතෝනි තිබ්බා. මමත් එලොව මොලොව රත්වෙලා නර්ස්ලාට දොස්තරලාට වැඳ වැඳ එහාට මෙහාට දිව්වා. දුවට රාගම වාට්ටුවට යන්න කිව්ව ප්‍රොෆෙසර් වෝඩ් එකට දැම්මත් හරි දුව බලන්න එක දවසක්වත් ආවේ නැහැ. 6.30ට විතර දුවගේ කෑගැහිල්ල නතර වුණා. එතකොටත් මගේ දරුවගේ හුස්ම නැවතිලා කියලයි මට හිතුණේ. අන්න එවේලේ අර ප්‍රොෆෙසර් ආවා. වැදෑමහ සම්පූර්ණයෙන්ම එළියට ඇවිල්ලා නැහැ කියලා ICU එකෙන් තියටර් එකට ගත්තා. දුවට ටිකක් අමාරුයි කියලා ප්‍රොෆෙසර් මට ඇවිල්ලා කිව්වා. ආයේ ටික වෙලාවකින් ඇවිල්ලා දුවට දැන් හොඳයි කිව්වා. දුවගේ පණ ගිහින් කියලා මට දැනුණා. ඒ අය බොරුවට මගේ දුවට මැෂින් ගැහුවා. ඒත් මගේ හිත ඒක විශ්වාස කළේ නැහැ. සර්ට බුදුබව අත්වෙයි මගේ දරුවව බේරලා දෙන්න කියලා මම අත් දෙක එකතු කරලා ප්‍රොෆෙසර්ට වැන්දා. පස්සෙ දුවව බේරගන්න ලක්ෂ 5 ක බෙහෙතක් ඕනේ කිව්වා. අපි බෙහෙත් එක එවෙලෙම ගෙනැල්ලා දුන්නා. බෙහෙත ගෙනෙයි කියලා එයාලා හිතුවෙ නැහැ. පස්සේ ටික වෙලාවකින් ඇවිල්ලා දුව නැතිවුණා කිව්වා. දුවගේ බඩේ හිටපු දරුවන්ට මොනවා වුණාද දන්නෙ නැහැ. ඒ අය ඒ ගැන කිසිම දෙයක් අපිට කිව්වේ නැහැ. ඒ දරුවන්ගේ මිනීවත් අපිට දුන්නෙ නැහැ."

නූපන් දරුවන් තිදෙනෙකුගේත් උතුම් මාතෘත්වය බලාපොරොත්තුව සිටි මවකගේත් ඉරණම විසඳුනේ එසේය. එක් අතට ඒ ඉරණම් 'විසඳුනේ' කියා කර්මකාරකයෙන් කියන්නට නොහැක. ඒ ඉරණම් විසඳුවාය. මෙතැනට ගියොත් ආයෙත් එන්නේ පෙට්ටියෙන් කියා ලවන්තිට කියන්නට ඇත්තේ උක්ත රෝහල මසකට වරක් ජීවිත දෙක තුනක ඉරණම් විසඳන බව ප්‍රකට නිසා විය හැකිය. ලවන්තිගේ කතාව දුක්බරය. ඒ කතාව පිටුපස තවත් සංවේදී කතාවක්ය.



ලවන්ති මව සමඟ

"අපේ ගම හොරණ. දුව අධ්‍යාපනවේදී උපාධිය කරලා අවුරුදු 12ක් ගුරුවරියක් විදියට වැඩ කළා. නැතිවෙනකොට දුව උගන්වමින් හිටියේ මාකොළ පමුණුවිල මහා විද්‍යාලයේ. දුවගේ හස්බන්ඩ් අමිල ප්‍රභාත්. ඔහු පෞද්ගලික ආයතනයක කළමනාකාරවරයෙක්."

බහුතරයක් යුවතීන්ගේ ජීවිතයේ ලොකුම බලාපොරොත්තුව විවාහයෙන් පසු දරු පැටවකුගේ මුහුණ දැකීමයි. විවාහයෙන් පසු ලවන්තිගේත් එකම බලාපොරොතතුව වූයේ එයයි. දරු පෙමට තිබූ අසීමිත ආශාව නිසාමදෝ ලෙහෙසියකට ලවන්තිට දරු සම්පතක් දීමට දෛවය කාරුණික නොවීය. වසර හයක් තිස්සේ ලක්ෂ ගණනින් වියදම් කරමින් කළ සිංහල, ඉංග්‍රීසි ඔය හැම බේතක්ම ගඟට කැපූ ඉනි වෙද්දී නළදරු තාක්ෂණයෙන් දරුවෙකු බිහි කිරීමට ලවන්ති තීරණය කළාය. 2019දී මෙන්ම 2021දීත් ඉන්දියාවට ගොස් නළදරු තැන්පතු කළද ඒ එකක්වත් සාර්ථක නොවීය. නමුත් මීට මාස හයකට පෙර ලංකාවේ පෞද්ගලික රෝහලක කළ නළදරු තැන්පතුව සාර්ථක වූයේ ලවන්තිගේ හිසේ මල් තුනක්ම පූදන ගමන්ය.

"මගේ දරුවට දුවලා දෙන්නෙකුයි පුතෙකුයි ලැබෙන්න හිටියා. දෙවියෝ අවුරුදු දහයක බෝනස් එක්කම දීලා කියලා දුව ගොඩක් සතුටෙන් හිටියේ. මගේ දරුවා එක්ක හැමෝම හිතවත්. ගුරුවරියක් විදියට එයා පෞද්ගලික මුදලින් පාසල් දරුවන්ටත් සෑහෙන උදව් කළා. ගැබ් අරන් කියලා දැනගත්තහම ඒ හැමෝම දුවට තවත් ආදරේ වුණා."

තුන්නිවුන් දරුවන් පිළිසිඳගැනීම ලවන්තිට ගෙනාවේ ලොතරැයියක් ඇදුනාමවත් ගන්න බැරි සතුටක්ය. ඈ හදවතින්ම මව් පදවියට සූදනම් වන්නට විය. සතිපතා 'ධරණී' කියැවූ ලවන්ති දරුවන් ගැන, මාතෘත්වය ගැන අප පළකරන ලිපි අකුරක් නෑර කියැවූ බව ඇගේ මව කීවේ අපේ හිත් තව තවත් සංවේදී කරමින්ය. දරුවන්ට හොඳම අම්මා වීමට මෙන්ම ලංකාවේ හොඳම වෛද්‍යවරයාගේ උපදෙස් මත ප්‍රසූතිය කරගැනීමද ලවන්තිගේ අරමුණක් විය. හොඳම දෙස්තර සෙවීමට ඈ ෆේස්බුක්, යූටියුබ් පීරුවාය. දන්නා අයගෙන් විස්තර අසා සොයා බැලුවාය.

"මුලින්ම අපි පෞද්ගලික රෝහලක වෙනත් වෛද්‍යවරයෙක් ගාවට ගියා. දුවගේ බර ටිකක් වැඩියි. ඉතින් දරුවෝ ගැන බලනවට වඩා අම්මා ගැන බලනවා කියලයි ඒ වෛද්‍යවරයා කිව්වේ. දුව ඒකට බය වුණා. මම මැරිලා හරි මගේ දරුවෝ ඉපදෙන්න ඕනේ කියලා ඒ වෛද්‍යවරයාව මාරු කරලා තමයි මේ ප්‍රොෆෙසර් ගාවට ගියේ. පස්සේ දුවව දිගටම පෙන්නුවේ මේ කියන ප්‍රොෆෙසර්ට. ජූනි 30 උදේ දුවට රුධිර වහනය වුණාම අපි පෞද්ගලික රෝහලට ගිහින් ඔහුව මුණගැහුනා. රාගම රජයේ රෝහලේ ඔහුගේ වාට්ටුවට දුවව ඇතුළත් කරන්න කියලා ලියලා දුන්නේ එතැනදී."

දැන් සියල්ල සිදුවී හමාරය. නැති වූයේ අම්මා කෙනෙකු වීමට පෙරුම් පිරූ අම්මා කෙනෙක්ය. පාසල් දරුවන්ට සෙනෙහෙවන්ත වූ ගුරුමවක්ය. ලෝකයේ එළිය දැකීමට හුන් නූපන් දරු තිදෙනෙක්ය. වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව කියා ලවන්තිගේ දෙමාපියන්, සැමියා, හිතවතුන් සදතනිකව ඒ වේදනාව හිතේ රඳවාගනු ඇත. දිය යට ගිනි පුළිඟුවක් මෙන් ලවන්තිගේ කතාව හෙට කාටත් අමතක වනු ඇත.

"හෙට මගේ දුවගේ කතාව යටයයි. ඊටපස්සේ ආයේ ආයෙත් මේ වගේ දේවල් වෙයි. අනේ මේ ලෝකේ කිසිම කෙනෙක්ට මගේ දරුවට වගේ විඳවන්න දෙන්න එපා. අහිංසක මිනිස්සුන්ගේ සල්ලිවලින් ඉගෙනගෙන ඒ අයවම පෙළන්න එපා බුදුමහත්තයෝ."

ප.ලි. - ලවන්තිගේ මරණය සම්බන්ධයෙන් විමසීමට රාගම රෝහලේ අධ්‍යක්ෂවරයා සම්බන්ධ කරගැනීමට උත්සාහ දැරූවද එම උත්සාහය සාර්ථක නොවීය.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# හිත කොනිත්තන කවි

## ගිම්හාන සුළඟ



අහස සමුදුර අතින් අත ගෙන
හිනාවෙන තැන ආදරෙන්
නිම් වළල්ලෙන් මෙහා තනිවී
බලා ඉමි සංතාපයෙන්

මළානික හිරු පාට පාටින්
අහස සරසා රූපයෙන්
සිතිජ ඉවුරට හෙමින් ළංවෙයි
රන් වලාකුළු මාවතෙන්

වෙරළ ඉවුරේ කේතකී ගස්
රත්තරං පාටින් තෙමී
හමන සුළඟට අසුව වැළපේ
වෙරළ වෙතටම නැමී නැමී

ගලාගෙන එන අන්ධ අඳුරේ
තවත් රැයකට ඉඩ දිදී
බලාගෙන හුන් ඒ අතීතය
තවම මගෙ ළඟ ඉකිබිඳී

සිහිල් පවනේ වෙලී පැටලී
ආදරේ ගී මුමුණමින්
අපේ පියවර එකම තාලෙට
වෙරළ දිගටම රඳවමින්

ඇවිද ගිය මග පැමිණි දියරළ
සෝද සෝද ඔපලමින්
අපේ පියවර ලකුණු මැකුවා
වෙන්ව යන්නැයි තෙපලමින්

ඇඟිලි තුඩගින් වැල්ල මතුපිට
ඔබේ නම ලොකුවට ලියා
මගේ නම පුංචියට ලියලා
බලා උන්නෙමි ඒ දිහා

හෝ කියාගෙන තවත් රැල්ලක්
ඇවිත් වෙරළේ ඇවිදලා
අපේ නම් ගම් මකා දමමින්
අපට සරදම් කර ගියා

තරන


සියලුම මානසික රෝගවලට ලක්වූවන් සහ වැඩිහිටි පුද්ගලයන් සඳහා

වෛද්‍ය ප්‍රතිකාර - පහසුකම් සහිත නේවාසිකාගාර - මානසික වර්ධන ක්‍රියාකාරකම්

අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය - නො.59 ගලබඩයාවත්ත පාර, මතුගම

AMDCC

රජයේ ලි.ප. ආයතනය W.H.M 1696

අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය | විමසීම්: 0756046535 / 0715531404

IFSLS

දෙමාපියන්ට බරක් නොවී නිදහසේ උපාධියක් හැදෑරීමට ඔබටත් වරම්

saegis campus

2019/2020/2021 වසරේ උසස් පෙළ සමත්
ඔබට රජයේ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ
අයදුම් කළ හැකි උපාධි පාඨමාලාවන්,

ගෞරව උපාධි පාඨමාලාවන් (සිව් අවුරුදු)
- Bachelor of Business Management (Hons)
- BBM (Hons) in Marketing
- BBM (Hons) in Accounting and Finance
- BBM (Hons) in HRM
- BSc (Hons) in Computer Science
- BSc (Hons) in Software Engineering
- BSc (Hons) in Information Technology

අනෙකුත් උපාධි පාඨමාලාවන් (තුන් අවුරුදු)
- Bachelor of Information Technology (BIT)
- Bachelor of Business Administration (BBA)

අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගැනීම

ඔබ Saegis තෝරාගත යුත්තේ ඇයි?
- රජයේ අනුමත විශ්වවිද්‍යාලයකි.
- 25% ආචාර්යය උපාධි සහිත ආචාර්යය මණ්ඩලය.
- ආරක්ෂිත නේවාසිකාගාර පහසුකම්.
- අතිනවීන පහසුකම්.
- නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය.
- අමතර වියදම් සඳහා ශිෂ්‍යාධාර.
- නුගේගොඩ නගර මධ්‍යයේ පිහිටි විශ්වවිද්‍යාලයකි.
- රැකියා පුහුණු අවස්ථාවන්.
- පාදක පාඨමාලාව නොමිලේ (Bridging Programme).

ඇතුලත් වීමේ අවම සුදුසුකම්
අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් උපරිම අවස්ථා තුනකට යටත්ව එක් අවස්ථාවකදී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් (S) හා සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30ක් ලබා තිබිය යුතුයි.
*කොන්දේසි අදාලවේ

මෙම QR එක SCAN කිරීමෙන් ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ අයදුම් පත්‍ර පිරවීමේ පහසුකම් සලසා දී ඇත.




077 043 0000

අධ්‍යයන කාලය තුල කිසිදු අයකිරීමක් නොමැත

Saegis Campus,
නො: 135, S. De. S. ජයසිංහ මාවත, නුගේගොඩ, ශ්‍රී ලංකාව.
info@saegis.ac.lk www.saegis.ac.lk

# යකුන් පෙරේතයින් ඇවිත් බව දන්නවානම් ඇයි දැන දැනම දොළපිදේනි දෙන්නේ?

ලෝකෙ ඉන්න බිලියන අටක් මිනිස්සුන්ගෙන් එකම එක්කෙනෙක් ඔයාගේ හිත රිද්දුවම ඔයා මොකද කරන්නේ? ඔලුවේ ඉඳන් පොරොවාගෙන, කන්නේ බොන්නේ නැතිව, හොටු පෙර පෙර, ගෙදර මිනිස්සුන්ටත් ගස්සලා පුප්පලා ගේ කුමාරි වගේ ගෙට වෙලා ඉන්නවා නේද?

හැබැයි දන්නවද චූටි මැණිකේ, ඔය ඉංග්‍රීසි කතා කරන රටවල සහ යුරෝපා රටවල්වල ගෑනු ළමයින්ට ප්‍රශ්නයක් ආවම එයාලා එහෙම කරන්නේ නෑ. විසඳගන්න අමාරු විදියේ සංකීර්ණ ප්‍රශ්නයක් ආවම එයාලා හුරුපුරුදු ජීවිතෙන් පොඩි break එකක් ගන්නවා. ඊටපස්සේ ඇඳුම් කෑලි දෙක තුනක් බෑග් එකක දාගෙන දවස් දෙක තුනකට කොහේහරි අතුරුදන් වෙනවා. ඒ කියන්නේ මේ අපේ රටේ වගේ ප්‍රවෘත්ති මවන අතුරුදන්වීම් නෙවෙයි. ගොඩක් වෙලාවට එයාලා තනියම ඇවිදින්න යනවා. අපි ඔය solo travel කරනවා කියන්නේ. එහෙම ගියා කියලා එයාලගේ ගෙවල්වල අය පොලිසි ගානේ ගිහින් පැමිණිලි පොත් පුරවන්නේ නෑ. මොකද ඒ රටවල වැඩිහිටි උදවියට ගෑනු ළමයෙක් තනියම ඇවිදින්න යනවා කියන මැජික් එකක් නෙවෙයි.

අනිත් එක එහෙම ප්‍රශ්නයක් වෙලාවට එයාලා තමන්ගේ පවුලෙන්, යාළුවන්ගෙන්, සමාජ මාධ්‍යවලින් disconnect වෙලා ටිකක් නිදහසේ ඉන්න ගියාම ඒ නිදහසට ගරු කරන්න ඒ රටවල මිනිස්සු දන්නවා.

ඉතින් ඒක නෙවෙයිනේ කතාව... එහෙම අතුරුදන් වෙන ගෑනු ළමයි යන තැනක ගිහින් කඳුළු හල හලා මූඩ් ගහල ඉන්නේ නෑ. එයාල ප්ලෑන් එකක් ගහනවා. නිකන්ම නිකන් ප්ලෑන් එකක් නෙවෙයි. මාස්ටර් ප්ලෑන් එකක්.



ඒ කියන්නේ එයාට වැරදුනේ කොහෙද කියලා හරියට analyse කරලා බලනවා. ඒ වැරැද්ද ආපහු නොවෙන්න නම් කොහොමද වෙනස් වෙන්න ඕන කියලා මුල ඉඳලා අගට, අග ඉඳලා මුලට හිතනවා. ජීවිතෙන් හලලා දන්න ඕන මිනිස්සු කවුද, තියාගන්න ඕන මිනිස්සු කවුද කියලා හරියටම තීරණය කරනවා.

සමහර වෙලාවට හලලා දන්න වෙන්නේ ඒ තාක් ජීවිතේ වැඩිම වටිනාකම දීපු කෙනාව වෙන්න පුළුවන්. නැත්නම් ළඟින්ම ආශ්‍රය කරපු යාළුවෙක් හෝ යාළුවෝ පිරිසක් වෙන්න පුළුවන්. එහෙම තීරණ ගනිද්දී ලේසි නෑ තමයි. හැබැයි ඒ ගෑනු ළමයි අර break එක අතරේ ඒ අමාරුම තීරණය අරගෙන එයාගේ ජීවිතේ අමාරු කරපු අයව හලලා දානවා. එහෙම කරන්නේ අඬලා දෙඩලා වැළපිලා දෙස් දෙවොල් තියලා නෙවෙයි. බොහොම ශක්තිමත් විදියට ඒ තීරණ ගන්නවා. ආයෙ කිසිම කෙනෙකුට හරවන්න බැරි විදියට.

ඒ අතරතුරේ එයාලා තමන්ගේ හිතටත් ලොක් එකක් දාගන්නවා. ඒ ආපහු යක්කුන්ට ප්‍රේතයන්ට රිංගන්න බැරි විදියට. ඊටපස්සේ එයාගේ හිත හරියට පින්බිමක් වගේ. දෙවි දේවතාවන්ට මිසක කොහොමත් පිශාචයින්ට පුණ්‍ය භූමිවලට ඇතුල් වෙන්න බෑ.

මේ සේරම කරන අතරේ එයා හොඳට කාලා, බීලා, පොඩි ව්‍යායාම ටිකක් කරලා, ෆිල්ම් එකක් බලලා, සිංදුවක් අහලා, තනියම පොඩි ඩාන්ස් එකක් දාලා එයාගේ space එක හදාගන්නවා. ඔය ඔක්කොම කරද්දී එයාට දැනෙන්න ගන්නවා, හරි මම දැන් ආපහු ට්‍රැක් එකට ඇවිල්ලා ඉන්නේ කියලා.

ඔන්න ඊටපස්සේ එයා අර ගෙනාපු අඩුම කුඩුම ටිකත් පැක් කරගෙන ආපහු යනවා. හැබැයි ඒ යන්නේ අර කලින් ආපු කෙල්ල නෙවෙයි. ඊට වඩා පරිණත කෙනෙක්. ඊටපස්සේ අර යක්කු පෙරේතයෝ කොච්චර දොළපිදේනි ඉල්ලගෙන පස්සෙන් ආවත් එයා නෙවෙයි ආතුර වෙන්නේ.

මං අහන්නේ ඇයි ඔයාට එහෙම වෙන්න බැරි? යක්කු පෙරේතයෝ තමන්ගේ ජීවිතේට අරක් ගෙන ඉන්න බව දන්නවා නම්, ඒ බව දැනෙනවා නම් ඇයි දැන දැනම දොළපිදේනි දෙන්න යන්නේ? ඇයි එහෙම දිදී ආතුර වෙන්නේ?

යුරෝපෙ ගෑනු ළමයින්ට වගේ මෙහේ එහෙම තනියම ඇවිදින්න බෑ කියලා ඔයා කියයි. ඒක ඔයා ඔලුවෙන් හදාගත්ත බාධකයක් විතරයි. හරි එහෙම බෑමයි කියමුකෝ. ඒත් තනියම පොඩි පේස්ට්‍රි ෂොප් එකකට ගිහින් උණු උණු රෝල් එකක් කන ගමන් නෙස්කැෆේ එකක් බීලා හිතන්න බැරිද? නැත්නම් කොෆී ෂොප් එකකට ගිහින් කැපුචිනෝ කෝප්පයක් බොන ගමන් ටිකක් තනියම කල්පනා කරන්න බැරිද? එකම තැන පල්වේවී, එකම ප්‍රශ්නේ ගැන ආයෙ ආයෙ හිත හිතා මොන අපරාධයක් ද ඔයා මේ කරන්නේ?

යන්න... දැන්මම යන්න. ගිහින් ටිකක් තනියම වෙලාව අරගෙන කල්පනා කරන්න. කවුරුවත් වෙනුවෙන් නෙවෙයි. ඔයා වෙනුවෙන්. ඔයාගෙ ජීවිතේ වෙනුවෙන්. දන්නවාද මැණිකේ මේ ගෙවෙන එක මොහොතක්වත් ආපහු එන්නේ නෑ. අනිත් එක තමයි ඔය වටේ එල්ලගෙන ඉන්න සිප්පි කටු හලලා දානකන් ඔයාගෙ ජීවිතේට කිසි එළියක් නෑ. ඒ නිසා දැන් විඳෙව්වා ඇති. ඔයා වෙනුවෙන් තීරණයක් ගන්න. ශක්තිමත් ගැහැනියක් විදියට නැගිටින්න. ඔයාගෙ ජීවිත කතාව ඔයාම ලියන්න. අද අලුත් දවසක්. ඒ දවස ජීවිතේ වෙනස් කරන දවස බවට පත්කරගන්න.

අපූර්වා




**ප්‍රශ්නය**

මංගල යෝජනා එනවා හිටු කියලා
එනමුත් හිත ඇත්තෙ ඔබ මත්තෙම නැහිලා
එච්. එස්. ප්‍රේමසිරි
ඇඹිලිපිටිය

**පිළිතුර**

දැන්නම් මගෙත් කෙස්ගස් එක දෙක පැහිලා
එහෙනම් කල් නොදා යමු හඳපානක පැනලා

**ප්‍රශ්නය**

බෙලිකටු මල්ල හොලවනවා වගෙ සද්ද
අම්මගෙ කට වහන්නට ක්‍රමයක් නැද්ද
අමල් විජේකෝන් - පඹුරණ, මාතර

**පිළිතුර**

අම්මගෙ කට වහන ජගතෙක් මෙලොව නැතේ
එනිසා බැරිම නම් ඇබ ගහගනින් පුතේ

**ප්‍රශ්නය**

ගේ දෙර බඩුමුට්ටු සූදුවටම වික්ක
පෙර බිරිඳටත් ගහලා පැනලලු හක්ක
තුරුළෙම තියන් අම්මලා සෙනෙහෙන් රැක්ක
කොමලියෙ උඹත් ඇයිදෝ ගියෙ ඌ එක්ක
නුවන්ති හංසිනී උත්පලා
සඳලංකාව


**පිළිතුර**

පෙර බිරිඳදෝ කිව්වේ කේලම ගොතලා
මගෙ මිනිහගේ නැත මා ඔය දෙස් දැකලා
ඒ වැනි රන් කඳක් නැති සෝකෙන් තැවිලා
එකියක් පත්තරේටත් කවියක් ලියලා


**ඔබේ කවි අභියෝග**

කොමලිගේ කොලමට එවීමේදී 0712808985
හෝ dharanee.editor@liberty.lk යන
ඊමේල් ලිපිනයට යොමු කරන්න.
නැතිනම්,
කොමලිගෙ කොලම, ධරණී පුවත්පත,
නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන
ලිපිනයට එවන්න

කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී පද පේළි 4කින් යුත් **එක් කවියක් පමණක්** යොමු කිරීමට කාරුණික වන්න.



# කොච්චි මිනිහගෙ මලයාලි ගුරුකමෙන් මගේ ලෙඩ කම්මුතු වුණා



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

හිස මත පොල් ගෙඩියක් තබා බිඳ එහි වතුර හිස මතට වැටෙන්නට සැලැස්වීමෙන් හිසරදය ඇතුළු බොහෝ කායික වේදනා දුරුකරන විස්මිත ශාන්තිකර්මයක් පිළිබඳව මට දැනගන්නට ලැබුණේ ආඬිඅම්බලම පීල්ලවත්තේ කේ.එන්.ද සිල්වා මහත්මියගෙනි. ඒ වනවිට හැත්තෑඅට වන වියේ පසුවූ සිල්වා මහත්මිය පවසා සිටියේ තමන් ද යොවුන් වියේදී ඒ ශාන්තිකර්මයේ සත්‍යතාව අත්දැක ඇති බවයි. එමෙන්ම එය 'මලයාලී ගුරුකමක්' බවද ඇය පැවසුවාය.

**"අපි පුංචි කාලේ මේ පැත්තේ වැඩිපුරම තිබුණේ පොල්වතු. ඒවායේ රා මැදීමත් බොහොම සරුවට කෙරුණා. රා මදින්න වැඩිපුරම ඇවිත් හිටියේ කේරලයෙන් ආපු මලයාලි මිනිස්සු. ඒ අයට අපේ ගම්වල කිව්වේ 'කොච්චි මිනිස්සු' කියලා. ඒ මිනිස්සු ළඟ තමයි ඔය ගුරුකම තිබුණේ. හැබැයි කිසිම හොරයක් බොරුවක් නෑ. ඒ ගුරුකම කරපු හැටියේ තත්පරෙන් හිසරදේ සනීප වෙනවා. මම මේ කියන්නේ මගෙ අත්දැකීමෙන්."**

වැලිසර ඇලෙහිවත්තේ කොටුවේ වෙළඳසැලක් පවත්වා ගෙන යන එම්.ඩී.ජොසපින් මහත්මිය ද පවසා සිටියේද තමන් කුඩා කාලයේත් එම ප්‍රදේශයේ ඉන්දියාවෙන් පැමිණි කොච්චි මිනිසුන් ඕනෑතරම් සිටි බවකි. ඔවුන් ඒ ප්‍රදේශයේ තිබූ පිරිසිදු දියකඩිතිවලින් වතුර බොමින් සරල සැහැල්ලු ජීවිත ගත කළ බවද ජොසපින් මහත්මිය කීවාය.

**"ඔය රා මදින්න ආපු මලයාලි කොච්චි මිනිස්සු බොහොම අහිංසකයි. මේ ගම්වල කවුරුහරි කිව්වොත් ඔය වගේ සුළු මන්තර ගුරුකම් කරන්නත් ඒ මිනිස්සු පසුබට වුණේ නෑ. මට මතක හැටියට ඒවට සල්ලි ගත්තෙත් නෑ. ඔය රා මදින්න වගේම අලි බලන්නත් ඉස්සර මෙහාට ආවේ මලයාලි මිනිස්සු. අද මීගමුව කිට්ටුව තියෙන කොච්චිකඩේ ඔය රා මදින මිනිස්සු වැඩිපුර හිටපු ගමක්. ඒ වගේම මේ කිට්ටුව තියෙන කටුනායක කුරණ අලි බලන්න ආපු මලයාලි මිනිස්සු වැඩිපුර හිටපු ගමක් කියලත් කියනවා. ඇතාට කුරුණෑ කියලත් කියන හින්ද ඒ ගම කුරණ වුණා කියලයි මෙහේ පරණ මිනිස්සු කිව්වේ. ඇයි ඇතුගල්පුර කියන එකටත් කියන්නේ කුරුණෑගල කියලනේ."** සිල්වා මහත්මිය එසේ පවසත්ම මලයාලි ජාතික රා මදින්නවුන්ගේ ඒ වේදනානාශක ශාන්තිකර්මය සිදුවන ආකාරය ගැන මම අසා සිටියෙමි.

**"මට මතක හැටියට ඒ කාලේ අපේ පවුල්වල කෙනෙකුට ඔය වගේ වේදනාවක්, කැක්කුමක් හැදුනම ඒ කොච්චි මනුස්සයෙකුට කියනවා. එතකොට ඒ මනුස්සයා ලෙලි ගහපු ලොකු කලටි පොල් ගෙඩියකුත් උඩ දම දමා අපේ ගෙවල්වලට එනවා. ඊළඟට ඒ වේදනාවෙන්, කැක්කුමින් පෙළෙන කෙනාගේ නළලෙන් තියනවා."**

ඇය මුහුණ දී ඇති අත්දැකීමට අනුව නම් කොච්චි මිනිසා ඔහුගේ අතේ තිබූ පොල්ගෙඩිය නළල මතින් තබත්ම අධිශීතකරණයකින් ගත් දෙයකින් දැනුණු ශීතලයක් වැනි සිසිලසක් දැනෙන්නට පටන්ගෙන ඇත. ඉන්පසු ඔහු එම පොල් ගෙඩිය හිස තබා මල් කපන කැත්තෙන් ඊට පහර දුන් පසු තම ශරීරයම පොල්වතුරෙන් නැහැවී ගිය බවද සිල්වා මහත්මිය කීවාය. "හැබැයි මගේ ඔලුව උඩින් තිබ්බා කිව්වට ඒ පොල් ගෙඩිය ඒ මනුස්සයාගේ අත උඩ තමයි තිබුණේ. මොකද මට ඒ පොල්ගෙඩියේ බර පොඩ්ඩක්වත් දැනුණේ නෑ. මොනවා වුණත් ඒ දක්වා මගේ තිබුණු තද හිසරදේ ඒ මොහොතෙම නැතිවුණා" යනුවෙන්ද ඇය කීවාය.

අදටත් බොහෝ ගම්වල පමණක් නොව නාගරික ප්‍රදේශවලත් රෝග සුවකරගැනීමට මෙවැනි ගුරුකම් පසුපස යන පිරිස් ඕනෑතරම් ඇත. එවැනි ශාන්තිකර්මවලින් රෝග සුව වූ බව කියන සාක්ෂිකරුවන්ද එමටය. නමුත් මෙවැනි දේ සම්බන්ධව කාලයක් තිස්සේ ගවේෂණය කළ පුද්ගලයෙකු වශයෙන් මගේ මතය නම් මෙයයි.

මේ කියන මලයාලම් ගුරුකම මගින් සිදුවී ඇත්තේ සංකේතාත්මක නොවිධිමත් මනෝ චිකිත්සාවකි. සිල්වා මහත්මියගේ හිසරදය තමන් අතේ ඇති කලටි පොල් ගෙඩියට සංකේතනය කළ රා මදින්නා ඊට යම් මැතිරීමක් කොට එය නළලතට ස්පර්ශ කළ විට ඇයට දැඩි ශීතලයක් දැනුනේ ව්‍යංගය (Suggestion) නම් වන මානසික සාධකය නිසා මිස සත්‍ය වශයෙන් එහි තිබූ ශීතලයක් නිසා නොවේ. එමෙන්ම ඉන්පසු එම පොල්ගෙඩිය ඇගේ හිසට ඉහළින් අල්ලා එය දෙපලු කොට පොල්වතුර හිස මතට හැලීමට සැලැස්වීමද ඉතා පැහැදිලි මනෝ චිකිත්සාවකි.

අප කවුරුත් දන්නා අන්දමට ශරීරයේ හටගන්නා සියලු වේදනා දවසේ පැය විසිහතර මුළුල්ලේ ඒකාකාරවම පවතින්නේ නැත. ඒවා වරින් වර ඉස්මතු වන අතර තවත් විටෙක මුළුමනින්ම යටපත් වෙයි. මෙම හිසරදයන්ද බොහෝවිට එහෙමය. එවන් අවස්ථාවක කවර හෝ ක්‍රමයක් මගින් තීව්‍ර මානසික බලපෑමක් එල්ල කිරීමෙන් එම වේදනාව තාවකාලිකව යටපත් කිරීමේ අවකාශයක් පවතී.

නමුත් මෙහි ඇති භයානකකම එය නොවේ. එලෙස වරින් වර ඉස්මතු වන තීව්‍ර හිසරදය මොළයේ කිසියම් බරපතළ කායික රෝගයක ලක්ෂණයක් වීමේ සම්භාවිතාවක් තිබීමය. එවන් අවස්ථාවක හුදෙක් ව්‍යංගය නම් වන මානසික සාධකය මුල්කොට හිසරදය යටපත් කිරීමෙන් සිදුවන්නේ කුමක්ද? කිසිඳු වේදනාවකින් තොරව එම රෝගය කෙමෙන් වර්ධනය වී අවසානයේ මාරාන්තික තත්ත්වයක් වුව එළැඹිය හැකි වීමය.


එනිසා නොවිධිමත් මනෝ චිකිත්සාවන්වලින් තාවකාලිකව රෝග සුවපත් කරගැනීමට යාමේදී මීට වඩා ඔබ බුද්ධිමත්ව කටයුතු කරන්නේනම් හොඳය. එසේ නොවුණහොත් ගුරුකම් කරන්නවුන් ගොඩ ගිහින් ඔබට අඩි හයක් යටට යාමට වුව බැරිකමක් නැත.





අප ගන්නා තීරණවලට වගකිව යුත්තේ අපමය. ඇතැම් විට තීරණ ක්‍රියාත්මක වීමේදී ඒවායේ පල ලැබෙන්නේ අපට පමණක් නොවේ. ඇතැම් තීරණ ක්‍රියාත්මක වූ පසු අප එහි පලයෙන් ඈතට පලායන අවස්ථාද ඇත. ඒ, බොහෝවිට අප විසින් නොගත යුතුව තිබූ තීන්දු හේතුවෙනි. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට ප්‍රථම 1941දී ජෝර්ජ් පෝප් නම් වතු අධිකාරිවරයා ඝාතනයට ලක්වූයේ යමෙකු හෝ යම් පිරිසක් නොගත යුතුව තිබූ තීරණයක් හේතුවෙනි. 'THE POPE MURDER CASE' ලෙස එකල එය ප්‍රචලිත විය. ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අද අදහස් දක්වන්නේ ඒ පිළිබඳවයි. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රී (Hubert Humphrey) ශිෂ්‍යත්වයක් ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදාගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. රටේ සුප්‍රසිද්ධ නඩු කටයුතු ආශ්‍රිතව ඔහු ලබාදෙන අදහස්ද බෙහෙවින් වැදගත් වේ. මෙම ලිපියද ඔහුගේ වටිනා දැනුම් සම්භාරය ඇසුරෙන් ලියුවකි.

22 කොටස



# ඇසදුටු සාක්ෂිකරුවන් නැති නිසා පෝප්ගේ මරණයට සාක්ෂි දෙන්න 'ලේන්සුවක්' ඉදිරිපත් වුණා

### රාත්‍රී භෝජන සංග්‍රහයක්

ජෝර්ජ් පෝප් පුස්සැල්ලාව 'Stellenberg' තේ වත්තේ සිටි වතු අධිකාරිවරයෙකි. ඔහු තනිකඩ දිවියක් ගත කළේය. යාබද වත්තක මිතුරකුගෙන් පෝප්ට 1941 මැයි මාසයේ දිනක ආරාධනයක් ලැබිණ. ඒ රාත්‍රී භෝජන සංග්‍රහයකටයි. ඒ අනුව සවස හය පසු වෙද්දී හෙතෙම වත්තේ බංගලාවෙන් පිටත්ව ගියේය. රාත්‍රී භෝජන සංග්‍රහය ඉහළ මට්ටමින් පැවතිණ. එය හමාර කර එතැනින් පෝප් පිටවෙද්දී රාත්‍රී එකොළහ පමණ විය. සිය මෝටර් රථය පදවාගෙන පැමිණි පෝප් අක්කර ගණනාවක වත්තට ළඟා විය. ඊට අයත් කර්මාන්තශාලාව ඇත්තේ වත්ත ඇරඹෙන  ස්ථානයේමය. මුරකුටියද ඒ අසල තිබේ. මුරකරු වූ කාසිම් ගේට්ටුව අරිමින් සිය හාම්පුතාට යාමේ පහසුකම් සැලසීය. බංගලාව ඇත්තේ කඳු මුදුනෙහිය. මුර කුටිය අසල සිට එතැනට සැතපුමක් පමණ දුර තිබේ. පෝප් සුපුරුදු වේගයෙන් කන්ද ඉහළට දිවෙන වංගු සහිත මාර්ගයේ ඉදිරියට රිය ධාවනය කළේය. හාම්පුතා ගේට්ටුවෙන් ඇතුළු වී ගමන අරඹනවාත් සමඟම කාසිම් දුරකතන ඇමතුමක් දී බංගලාවේ කෝකියා වන සෙබස්තියන්ට ඒ ගැන දැනුම් දුන්නේය. සෙබස්තියන් සිය ස්වාමියා පැමිණෙන තෙක් බලා සිටියේය. එහෙත් නියමිත වේලාව ඉක්මවා ගියද ඔහුගේ පැමිණීමක් නැත.

### ගමනට බාධා

පෝප් බංගලාව වෙතට පැමිණෙමින් සිටියදී ඊට බාධා මතුවිය. ඒ මාර්ගය හරහා දමා තිබූ ගස් කොටන් හේතුවෙනි. ඒවා තිබියදී ඉදිරියට යා නොහැක. එබැවින් පෝප් වාහනයෙන් බැස්සේය. ඔහු මාර්ග බාධක ඉවත් කිරීමට සූදානම් වූවා පමණි. එකවරම කණ්ඩායමක් පොලු ආදියද සමඟ එතැනට ආවේය. ඔවුන්ගෙන් පෝප්ට අනපේක්ෂිත ප්‍රහාරයකි. ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට හෝ පැන යාමට පෝප්ට කාලයක් නොවීය. හෙතෙම එම ස්ථානයේම ඇද වැටුණේය.

### සෙබස්තියන් පෝප් සොයා පැමිණෙයි

සෙබස්තියන් පෝප් සොයා පාර දිගේ පහළට ආවේය. අතරමග වාහනය නවතා ඇත. ඒ අසල පෝප් තුවාල සහිතව වැටී සිටියේය. වහාම ඒ වෙත ගිය සෙබස්තියන්ට පෙනී ගියේ සිය ස්වාමියා තවමත් ජීවතුන් අතර බවයි. එහෙත් තනිව ඔහු බංගලාවට රැගෙන යාමට සෙබස්තියන්ට නොහැකිය. එනිසා ඔහු බංගලාවේ සිටි තවත් සේවකයින් කැඳවාගෙන ආවේය. එහෙත් ඔවුන්ටද වතු අධිකාරිවරයා රැගෙන යා නොහැකි විය. අවසන තුවාලකරු බංගලාවට රැගෙන ගියේ පුටුවක තබාගෙනයි. පසුව වෛද්‍යවරයකුට දුරකතන ඇමතුමකින් තුවාලකරු පිළිබඳ දැනුම් දීමට බංගලාවේ සේවකයෝ පියවර ගත්හ. එහෙත් වෙදැදුරුගේ පැමිණීම ප්‍රමාද විය. යාබද වත්තක සිටින පෝප්ගේ මිතුරකුද සිදුවීම දැනගත් වහාම එහි පැමිණියේය. රෝගියා රෝහලට රැගෙන යාමට කිසිවකු උත්සාහ කළේද නැත. පාන්දර එකට එකහමාරට පමණ පෝප් බංගලාවේදීම අවසන් හුස්ම හෙළීය.

### තුවාල විසිඅටක්

දේහය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වුණේ පසුදා උදේය. පෝප්ගේ සිරුරේ තුවාල 28කි. ඉන් 17ක්ම දක්නට ලැබී ඇත්තේ හිස සහ මුහුණ ආශ්‍රිතවය. තුවාල මාරාන්තික ඒවාය. ඒ අනුව වෛද්‍ය ප්‍රතිකාර ලැබුණද ඔහු මියයන බව මරණ පරීක්ෂකගේ නිගමනය විය. තුවාලකරු බිම වැටී සිටිනවා සෙබස්තියන් දුටුවා මිස සිදුවූයේ කුමක්ද යන්න ඔහු දුටුවේ නැත. ඇසු දුටු සාක්ෂි කිසිවක් නොතිබිණ.

### හේතුව හෙළිවෙයි

ජෝර්ජ් පෝප්ගේ මරණය පිළිබඳ විමර්ශන ඇරඹුණේ ඇසු දුටු සාක්ෂි කිසිවක් නොමැතිවය. මාස කිහිපයකට පෙර සිට මියගිය වතු අධිකාරිවරයා වතු සේවකයින්ගේ වෘත්තීය සමිති සමඟ යම් ආරවුලක සිටීම සැකයක් මතු කළේය. 'Old Ceylon State Workers Union' නම් සමිතියේ අතු ශාඛාවක් Stellenberg වත්තේ පිහිටුවා තිබිණ. එහි ලේකම් මෙයියප්පන් නමැත්තෙකි. යම් හේතුවක් මත වීරසාමි නැමැත්තකු සේවයෙන් පහ කිරීමට පෝප් පියවර ගෙන තිබුණි. ඊට එරෙහිව වෘත්තීය සමිති මව් ශාඛාවට පැමිණිලි කෙරුණු අතර වීරසාමි යළි සේවයේ පිහිටුවීමට පෝප්ට සිදුවිය. මේ සියල්ල පසුපස මෙයියප්පන් සිටින බව පෝප් දැන සිටියේය. හෙතෙම මෙයියප්පන් වද සේවයෙන් පහ කළේය. ඊට එරෙහිවද මෙයියප්පන් ක්‍රියාමාර්ග ගත්තේය. ඒ අනුව ඔහුවද සේවයේ පිහිටුවීමට පෝප්ට සිදුවිය. තවද මෙයියප්පන්ට විරුද්ධව පෝප් නඩුවක්ද පවරා තිබිණ. මෙවැනි හේතු මත දෙපාර්ශ්වය අතර පැවතියේ මතභේදාත්මක තත්ත්වකි.

### දෙදෙනෙකු අතුරුදන් - තවත් ඉඟියක්

ජෝර්ජ් පෝප්ගේ මරණය සමඟ වත්තේ වැඩ කරන සේවකයෝ දෙදෙනෙක් අතුරුදන් වූහ. ඒ වීරසාමි සහ වෙලායිතන් නමැති තැනැත්තන්ය. මේ අතර තවත් තොරතුරක් ලැබුණේ බංගලාවේ කෝකියා වන සෙබස්තියන්ගේ පුතා පිලිප්ගෙනි. ඔහුට රසට ඉවුම් පිහුම් කළ හැකිය. පෝප් වැඩියෙන් කැමති වූයේ පිලිප් පිසින අහර අනුභවයටයි. පෝප් ඝාතනයට ලක්වූද පිලිප් බංගලාවට ගියේ නැත. ඔහු සවස 6.30ට පමණ ලැයින් කාමරයට වී ග්‍රැමෆෝනයේ ගීයක් රස විඳිමින් සිටියේය. එතැනට ඉයන් පෙරුමාල් නම් පුද්ගලයා පැමිණියේය.

"සින්දු දගෙන ඉන්නෙ, උඹ අද යන්නැද්ද මහත්තයට කෑම උයන්න?"

"නෑ, මහත්තයා අද රෑ කෑමට එළියට ගියා."

"මහත්තයා කීයටද එන්නෙ?"

"මං දන්නෑ."

ඒ ඉයන් සහ පිලිප් අතර සංවාදයයි. එය අහම්බයක් විය හැක. එහෙත් පෝප් ඝාතනය ඉන් පසු සැලසුම් කළ බවට සැක මතුවිය.

### වීරසාමි සමඟ අමුත්තෙක් සහ කල්ලි ගැසීම

සිද්ධිය වූ ද වීරසාමි තවත් අමුත්තකු සමඟ ලැයින් කාමරයට යන අයුරු මුරකරු කාසිම් දුටුවේය. ඔවුන් රාත්‍රී 8ට පමණ පිටතට පැමිණ ඇත. එමෙන්ම රසකැවිලි වෙළඳමේ ගොස් පැමිණෙමින් සිටි අයකු පොලු ආදිය රැගෙන කල්ලි ගැසී සිටි හයදෙනෙකු දැක තිබේ. එදින පසළොස්වක පොහොයට පෙරදයි. සඳඑළිය හොඳට තිබෙන්නට ඇත. එනිසා පිරිස අතර සිටි වීරසාමි, වෙලායිතන්, ඉයන් සහ රෙංගසාමි යන අයව ඔහු හඳුනාගත්තේය. එවිට වේලාව රාත්‍රී 9.30 පමණ විය. තවත් කිහිපදෙනෙකු මේ අය දැක තිබේ.

### ලේන්සුවක් සාක්ෂි දීලා

පෝප් මියගියද රැයේ සෙබස්තියන් සිදුවීම වූ ස්ථානයේ තිබී වටිනා යමක් සොයා ගත්තේය. ඔහුට ලේන්සු දෙකක් හමුවිය. ඉන් එකක යතුරක් ගැට ගසා තිබිණ. පසුදාම ඔහු ඒවා පොලිසියට බාර දුන්නේය. ඒ වනවිට සිදුවීම සම්බන්ධයෙන් කිසිවකු අත්අඩංගුවට ගෙන නොතිබිණ. ඒ අනුව යතුර සහිත ලේන්සුව වැදගත් සාධකයකි. එම යතුර වත්තේ සියලු ලැයින් කාමරවල දොරවල් හා සසඳ බැලිණ. ඉන් විවෘත කිරීමට හැකි වූයේ වීරසාමිගේ කාමරය පමණි. ඒ වනවිටද වීරසාමි අතුරුදන්ය. අපරාධ ස්ථානය පරීක්ෂා කළ පොලිස් නිලධාරියකු යමකු ගෙල පැළඳ සිටි නූලක්ද සොයාගත්තේය.

> තුවාල 28ක්. බංගලාවට ගෙනිහින් තියෙන්නේ පුටුවක් උඩ තියාගෙන. දොස්තර එන්න කලින් බංගලාවේදීම මැරිලා

### අපරාධයෙන් පසු හැසිරීම

වීරසාමි කොයි මොහොතක හෝ මහනුවර පිහිටි වෘත්තීය සමිති මව් ශාඛාවට පැමිණෙනු ඇතැයි පොලිසියට සැක මතු විය. ඒ අනුව සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරියෙක් ඒ අසල රැඳී සිටියේය. දින දෙකකට පසු වීරසාමි එම කාර්යාලයට පැමිණියේය. ඒ පාර්සලයක්ද අතැතිවයි. පොලිස් නිලධාරියා වහාම ඒ බව ඉහළ නිලධාරීන්ට දැනුම් දුන්නේය. පසුව එතැනට පැමිණි පොලිස් නිලධාරීහු වීරසාමි සැකපිට අත්අඩංගුවට ගත්හ. එහෙත් ඔහු රැගෙන ආ පාර්සලය සොයාගැනීමට නොහැකි විය. වීරසාමි සිය කොණ්ඩයද වෙනස් හැඩයට කපා තිබිණ. ඔහු ඈත ගමක බාබර් සාප්පුවකට ගොස් කරණවෑමියාට අමුතු මෝස්තරයකට කොණ්ඩය කපන ලෙස උපදෙස් දී ඇත.

"මට බෑ ඒ කියන විදියට කපන්න."

එසේ වුවද අවසානයේ ඔහුට අවැසි ආකාරයට හිසකේ සකස් කෙරිණ. පසුව ඒ අසල වූ ටේලර් සාප්පුවකට ගොස් සරමක් මසා දෙන ලෙසද ඉල්ලා ඇත. ඔහු සාමාන්‍යයෙන් අඳින්නේ වේට්ටියයි. ඒ අනුව සිය ස්වරූපය සම්පූර්ණයෙන් වෙනස් කිරීමට වීරසාමි උත්සාහ දරා තිබේ.

වීරසාමි සමඟම අතුරුදන් වූ වෙලායිතන් සොයා ගැනීමටද මේ වනවිට මෙහෙයුම් අරඹා තිබිණ. ඔහුගේ රුව සහිත පෝස්ටර් ගසා තිබුණේ සොයාගැනීමේ අපේක්ෂාවෙනි. ඔහු වෙනත් වත්තකට ගොස් තිබිණ. එම වත්තේ කංකානි, නුහුරු තැනැත්තකු සිය වත්ත හරහා ගමන් ගන්නා බව දුටුවේය. ඔහුට මතකයට ආවේ පෝස්ටරයේ වූ පින්තූරයයි. මේ එම තැනැත්තා යැයි සැක සිතූ කංකානිවරයා අමුත්තා අල්ලා ගත්තේය.

"උඹේ නම මොකද්ද?"

"ආරුමුගම්."

එය පිළි නොගත් කංකානිවරයා වැඩිදුරටත් ප්‍රශ්න කරද්දී එම පුද්ගලයා තමා වෙලායිතන් බව පිළිගත්තේය. එපමණක් නොව, තමා පෝප් ඝාතනයට සම්බන්ධ වූ බවට පාපොච්චාරණයක්ද කළේය. ඔහු අත්අඩංගුවට ගත් අතර එහිදී නිරීක්ෂණය කෙරුණේ ඔහුගේ ගෙලේ තුවාලයක් ඇති බවයි. වෛද්‍යවරයා ඒ ගැන වැදගත් ප්‍රකාශයක් කළේය. මෙම තැනැත්තා අපරාධයට සම්බන්ධ වූයේ නම්, ගෙලේ නූලක් පැළඳ සිටියේ නම් මරණකරු එයින් ඇද්දේනම් එවැනි තුවාලයක් ගෙලෙහි ඇතිවිය හැකි බවයි. අපරාධ ස්ථානයේ තිබී හමු වූ නූල වෙලායිතන්ට අයත් බවද පසුව තහවුරු විය.

### නඩේසන්ගේ කුඩේ

සිදුවීම වූ ද රෑ නඩේසන් නැමැත්තාද පොලු අතේ තබා සිටි කල්ලිය දුටුවේය. ඔහු කුඩයක්ද රැගෙන ඔවුන් අසලින් ගමන් කළේය. පිරිස සමඟ කතා කරද්දී ඉයන් පෙරුමාල් කුඩය ඉල්ලීය.

"බෑ. බෑ. මේක මගේ නෙමේ."

යනුවෙන් කීවද ඉයන් නඩේසන්ගේ කුඩය ඉල්ලා ගත්තේය. එම කුඩය පසුව ඉයන්ගේ ලැයින් කාමරයේ තිබී හමුවිය.

### දඩයමට ඇරයුම්

මෙයියප්පන්ගේ හොඳම මිතුරකු වූ කුප්පෙසාමි හමුවීමටද වීරසාමි සිදුවීම ද ගියේය.

"අපි අද පෝප්ට ගහලා මරනවා. යං අපි එක්ක."

මෙයියප්පන්ගේ මිතුරකු වූ බැවින් කුප්පෙසාමි ඊට එකඟ වනු ඇතැයි වීරසාමි සිතීය. එහෙත් කුප්පෙසාමි එය තරයේ ප්‍රතික්ෂේප කළේය. පසුව වීරසාමි රාත්‍රියේද කුප්පෙසාමි හමුවිය.

"අපි දඩයමේ යනවා. යං."

ඊට කැමති වූ කුප්පෙසාමි වීරසාමි සමඟ පැමිණියේය. බංගලාව අසලට ගිය පසු වීරසාමිගෙන් ඔහුට නියෝගයකි.

"මේ ටෙලිෆෝන් වයර් කපපං."

එහෙත් පෝප්ගේ වාහනයේ විදුලි ලාම්පු එළිය මතු වූ බැවින් කුප්පෙසාමිට ඊට ඉඩක් නොලැබිණ. ඒ අතර පහරදීමක්ද ඇසුණු බැවින් කුප්පෙසාමි එතැනින් දිවගොස් නිවසට ගියේය. පසුව ඔහු මෙම සිදුවීමට අදාළව රජයේ සාක්ෂිකරුවකු ලෙස නම් කෙරිණ. මුල් අවස්ථාවේදී මෙලෙස පැවසුවද ඔහු අධිකරණයේදී පසුව කළේ හාත්පසින් වෙනස් ප්‍රකාශයකි. සාක්ෂි වෙනස් කිරීම හේතුවෙන් ඔහු වසර හතරක සිර දඬුවමකටද ලක්විය.

### දඬුවම් නියම කිරීම

සිදුවීම පිළිබඳ ලඝු නොවන නඩු විභාගයේදී සැකකරුවෝ අටදෙනෙක් වූහ. මෙයියප්පන්ද ඒ අතර සිටියේය. එහෙත් පසුව ඉංග්‍රීසි කතා කරන ජූරි සභාවක් ඉදිරියේ කොළඹදී වීරසාමි, වෙලායිතන්, ඉයන් පෙරුමාල්, රෙංගසාමි, මුණියන්ඩි සහ මාරිමුත්තු වේලු යන විත්තිකරුවන්ට එරෙහිව නඩුව විභාගයට ගැනිණ. එහිදී 55 දෙනෙකුගේ සාක්ෂි මෙහෙයවා තිබේ. ජූරි සභාවේ ඒකමතික තීන්දුව අනුව පළමු සහ දෙවන වත්තිකරුවෝ වරදකරුවන් වූහ. ඔවුන්ට මරණ දඬුවම නියම විය. ඔවුන්ගේ අභියාචනාද ප්‍රතික්ෂේප විය. 1942 පෙබරවාරි මස 27 වනදා වීරසාමි වැලිකඩදී එල්ලා මරා දැමිණ. වෙලායිතන්ට එරෙහිව දඬුවම ක්‍රියාත්මක වූයේ ඊට පසුදායි.

■ නීතිඥ රජනිකා ලියනගේ

## අලි කතා

# ඩිංගිරියෝ අලි එනවෝ





තොරතුරු
**රණවීර ගමගේ ගුණසිරි**
(සෙවණගල)

ඇඹිලිපිටියේ ගුණසිරි වරක් ආක්‍රමණික ශාකයක් වන ලැන්ටානා ඉවත් කිරීමේ මෙහෙයුමකට සම්බන්ධ විය. නිවර්තන ඇමරිකාව නිජබිම කරගත් ලැන්ටානා ඕනෑම කලාපයක හොඳින් වැඩේ. ගඳපාන, බාලොලියා සහ හිඟුරු ලෙසින්ද හඳුන්වන මේ පැළෑටිය අපේ රටේ නැති තැනක් නැත. සුන්දර වුවද ආක්‍රමණික ශාකයක් බැවින් ඒවා ඉවත් කිරීමේ මෙහෙයුම් වරින් වර ක්‍රියාවට නැංවෙයි. කැලෑ බිම්වල ඒ රාජකාරිය පහසු නැත. ඒ අලි ඇතුන් සමඟ ගැටෙන්නට වෙන නිසාය. මේ මෙහෙයුමේදී ගුණසිරිගේ පැමිණීම සෙසු නිලධාරීන්ටද අස්වැසිල්ලක් විය. ඒ ඔහු කැලෑව ගැන හොඳින්ම දන්නා තැනැත්තකු බැවිනි.

එදා වනයේ සිට නැවත එමින් සිටියදී මීටර 100ක් පමණ ඈතින් වූ හොඳින් වැඩුණු ලැන්ටානා පඳුරක් පිරිසගේ නෙත ගැටිණි.

"ගුණේ අයියේ, කවුරු හරි ගිහින් අන්න අර ලැන්ටානා ගහ ගලවලා දන්නකෝ."

ඒ නියෝගය කණ්ඩායම් ප්‍රධානියාගෙනි. ගුණසිරි එය ඩිංගිරිට පැවරුවේය. ලැන්ටානා පඳුර අතින් ගලවා ඉවත් කළ හැකි වුවද ඩිංගිරියා යකඩ මිට සහිත උදැල්ලක්ද රැගෙන ගියේය. වැඩි වේලාවක් යන්නට මත්තෙන් ගුණසිරි දුටුවේ කළු ගලක් පෙරලෙන්නාක් මෙන් ඈතින් එන සද්දන්තයෙකි. කන් පෙතිද සොලවමින් ඔහු එන පොට එතරම් හොඳ නැත. පැමිණෙන රිද්මයද වලියට බරය.

"ඩිංගිරියා, ඩිංගිරි, ඒයි..."

කියද්දීම ඩිංගිරි ගුණසිරි දෙස බැලීය.

"කෙළින් එන්න එපා. වම් පැත්තට දුවලා වාහනේට කවර් වෙලා මෙහෙට වරෙන්"

යකඩ මිට සහිත උදැල්ල දෑතින්ම අල්ලා ගත් ඩිංගිරි උපදෙස් අනුව වාහනය දෙසට ආවේය. වාහනය දෙස බලා සිටි දැවැන්තයා ඩිංගිරි දෙස බැලීය. කිසිවකුට කිසිවක් සිතාගැනීමට ඉඩක් නැත. එය එතරම් අවදානම් සහගත අවස්ථාවකි. සිය ඉලක්කය වඩා හොඳින් ග්‍රහණය කර ගැනීමට දෝ අලියා මදක් හිස ඇල කරමින්ද ඩිංගිරි දෙස බැලීය. සැවොම බියෙන් මුසපත් වී සිටියදී නැවත හැරුණු අලියා වෙඩිල්ලක් මෙන් පිරිස මගහැර දුවන්නට ගත්තේය. ව්‍යාපෘති නඩයද තක්කු මුක්කු විය. ආපසු හැරුණේ කුමක් නිසාදැයි දන්නේ අලියාම පමණි. එහෙත් එය පිරිසේ වාසනාවකි. ඇතැම්විට ඩිංගිරි උදැල්ල අමෝරාගෙන ආ විලාසයට එය තුවක්කුවක් යැයි අලියාට සැක හිතෙන්නට ඇත. තමන් හිසට තම අතමය සෙවණැල්ල කියා සිතමින් ආපසු හැරී දිව්වේ දිවි ගලවා ගන්නට විය හැක. සියල්ලන් වාහනයට නැගුණේ අවදානම් කලාපය මගහැර යාමේ අපේක්ෂාවෙනි. වැඩි වේලාවක් ගත වන්නට මත්තෙන් පැනගිය චණ්ඩියා වෙනත් ස්ථානයකින් හිස දමා එබිකම් කළේය. එය මේ මිනිසුන් කරන්නේ මොනවාදැයි ඔත්තු බැලීමට ආ ගමනකි. ගිනිඅවි ක්‍රීඩා නොමැති බව සැක හැර දැනගත් වීරයා පෙරට ආවේය. ඒ තනිව නොවේ. සිය සහචරයින්ද සමඟය. එහෙත් කිසිවකුගෙන් කලබලයක් පෙනෙන්නට නැත. සටනට සූදානම්ව සියල්ලෝ මුහුණට මුහුණ ලා පෙළ ගැසුණහ. මියෙම්වා හෝ රැකෙම්වායි සිතූ ගුණසිරි උස් හඬින් අලි රැල ඇමතීය.

"හෝව් හෝව්, ඔහෙලාගෙ පාඩුවෙ ඔහෙලගෙ වැඩක් කරගන්න. අපේ පැත්තට එන්න එපා. අපි මේ ඔහෙලට කරදර කරන්න ආවෙ නෑ."

අනතුරුව කණ්ඩායම් ප්‍රධානියා වෙත හැරුණු ගුණසිරි කීවේ,

"අපි යමු මහත්තයා යන්න"

යනුවෙනි.

පිරිස වාහනයේ නැගී පිටත් වූ අතර අලි නඩය එදෙස බලා සිටියා පමණි. ගුණසිරි පැවසූ දේ ඔවුන්ට තේරුණා හෝ නොතේරුණා වුවද මේ මිනිසුන්ගෙන් තමන්ට හිරිහැර නැති බව සද්දන්තයින්ට දැනෙන්නට ඇත.

■ රජනිකා ලියනගේ

# දඹර වෙච්ච අයව යාළු කරන කේක් සුරංගනාවී

ෂෙහානි රෝෂාලියා









එකෝමත් එක කාලෙක අවුරුදු ගාණකින් කතා කරලා නැති මුණගැහිලා නැති සැමියෙකුයි බිරිඳකුයි හිටියාලු. කොහොම වුණත් මේ බිරිඳට එයාගේ හස්බන්ඩ්ව නිතරෝම වගේ මතක් වුණාලු. හස්බන්ඩ් වෙනුවෙන් කරන්න පුළුවන් දෙයක් කල්පනා කර කර ඉන්දැද්දි එයාට ඒ වැඩේට තක්කෙටම ගැළපෙන කෙනෙක්ව මතක් වුණා. ඒ තමයි කේක් සුරංගනාවි.

එවෙලෙම එයා කේක් සුරංගනාවිට කතා කරලා එයා සැමියගෙන් ඈත්වෙලා ඉන්න බවත්, ගොඩාක් මතක් වෙන බවත් කියලා පුළුවන් නම් ඔහුට කේක් එකක් ගිහින් දෙන්න කියලත් කිව්වලු. ඔන්න පස්සේ දවසක කේක් සුරංගනාවි ලස්සනම ලස්සන කේක් එකකුත් හදාගෙන අර කියපු හස්බන්ඩ්ගේ ගෙදර හොයාගෙන ගිහින් එයාගේ අතටම කේක් එක දුන්නා.

**"ඔය කේක් එක එව්වේ කවුද කියලා දන්නවද?"**

**"නෑනේ."**

**"ඕක එව්වේ ඔයාට ගොඩක් ආදරේ කරන, ඔයාව ගොඩක් මතක් වෙන, ඔයා හොඳටම දන්න කෙනෙක්."**

එහෙම කියලා ලස්සනට හිනාවෙලා කේක් සුරංගනාවි එතැනින් යන්න ගියා. පස්සේ කේක් එක දැකලා සතුටු හිතුණු මහත්තයා එවෙලෙම එයාගේ බිරිඳට කෝල් එකක් දීලා. පස්සේ ආයෙත් ඒ දෙන්නා ඉස්සර වගේම සමාදාන වෙලා දැන් බොහොම සතුටින් ජීවත් වෙනවලු.

ඔය කිව්වේ ඇත්තම ඇත්ත කතාවක්. සමාජ මාධ්‍ය පාවිච්චි කරන අය නම් කේක් සුරංගනාවි කිව්ව හැටියෙම ඇයව අඳුනගන්නවා. මොකද ඒ තරමට ඒ නමින් ඈ ප්‍රසිද්ධයි. මේ කියන සුරංගනාවි කේක්වලින් පවුල් ගාණක් සමගි කරලා තියෙනවා. කතා නොකර ඉඳපු දෙමව්පියෝ දරුවෝ ගොඩාක් එක්කාහු කරලාත් තියෙනවා.

ටික්ටොක් ෆලෝවර්ස්ලා ලක්ෂ පහකුයි, ෆේස්බුක් ෆලෝවර්ස්ලා ලක්ෂ දෙකකුයි ඉන්න කේක් හදන සුරංගනාවිගේ ඇත්ත නම ෂෙහානි රෝෂාලියා. කේක් කිව්වහම ගොඩක් අයට මතක් වෙන්නේ හැමතිස්සෙම ලස්සනට හිනාවෙලා ඉන්න ඇයව. බර්ත්ඩේ එකකට, වෙඩින් එකකට ෂෙහානිගෙන් කේක් එකක් ගත්තොත් ඒ අවස්ථාවේ වටිනාකම වැඩිවෙනවා කියලයි ගොඩක් අය කියන්නේ. ඒ නිසා ඇගෙන් කේක් එකක් ගන්න එක බකට් ලිස්ට් එකට දාගත්තු අයත් ඉන්නවා. අද කොච්චර සාර්ථක වුණත් ෂෙහානිගේ කතාව පටන් අරන් තියෙන්නේ පුංචි ලෑලි ගෙදරකින්. ඒ කතාව ෂෙහානි අපිත් එක්ක බෙදාගත්තේ මෙහෙම.

**"මම හලාවත, මාදම්පේ. ශිෂ්‍යත්වෙට වෙනකල් හලාවත මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉගෙනගත්තා. පස්සේ මාරවිල ශුද්ධ වූ පවුලේ බාලිකා මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වුණා. පවුලේ ඉන්නේ මායි, නංගියි, අම්මයි, තාත්තයි. පුංචි කාලේ අපි හිටියේ පොඩි ලෑලි ගෙදරක. මාවයි නංගිවයි සැපට තියන්න අම්මයි තාත්තයි ගොඩක් මහන්සි වුණා. කොහොමහරි මට අවුරුදු දෙළහක් විතර වෙනකොට එයාලා සාමාන්‍ය මට්ටමකට ආවා."**

අම්මයි, තාත්තයි සල්ලි හොයන්න ගත්තු මහන්සිය දැකපු ෂෙහානි ඒ අයට බරක් නොවී ඉන්න ඕනේ කියලා හිතලා තියෙන්නේ පුංචි කාලෙදිමයි. අධ්‍යාපන වැඩවලට අවශ්‍ය කරන මුදල් හොයාගන්න අරමුණින් ඇය බර්ත්ඩේ කාර්ඩ් හදන්න පටන්ගත්තේ අවුරුදු 16දීලු.

"මම පුංචි කාලේ ඉඳලා විවිධ නිර්මාණ කරන්න කැමතියි. සාමාන්‍ය පෙළ කාලෙදි බර්ත්ඩේ කාර්ඩ් හදලා අඳුරන අයගේ කඩවලට දැම්මා. ඒවගෙනුත් එකක් දෙකක් තමයි විකුණුනේ. පස්සේ මම ෆේස්බුක් පේජ් එකක් හැදුවා. ඔය අතරේ මට වෙඩින් කේක් පෙට්ටි ඇණවුමක් ආවා. ඒකත් කළා. ඉගෙනගන්න ගමන් පොඩි පොඩි නිර්මාණ කරන අතරේ තමයි කේක් හදන්න හිතුණේ. මූලික පාඨමාලාවකට සම්බන්ධ වෙලා කේක් හදන හැටි ඉගෙනගත්තා. මුලින්ම හැදුව කේක් නිකන් රොටී වගේ. පස්සේ රසට ලස්සනට කේක් හදන්න ඉගෙනගත්තා. මට මුල්ම ඕඩරේ දුන්නේ මගේ බාප්පා. ඒක දුන්නේ රුපියල් 1000කට.

ඔය අතරේ උසස් පෙළ ප්‍රතිඵල ආවා. මට හොඳ ප්‍රතිඵලයක් තිබුණා. හැබැයි කේක් පැත්තෙන් ඉස්සරහට යන්නයි ඒ වෙනකොට මට ඕන වුණේ. කැම්පස් නොයා මෙහෙම වැඩක් පටන් අරන් ඒක අසාර්ථක වුණොත් ඒක ලොකු අවදානමක්නේ. ඉතින් ගෙදර අය මුලදි කේක් වැඩේට කැමති වුණේ නැහැ. 'පිටි මිරිකලා කාටද හරිගියේ?' කියලා සමහර නෑයෝ ඇනුම්පද කිව්වා. ඒත් මට යන්න පුළුවන් හොඳම පැත්ත මේක කියලමයි මගේ හිත කිව්වේ."

ෂෙහානි ඔය විදියට කේක් වැඩේට අතගහලා තියෙන්නේ 2016දී.

**"මම සාම්පල් හද හදා පේජ් එකට දැම්මා. මුලදි නම් ලොකුවට ඕඩර්ස් ආවේ නැහැ. ඉස්සර ටික්ටොක් ඇප් එක තිබුණේ මියුසිකලි නමින්. කේක් හදලා ඒකේ වීඩියෝ දැම්මා. එහෙම දැම්මා කියලත් ලොකු ඉල්ලුමක් හැදුනේ නැහැ. පස්සෙ මම කේක් එක හදන තැන ඉඳලා අවසානය දක්වාම වීඩියෝ දැම්මා. ඔන්න ඒ වීඩියෝ එකපාර වෛරල් වෙලා ලොකු ඉල්ලුමක් හැදුනා."**

සමාජ මාධ්‍යවලින් ඉල්ලුම හැදුනට කේක්වල ප්‍රමිතියක් නැත්නම් ඒ ඉල්ලුම දිගටම තියාගන්න බැහැනේ. ෂෙහානිගේ කේක්වලට තියෙන ඉල්ලුම අඩු නොවෙන්න හේතුව ඇගේ කේක්වල ප්‍රමිතිය.

**"මම කේක් හදන්න ගන්නේ හොඳම අමුද්‍රව්‍ය විතරයි. ගොඩක් අය කේක් සැරසිලි කරන්නේ මල් හදන්නේ කටර්වලින්. මම අදටත් ඒ හැමදේම කරන්නේ අතින්. ඒ වෙනස ඉල්ලුම වැඩිවෙන්න හේතුවක් කියලා මම හිතනවා."**

අද වෙනකොට ෂෙහානිට දවසකට අසීමිත ඇණවුම් ප්‍රමාණයක් එනවලු. ඒ හැම එකම බාරගන්න අමාරු නිසා ඇය දවසට කේක් 15ක් විතර හදනවලු. වැලන්ටයින් මාසේ නම් හම දවසකම කේක් 80 ගානේ හැදුවලු.

"මේ වෙලාවෙත් ෆෝන් එකේ ඕපන් කරගන්න බැරිවුණු මැසේජස් 8000ක් විතර තියෙනවා. ඒවා නොබලපුවාම මම අහංකාරයි කියලා කියන අයත් ඉන්නවා. අදටත් මම කේක් හදන්නේ තනියම. ඉතින් මට හැම ඕඩරේම බාරගන්න අමාරුයි. මට කියලා කේක් එකක් හදාගන්න ගොඩක් අය ආසයි. සමහරු දුර පළාත්වල ඉඳලා ගෙදර හොයාගෙන ඇවිල්ලා ඕඩර් දීලා යනවා. මේ ළඟදි මල්ලි කෙනෙක් ආවා. එයාගේ ගෑනු ළමයා මගේ ලොකු රසිකාවියක්ලු. මම හදපු කේක් එකක් දෙන එක එයාට දෙන්න පුළුවන් හොඳම සප්‍රයිස් එක කිව්වා. ඉතින් මම ඒ මල්ලිට කේක් එකක් හදලා දුන්නා."

දැන් කේක් හදන ගොඩක් දෙනා ඒ කේක් එක ගෙදරටම ගිහින් බාරදෙනවා. හැබැයි ඔය කාටත් කලින් ඒ වැඩේ පටන් අරන් තියෙන්නේ අපේ කේක් සුරංගනාවි.

"ඒක අහම්බෙන් වුණු දෙයක්. දවසක් විදේශගත වෙලා ඉන්න කෙනෙක් මට කේක් ඕඩරයක් දුන්නා. මට ගිහින් ඒක බාරදෙන්න කියලත් එයා කිව්වා. බාරදෙන එකේ ෆොටෝ එකක් ගහලා එවන්න කිව්වා. ඒක වගකීමක් ඇති වැඩක් නිසා මුලදි මම ඒකට ටිකක් බය වුණා. ඒ නිසා බැහැලා ගෙදරට යනකල්ම ඒක වීඩියෝ කරලා එයාට යැව්වා. එයා ගොඩක් සතුටු වුණා. පස්සේ මම ඕක ටික්ටොක් දැම්මා. පස්සේ ඒ අය ආදරේ කරන අයට කේක් ගිහින් දෙන්න කියලා ගොඩක් අය ඉල්ලන්න ගත්තා. ඒ නිසා මම දැන් ඒකත් කරනවා. ළඟදි අම්මා කෙනෙක් කතා කළා. එයාගේ පුංචි පුතා ඉන්නේ සැමියා එක්ක. එයාලා වෙන්වෙලා. අම්මා අවුරුදු ගාණකින් ඒ දරුවා දැකලා නැහැ. මම කේක් එකක් අරන් ගිහින් පුතාට කේක් එක දීලා වීඩියෝ එක අම්මට දැම්මා. අවුරුදු ගාණකට පස්සේ පුතාව දැකපු නිසා අම්මා ගොඩක් සතුටු වුණා."

ලංකාවේ ප්‍රසිද්ධ පුද්ගලයන් පවා ඔවුන්ගේ ආදරණීයයන් පුදුම කරන්න කේක් බාරදෙන වැඩේ බාරදෙන්නේ ෂෙහානිටලු.

**"අද මොනතරම් සාර්ථක වුණත් මුලදි මට අභියෝග ගොඩක් ආවා. මම නිතරම හිනාවෙලා ඉන්නවට සමහරු කැමති වුණේ නැහැ. 'ඔයා මොකද හැමවෙලේම හිනාවෙලා ඉන්නේ, මගේ බෝයිෆ්‍රෙන්ඩ් ඔයගේ ටික්ටොක් බලනවා' කියලා ගොඩක් අය අදටත් බැනලා මැසේජ් එවනවා. ක්ෂේත්‍රයේ ගොඩක් අයත් මට බැන්නා. මම එයාලගේ ඕඩර් උදුරගන්නවා කිව්වා. ඔහොම කියද්දි එකපාරක් මට මේ වැඩේ අත අරින්න හිතුණා. මගේ පවුලේ අය තමයි පස්සේ හිත හැදුවේ."**

තමන්ට කියලා මුකුත් කරගන්න උනන්දුවක් නැති මිනිස්සුන්ට අනිත් මිනිස්සු හිනා වුණත් වැරදියිනේ. ඒ නිසා ඒ ගැන ෂෙහානි පස්සේ හිතුවේ නැතිලු. ඒ අභියෝගයට අමතරව ෂෙහානිට තවත් අභියෝග තිබිලා තියෙනවා.

"මුලදි මට කේක් හදන්න තැනක් තිබුණේ නැහැ. අම්මගේ කුස්සියේ තමයි කේක් හැදුවේ. පස්සෙ පුංචි කාමරයක් හදාගත්තා. විවාහ වුණාට පසසේ සැමියගේ ගෙදර ලොකු කාමරයක් හදාගත්තා. වැඩේ පටන්ගත්තු මුල් කාලේ මට හරියට මැෂින් තිබුණෙත් නැහැ. ඒත් දැන් මට කේක් කිලෝ 20ක් එකපාර හදන්න පුළුවන් මැෂින් එකක් තියෙනවා. තව බ්‍රෑන්ඩඩ් මික්ෂර්ස් දෙකක් තියෙනවා. මම කේක් රූම් එකක් හදන්න පටන්ගත්තා. කේක් රූම් එකක් කියන්නේ යුරෝපීය සංකල්පයක්. මේක කේක් බඩු හැමදේම තියෙන ලොකු බිල්ඩින් එකක්. මම දන්න තරමට දැනට ලංකාවේ කොහෙවත් කේක් රූම් එකක් නැහැ. ඒ විතරක් නෙමෙයි මම දරුවන්ට කේක් පාඨමාලා කරනවා. පසුගිය මැයි මාසේ මගේ පළවැනි බැච් එකේ දරුවෝ 120 දෙනාගේ කේක් ප්‍රදර්ශනය තිබුණා. ඒකට ලංකාවේ කලා ශිල්පීන් වගේම ක්ෂේත්‍රයේ ගොඩක් අයත් සහභාගී වුණා. මාස තුනකින් ඒ වගේ කේක් හදන්න උගැන්නුව එක විශ්වකර්ම වැඩක් කියලා එයාලා පුදුම වුණා. ඒ ප්‍රදර්ශනය තිබ්බෙත්, කේක් රූම් එක හදන්නෙත් මම කේක් විකුණලා හොයපු සල්ලිවලින්. මම PME, විල්ටන් වගේ යුරෝපීය කේක් පාඨමාලා කිහිපයක්ම කළා. ඕවටත් ලොකු මුදලක් වියදම් වුණා. මම සාමාන්‍ය රැකියාවක් කළා නම් ඒ වගේ මුදලක් ගැන මට හිතන්නවත් බැහැ."

ෂෙහානි කතා කරද්දිත් ඇගේ මූණේ තියෙන අර හිනාව දිගටම තිබුණා. හැමදාම දිනුවේ කාව නැතත් තමන්ව විශ්වාස කරන මිනිස්සු. ෂෙහානිත් අන්න එහෙම ගැහැනියක්.

**"කැම්පස් යන්නේ නැතිව මේ වැඩේට අතගහද්දි මට අනාගතය පෙනුණා. මේ පැත්තෙන් කවදාහරි මම සාර්ථක වෙනවා කියන එක මට මැවිලා පෙනුණා. ඒක හීනයක්ද මම දන්නේ නැහැ. ඒත් මම ඒ හීනේ විශ්වාස කළා. බිංදුවෙන් පටන් අරන් අද ඉන්න තැන ගැන නිහතමානී සතුටක් තිනෙවා. කොච්චර අභියෝග ආවත් මම සාර්ථක වුණා. අනිත් අයටත් කියන්නේ ලංකාවේ ආර්ථිකය කඩාගෙන වැටුණා කියලා රට යන්න ඕනේ නැහැ. උනන්දුව, උත්සාහය තියෙනවා නම් ලංකාවෙ ඉඳලාත් ගොඩයන්න පුළුවන්. ඒ වගේම තමන් කරන දේ හරියට කරන්න. නිතරම තවත් කෙනෙක්ගේ සතුටක හවුල්කාරයෙක් වෙන්න බලන්න. එහෙම මිනිස්සුන්ට කවදාවත් වරදින්නේ නැහැ."**

ෂෙහානි ඒ උපදේශය දුන්නේ 'ධරණී' කියවන ඔයාලට. ෂෙහානිගේ වැඩවලට උදව්වෙන ඇය එක්ක ඉන්න පිරිසව ආදරෙන් මතක් කරන්න ඇය අමතක කළේ නැහැ.

"මගේ සැමියා දිල්ෂාන් ප්‍රනාන්දු. ඔහු විදේශගත වෙලා හිටියේ. අපිට දිගටම එහේ ඉන්න පුළුවන්. ඒත් ඔහු මාව විශ්වාස කරලා ලංකාවට ඇවිල්ලා දැන් මගේ හැම වැඩකටම උදව් කරනවා. ඒ වගේම මගේ පවුලේ අයත් ඔහුගේ පවුලේ අයත් මතක් කරන්නම ඕනේ. මාත් එක්ක දැන් පොඩි මල්ලි කෙනෙක් වැඩ කරනවා. ඔහුවත් මේ වෙලාවේදී ආදරෙන් මතක් කරනවා."

අභියෝග, කැපකිරීම් මැද්දේ ගමන පටන්ගත්තු කේක් සුරංගනාවිගේ කතාව බොහොම ලස්සනට ඉවර වුණේ ඔහොමයි. මේ කේක් සුරංගනාවිගේ ලස්සන හිනාව බලන්න කැමති නම් තව සැරයක් 'ධරණී' මුල්පිටුව බලන්න. මොකද අද 'ධරණී' කවරය හැඩ කළේ ඇයයි.

**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්**

## හොරිවිල වෙදමහත්තයාගෙන් බෙහෙතක්

2 කොටස



**ශාන්ත සෙනෙවිරත්න වෙදමහතා**
හොරිවිල වෙද මැදුර

# දත් රෝගවලට අත් බෙහෙත්



**මනුස්ස පරාණවලට වැළඳෙනවාය කියන ඔය අට අනූවක් රෝග නිට්ටාවටම සුව කරන්ට පුළුවන් ජගතෙක් ඉන්නවනම් ඉතින් ඒ සිංහල වෙදමහත්තයෙක්ම වෙන්න ඕන. නම් දරාපු ලොකු දොස්තර මහත්තැන්ලා ගාවට හිහිල්ලත් ලෙඩ සුව කරගන්න බැරිවෙද්දී ඒකනේ සමහරු කියන්නේ 'නරකද සිංහල බෙහෙත් ටිකක් බීලා බැලුවොත්' කියලා. මොකද පුද්ගලික ඉස්පිරිතාල හෝ විශේෂඥ වෛද්‍යවරු නොහිටිය පුරාණ කාලේ ඔය වෙදමහත්තුරු තමයි ඕන ලෙඩක් හොඳ කළාය කියන්නේ. අපේ රටේ එහෙව් නම ගිය වෙද පරපුරක් තමයි හොරිවිල වෙද පරපුර කියන්නේ. 'හොරිවිල වෙදමහත්තයා' කිව්වම අදත් ඉතින් නොදන්නා කෙනෙක් නැහැ නොවැ! මේ වෙද පරපුරේ තිස්වැනි පරම්පරාව තමයි අද වෙද්දී වෙදකමේ නියැලෙන්නේ. ඉතින් අද ඉඳලා අපි මේ ලක ලැහැස්ති වෙන්නේ අන්න ඒ හොරිවිල වෙදමහත්තයාගෙන් පුංචි පුංචි ලෙඩවලට අත්බෙහෙත් ගෙදරදීම හදාගන්න විදිය අහලා කියන්නයි.**

### දත් කැක්කුමක් ඇවිත්ද?

සීනක්කාරං කුඩු (සිංහල බෙහෙත් බඩු කඩවලින් මිලදී ගත හැකියි) ස්වල්පයක් ගෙන එය හොඳින් පුළුස්සා ගන්න. ඉන්පසු හොඳින් කුඩුකරගන්න. එය පිරිසිදු බෝතලයකට දමා පිරිසිදු වතුර අඬුකෝප්ප දෙකක් පමණ එක්කර දත් කැක්කුම ඇතිවිට හොඳින් සොළවා වරින්වර කට සෝදන්න. දත් කැක්කුම නැතිවේවි.

### දත්මුල් දියවෙලා වගේද?

කටු කරඬු, සමන් පිච්ච කොළ සහ කරඳ මුලේ පොතු කලං හය බැගින් ගෙන කයිප්පු, සීනක්කාරං කුඩු සහ රත් හඳුන් කලං තුන බැගින් දමා වතුර පත දසය පත හතරට සිඳුවාගන්න. පසුව දින තුනකට වරක් විනාඩි පහක් පමණ එම දියරයෙන් හොඳින් කට සෝදාහරින්න. එවිට දත්මුල් දියවීම වැළකී දත් ශක්තිමත් වේවි.

### දත් හෙළවෙනවද?

කයිප්පු (සිංහල බෙහෙත් බඩු කඩවලින් මිලදී ගත හැකියි) සහ සහිඳ ලුණු කලං තුන බැගින් ගෙන කුඩුකර ගන්න. තලතෙල් බෝතල් තුන් කාලක් තාච්චියකට දමා එයට ඉහත සාදාගත් කුඩු මිශ්‍රකර ගන්න. එය බෝතල් කාලට සිඳුවාගන්න. ඉන්පසු නිවෙන්නට හැර තේ හැඳි 1 -2ක් පමණ ප්‍රමාණයක් මුවට ගෙන කලතමින් කට සෝදා හරින්න. මෙය දිනකට තුන්වරක් ලෙස දින කීපයක් කරනවිට හෙලවෙන දත් සවිමත් වේවි.

### කට දුගඳයිද?

ගස් කරල් සැබෝ පැළ, පුළුස්සා ගත් අළු, අඹ කොළ යුෂවලට දමා අව්වේ කකාරා වේලගන්න. එයින් ස්වල්පය බැගින් ගෙන බුලත් සමඟ උදේ හවස කන්න. කටේ ගඳ නැත්තටම නැතිවේවි.

### දත් සුද්ධ කළොත් මොකද?

ඉදුණු බිලිං ගෙඩි 2-3ක් ගෙන දත්වලින් හොඳින් හපන්න. පසුව දත්බුරුසුව ගෙන විනාඩි 10ක් පමණ හොඳින් දත් මදින්න. ඉන්පසු බිලිං රොඩු ඉවත්කර තලතෙල් ස්වල්පයක් මුවට ගෙන දත් අතරින් යන සේ කලතන්න. විනාඩි 3-4ක කාලයක් එය කරන්න. පසුව මුව සෝද හරින්න. දීප්තිමත් දත් දෙපළක් ලැබේවි.

**■ රුවන් එස්.සෙනවිරත්න**

ක්‍රිකට් තරඟයක් ඇති දාට ක්‍රිකට් ලෝලීන්ගේ පශ්චාත් බාගයට ඉත්තෑවන් ඇතුළුවන්නට පටන්ගත්තේ අදක ඊයෙක නොවේ. එදා සිට එය එහෙමය. 2006 ඔක්තෝබර් 14 වැනිදාත් ශ්‍රී ලංකා ක්‍රිකට්ලෝලීන්ට එවැනි දවසකි. බෝලයත් පිත්තත් රැගෙන බටහිර ඉන්දීය කොදෙව්වන් සමඟ කරට කර හැප්පෙන්නට ගොස් අපේ එවුන් සිටියේ ඉන්දියාවේය. තරඟය ආරම්භ විය. නමුත් බොහෝදෙනාගේ දෑස් විස්මයට පත්කරමින් ක්‍රිස් ගේල්, බ්‍රයන් ලාරා, ඩ්වෙයින් බ්‍රාවෝ, මාලන් සැමුවෙල්, ශිවනරීන් චන්ද්‍රපෝල් මෙන්ම රම්නරේෂ් සර්වාන් වැනි අතිදක්ෂ පිතිකරුවන් සිටි කොදෙව් ඉනිම ලකුණු 80කට සීමා කරන්නට අපේ කොල්ලන්ට හැකිවිය. දකුණතින් මදවේග පන්දු යවන අපේ ක්‍රීඩක ෆර්විස් මහරූෆ් ඔහුගේ උපරිමය පෙන්වීම ඊට හේතුවයි. ඔහු ලකුණු 14කට කඩුලු 6ක් බිඳ හෙලමින් තරඟයේ වීරයා වූ අතර තරඟයේ ජය කඩුලු 9කින් ශ්‍රී ලංකාවට හිමිවිය. එතැන් පටන් මහරූෆ් කණ්ඩායමට නැතුවම බැරි ක්‍රීඩකයෙක් වූ අතර 2004 - 2016 කාලසීමාව පුරාවටම ඔහු කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කරමින් ජයග්‍රහණයන් රැසකටම දායක විය. මේ අටුවා ටීකා ටිප්පනි කීවේ ඔහුගේ ආදරණීය බිරිඳ සමඟ කතාබහකට මුලපුරන්නටයි. ඉතින්, හස්නා මහරූෆ්, ෆර්විස් ගැන අපිට කී කතාවයි මේ...



# එදා එයාට තාත්තාගෙ මිනිය බලන්න වුණේ වීඩියෝ කෝල් එකකින්

## ෆර්විස් මහරූෆ්ගේ බිරිඳ හස්නා මහරූෆ්

**සුපිරි ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් වුණාම ඒක ඔබට කොයි වගේ හැඟීමක්ද?**

ඒ හැඟීම වචන කරන්න හරි අමාරුයි. ෆර්විස් මහරූෆ් අවුරුදු ගණනාවක්ම ශ්‍රී ලංකා කණ්ඩායමට ක්‍රීඩා කළා. ඒ හැමවෙලේම එයා හිතුවේ රට දිනවන්න. එහෙම බැලුවම තමන්ටත් වඩා රට ගැන හිතපු මහරූෆ් වගේ ක්‍රීඩකයෙකුගේ බිරිඳ වෙන්න ලැබුණු එක ගැන සතුටුයි.

**හස්නාට මහරූෆ් මුණගැහුනේ කොහොමද?**

මං කොළඹ වැල්ලවත්තේ. මහරූෆ් මාලිගාවත්තේ. කොහොමහරි මහරූෆ්ලා අපේ අම්මගේ පැත්තෙන් නෑදෑයෝ වුණා. ඒ නෑදෑකම උඩ ආපු විවාහ යෝජනාවකින් තමයි එයා මට මුණගැහුනේ.

**ඉතින් යෝජනාව ආපු ගමන් එයාට කැමතිවුණාද?**

(සිනාසෙමින්) එහෙම එකපාරට කැමති වෙන්නේ නෑනේ. මමත් මුලින් යාළුවෙක් වගේ හිටියා. ඒ ඉද්දි තේරුණා එයා හොඳ ගතිගුණ තියෙන කෙනෙක් කියලා. ඊටපස්සේ තමයි කැමතිවුණේ. කොහොමහරි අවුරුදු 3ක ප්‍රේම සම්බන්ධයකින් පස්සේ 2009 අපි විවාහවුණා.

**එහෙම විවාහ වෙන්න කලින්ම එයා ජාතික කණ්ඩායමට තේරුණා නේද?**

ඇත්තටම අපි මුණගැහෙන්නත් කලින් ඉඳන්ම එයාට ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න අවස්ථාවක් ලැබිලා තිබුණේ.

**දැන් දෙන්නා විවාහවෙලා අවුරුදු 14ක්. එදා ගත්ත තීරණය හරි කියලා හිතෙනවාද?**

මට හිතෙන විදියට මං ජීවිතේ ගත්ත හොඳම තීරණය ඒක.

**දැන් මහරූෆ් එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

මේ වෙනකොට අපිට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ලොකු දුවට වයස අවුරුදු 13යි. පුතාට අවුරුදු 10යි. මහරූෆ් මේ වෙනකොට ක්‍රිකට් පිටියෙන් සමුඅරන් ක්‍රිකට් විස්තර විචාරකයෙක් විදියට කටයුතු කරනවා. මං නම් පෙරපාසල් ගුරුවරියක් විදියට කටයුතු කරනවා.

**හස්නා ක්‍රිකට් ප්‍රේක්ෂිකාවක්ද?**

මහරූෆ් හම්බෙන්න කලින් නම් මං මැච් බැලුවේ නෑ. ඒත් එයා හම්බුණාට පස්සේ නිකන්ම ක්‍රිකට් ප්‍රේක්ෂිකාවක් වුණා.

**මහරූෆ් ගැන අමතක නොවෙන ක්‍රිකට් මතකයක් හස්නාට තියෙනවද?**

මහරූෆ්ව මේ තැනට ගේන්න එයාගේ තාත්තා තමයි සෑහෙන මහන්සි ගත්තේ. ඒත් එයාගේ හොඳම කාලේ තාත්තා හදිසියේ නැතිවුණා. ඒ වෙද්දි මහරූෆ් මැච් එකකට බටහිර ඉන්දීය කොදෙව් ගිහින් හිටියේ. ඉතින් මළගෙදරට එන්නවත් එයාට ලැබුණේ නෑ. ඒ අවස්ථාව ෆෝන් එකෙන් තමයි එයාට පෙන්නුවේ. අදටත් එයා ඒක සංවේදීව මතක් කරනවා. අනික් මතකය තමයි එයා ක්‍රිකට්වලින් සමුගන්න තීරණය කරපු එක. එදා මහරූෆ් කොච්චර ලොකු වේදනාවකින්ද හිටියේ කියලා එයාගේ මූණෙන් පෙනුණා.

**මහරූෆ් ක්‍රිකට් පිටියෙන් සමුගත්තා කල්වැඩියි කියලා හිතිලා නැද්ද?**

නෑ. මං හිතන්නේ එයා හොඳම වෙලාවේ තමයි සමුගත්තේ.

**ඔයත් එක්ක නම් එයා ක්‍රිකට් ගැන කතා කරන්නේ නැතිලු නේද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. හැබැයි යාළුවෝ හම්බුණාම නම් කතා කරන්නේ ක්‍රිකට් ගැනම විතරයි. ඒ වගේ වෙලාවට ක්‍රිකට්වලින් තොර ලෝකයක් මහරූෆ්ට නෑ.

***මහරූෆ්ට ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර තාමත් ඉස්සර වගේද?**

ඒවායේ නම් කිසිම වෙනසක් වෙලා නෑ. දැන් එයාට ප්‍රේක්ෂක ප්‍රතිචාර වැඩිද කියලත් සමහර වෙලාවට මට හිතෙනවා.

**මහරූෆ් ඇරුනම හස්නා කැමතිම ක්‍රිකට් ක්‍රීඩකයා කවුද?**

ඉන්දියාවේ මහේන්ද්‍ර සිං දෝණිට කැමතියි. මොකද එයා හැම අතින්ම දක්ෂයෙක්.

**දෙන්නගෙන් කවුරුත් වයසට යන්නැත්තේ මොකද?**

(සිනාසෙමින්) එහෙම අහන්න ලැබීමත් සතුටක්. ඇත්තටම අපි අපිව ආදරෙන් බලාගන්නවා. ඒක තමයි රහස. අනික තමයි අපි පුංචි දෙයින් පවා සතුටුවෙන දෙන්නෙක්. නිතරම කැමති හිනාවෙලා ඉන්න. මහරූෆ් වුණත් ජාතික කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කළා කියලා කවදාවත්ම ආඩම්බරවෙලා නෑ.

**මේ වෙනකොට අපේ හිටපු ක්‍රිකට් ක්‍රීඩකයෝ පවුල් පිටින් ලංකාව අතෑරලා ගිහින්. මහරූෆ් පවුලට එහෙම අදහසක් නැද්ද?**

ඇත්තටම අපේ තුන්හිතකවත් එහෙම අදහසක් නම් නෑ. මොකද මට මහරූෆ්ට දෙන්නටම අපේ ලංකාව තරම් ලස්සන රටක් තවත් නෑ. ඉතින් එහෙම රටක් අපි දාලා යන්නේ කොහොමද?

■ රුවන් එස්.සෙනවිරත්න





# මම වගේ කෙනෙක්ව විහිළුවට අරගෙන ඔයාට මොනවද ලැබුණේ?



ධනු සිටියේ නේවාසිකාගාරයේ මිතුරියන් සමඟ සිනාසෙමිනි. ඊළඟ මොහොතේ සිදුවන්නට යන දේ ගැන හාන්කවිසියකවත් අවබෝධයක් නොවූයෙන් ධනු බොහෝ සැහැල්ලුවෙන් විහිළු තහළු කරමින් සිටියාය.

ඒ අතරතුර දෙරට හෝ තට්ටු නොකර එක් අයෙකු දෙර හැරියේය.

**"මාලිකා... මොකද බං යකෙක් ගහලා වගේ බයවෙලා?"** ධනුගේ එහා පැත්තේ ඇඳේ මුණින් අතට වැටී සිනාසෙමින් සිටි මිතුරිය සිනහව නවතා ඇසුවේය.

**"අලුත් බැජ් එකේ අමේෂ්..."**

**"ආහ් නෝන්ජලයා.. ඌ ඊයේ ගෙදර ගිහින් නේද ඊයේ අපෙන් අවසර ගන්නෙ නැතුවම?"** ධනු ඇසුවාය. .

**"ගෙදර ගිහින් ආපුදෙන්කෝ."** තවත් මිතුරියක් පැවසුවාය.

**"ආයෙ එන එකක් නැහැ."** කාමරයට එබී සිටි මාලිකා පැවැසුවාය.

**"ඇයි එහෙම කියන්නේ?"**

**"ඌ එ.ල්.ලිලා ලු."**

**"මොකක්? මොකක්ද උඹ කිව්වේ?"** ධනු විමසුවේ ඇඳෙන් නැගිටින ගමන්.

**"ඔව්. ඌ බෙ..ල්..ලේ වැල දාගෙනලු. මාර කේස් එක. කැම්පස් එකටත් ලැජ්ජාව."** කියූ මාලිකා හැරී යන්නට ගියාය.

**"ඒ මොකක්ද බං ඒ වුණේ?"** ගල් ගැසී සිටි ධනුගෙන් තවත් මිතුරියක විමසුවාය.

**"මොකක්ද දන්නේ නැහැ හේතුව?"** ධනු තමාටම කියාගත්තාය.

ඊළඟ දිනයේ අමේෂ්ගේ මරණය සියලුදෙනාගේ මාතෘකාව බවට පත්වී තිබුණි. ඒ මරණයට හේතු වූ කාරණා අතර තමුන්ගේ නමද ලියැවී ඇති බව ධනු දැනගත්තේ මිතුරන්ගෙනි.

අමේෂ් සියදිවි හානිකරගැනීමට පෙර ලියූ අවසාන ලිපිය සමාජ ජාලාවල වේගයෙන් සංසරණය වෙමින් තිබිණි. ඒ ලිපියේ මෙසේද සඳහන් වී තිබුණි.

'මට කවුරුවත් කවදාවත් ආදරේ කළේ නැහැ. මම ඉපදෙද්දීම අම්මත් නැතිවුණා නිසා හැමෝම කිව්වේ මම අවාසනාවන්තයි කියලා. ආච්චි මගේ මූණවත් බැලුවේ නැහැ. මගේ කෙල්ලව මරාගත්තු අවාසනාවන්තයා කියලා ආච්චි දෙස් කිව්වා. තාත්තත් මාව ගණන් ගත්තේ නැහැ. තාත්තා ආදරේ ලොකු අයියට. තාත්තටත් මා එක්ක තරහ ඇති මම ඉපදෙද්දී අම්මා නැතිවුණා නිසා.

මට උදව් කළේ ඉස්කෝලේ සන්ධ්‍යා මිස් විතරයි. හොඳට ඉගෙනගන්න, එතකොට ඔක්කොම ප්‍රශ්න විසඳෙයි කියලා කිව්වේ ඒ මිස් විතරයි. එත් ඒ මිස් වෙන ඉස්කෝලෙකට මාරු වුණාම මාව ආයෙමත් කඩාගෙන වැටුණා. එත් ඉගෙනගන්න ඕනේ, විභාගේ පාස්වෙන්න ඕනේ කියන කාරණේ විතරක් හිතේ තියාගෙන මම පාඩම් කළා.

මේ අතරේදී තමයි ඉස්කෝලේ ගෑනු ළමයෙක් මට කැමති බව කියලා පණිවිඩයක් එව්වේ. ඒ ළමයාට මගේ අකමැත්තක් තිබුණේ නැහැ. එත් මට බය හිතුණා අපි සම්බන්ධයක් ඇති කරගත්තොත් විභාගයට බලපෑමක් වෙයි කියලා. මම එයාට කිව්වා උසස් පෙළ ඉවර වෙලා අපි යාළු වෙමු කියලා. අපි ඉස්කෝලෙදි හොරෙන් හිනාවුණා. මගේ හිතේ බලාපොරොත්තු ගොඩගැහුනා. විභාගය ඉවර වෙලා එයා එක්ක කතා කරන්න හදද්දී එයා කිව්වා ටියුෂන් පන්තියේදී එයාගෙන් කැමැත්ත අහපු කෙනෙක්ට එයා කැමැත්ත දුන්නා කියලා. මම ආයෙමත් කඩාගෙන වැටුණා.

රිසාල්ට් එනකම් ගෙදර ඉන්න එක මට අපායක් වගේ දැනුණා. කොච්චර වැඩ කළත් වැරදියි. අමතර ආදායමක් විදියට දෙල් බැදලා කඩවලට දාන්න හැදුවා. එත් ගෙදර අය බැන්නා පවුලේ නම්බුව කන්න හදනවා කියලා. ජොබ් හෙව්වා ගෙදරින් ඈතටම යන්න හිතාගෙන. එත් හරි හමන් ජොබ් එකක් ලැබුණේ නැහැ. ඒ අතරේදී තමයි කැම්පස් තේරුණා කියන ලියුම මට ආවේ.

ඒත් කැම්පස් එක මම හිතුව තරම් සුන්දර තැනක් වුණේ නැහැ. ඒක හරිම දරුණු තැනක්. මෙහෙම ගියොත් නම් මට මගේ හීන ඉෂ්ට කරගන්න ලැබෙන එකක් නැහැ. මෙයාලා මට ලෙක්චර්ස් යන්න දෙන්නේ නැහැ. හැමතිස්සෙම බනිනවා. මාව වැඩියෙන්ම සමච්චල් කළේ කැටී කියන අක්කා. ඔයාට කිසිම වරදක් නොකරපු මට ඔයා මෙහෙම වද දුන්නේ ඇයි අක්කේ? ජීවිතේ එපාම වෙලා ඉඳලා අමාරුවෙන් ආගම දහම ගැන හිතලා හිත හදාගෙන ජීවත්වෙන්න උත්සාහ කරපු මට ජීවිතේ එපාම කළේ ඔයයි අක්කේ. ඔයා මගේ අතීත කතා කිසිම දෙයක් දන්නේ නැහැ. මගේ මානසික පීඩනය ගැන ඔයා දන්නේ නැහැ. මම කොයිතරම් හිතෙන් දුක් විඳපු ළමයෙක්ද කියලා ඔයා දන්නෙ නැහැ. මම වගේ කෙනෙක්ව විහිළුවට අරගෙන ඔයාට මොනවද ලැබුණේ? මිනිස්සු ඉස්සරහා රැග් කරලා?'

සමාජ මාධ්‍ය හරහා කැටී නොහොත් ධනුව පතුරු ගසන්නට පටන්ගෙන තිබිණි. කැටී කියන්නේ කවුරුන්දැයි සොයාගත යුතු යැයි බොහෝදෙනෙක් මත පළ කර තිබුණි. ධනු සිටියේ පශ්චාත්තාප වෙමිනි.

**"එච්චර හිතන්න එපා බං. ඌ මානසික ලෙඩෙක්. දැන් ඔය අනිත් එවුන් රැග් වුණේ. උන් මැරුණාද?"**

**"අනිත් එක හොඳ වෙලාවට ඌ ලියුමෙ ලියලා තියෙන්නෙ කැටී කියලා. ඒක උඹගෙ කාඩ් එක නිසා අවුලක් නැහැ. විශ්වවිද්‍යාලයේ පරිපාලනය දැනගත්තත් ඒක ඔප්පු කරන්න බැහැ. බය නැතුව හිටපන්."** ධනුගේ මිතුරියන් ඇයව සනසන්නට උත්සාහ කළෝය.

**"ඒත් මට මහා කළකිරීමක් දැනෙනවා. ඔව් අපි රැග් කරපු අනිත් අය මැරුණේ නැහැ තමයි. ඒත් ඒකෙන් කියවෙන්නෙ නැහැ මම හරි කියලා. අමේෂ් දුර්වල ඇති. එයා මුහුණ දීපු ප්‍රශ්න එක්ක එයා මානසික රෝගියෙක් වෙලාත් ඇති. ඒත් ඒකෙන් කියන්නේ මට එයාට මැරෙන්න හේතු හදලා දෙන්නවත්, එයාව මරන්න ලයිසන් එකක් ලැබුණා කියලාවත් නෙවෙයිනෙ. මට මේක තේරුම් ගන්න කල් ගියා. මානසිකව දුර්වල වෙච්ච කෙනෙක්ට අපි කරන්න ඕනෙ උදව් කරන එක. ඒත් මම කළේ එයාට ජීවිතේ එපාවෙන තත්ත්වෙට පත්කරපු එක. කාගෙන් බේරුණත් මගේ හෘද සාක්ෂියෙන් මට බේරුමක් නැති වේවි."** ධනු තමාටම කියා ගත්තාය.

■ **සමාධි ඩයස්**



**මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි**

# අනේ පනේ කියන පිරිමි තමයි ලොකුම ඇණේ

ප්‍රංශ ජාතික ලේඛක ගුෂ්ඨාවෝ ෆ්ලෝබෙයාගේ නවකතාවක් තියෙනවා එමා බෝවාරී කියලා. ඇය විවාහවෙලා හිටියේ ඉතාමත් ධනවත් වෛද්‍යවරයෙක් එක්ක. හැබැයි මේ වෛද්‍යවරයාට ඔහුගේ කාර්යබහුලත්වයත් එක්ක ඇය ගැන හොයන්න බලන්න වෙලාවක් තිබිලා නැහැ. ඒ ගැන එමාට තිබිලා තියෙන්නෙ දැඩි හිත කළකිරීමක් සහ තරහක්. ඔහොම කාලයක් යනකොට එමා රැඩෝල් කියලා කඩවසම් තරුණයෙක් එක්ක අනියම් ඇසුරක් පවත්වන්න ගන්නවා.

එමා නොදැන හිටියට මොකද රැඩෝල් කියන්නෙ ඒ තරම් හොඳ මිනිහෙක් නෙවෙයි. දන්න මායම් සේරම දාලා කපටිකමෙන් මුදල් ගරාගන්න සෙල්ලක්කාරයෙක්. අනික කතාවේ හැටියටත් එමා කියන්නෙ රැඩෝල්ගේ එකසිය එක්වැනි පෙම්වතිය. ඔහු අනිත් ගෑනුන්ට විදියටම එමාගේ ජීවිතයට ළංවෙන්නෙත් ඇගේ සල්ලිකාර සැමියාගේ දේපල ඩැහැගන්න මිසක ඇයට තිබුණ ආදරේකට හෙම නෙවෙයි. දවසක් රැඩෝල් ඇයට මෙන්න මෙහෙම ලියනවා.

මගේ සුරංගනාවිය එමා,

ඔයා තරම් ලස්සන කෙල්ලෙක් මං කවදාවත් දැකලා නැහැ. ඔය කතා කරන ඇස් මතක් වෙන වාරයක් ගානේම මාව පිස්සු වැටෙනවා. ඔය දඟකාර කතාවයි, හුරතල් හිනාවයි මට කවදාවත් අමතක කරන්න බැරිවෙයි. කොටින්ම ඒ නිසා මම හැමදාම රෑට ඔයාගේ ගේ ඉස්සරහට ඇවිත් උදේ එළිවෙනකම්ම පාරේ වාඩිවෙලා ඉන්නවා. මම දැනටමත් දුර පළාතක මල්වතු, දියඇලි ළඟ තියෙන ලස්සන තැනක අපිටම කියලා ගෙයක් හදන්න පටන් අරගෙනත් ඉවරයි. පුළුවන්තරම් ඉක්මනට මම ඔයාව මගේ ළඟට ගන්නවා. එතකන් ඉවසන්න.

මේ ඔයාගෙම රැඩෝල්

ඒ වෙනකොටත් එමා හිටියේ රැඩෝල්ගේ මායම්වලට හොඳටම අහුවෙලා. කොටින්ම කියනවා නම් මේකා ඔය කියන විදියට හැමදාම රෑට ඇවිත් ගේ ළඟ පාරේ ඉන්නවද කියලා බලන්නවත් මේ මෝඩිට කිසිම උවමනාවක් තිබුණේ නැහැ.

අන්තිමට එමා සැමියට හොරෙන් ඔවුන්ගේ දේපල පවා විකුණලා රැඩෝල්ට සල්ලි දෙනවා. දෙන්න පුළුවන් සේරමත් දීලා අන්තිමට ඔවුන් ජීවත් වුණ ගේත් උකසට තියලා සල්ලි දෙනවා. රැඩෝල් කියන්නෙ වංචාකාරයෙක් කියලා එමාට තේරෙන්නේ ගේ වෙන්දේසි කරන්න බැංකුවෙනුත් ආවට පස්සෙ. අන්තිමට ඔය කතාව කෙලවර වෙන්නෙ එමා බෝවාරි වහ බීලා දිවි නහගන්න තැනින්.

මුලින්ම ඔය කතාව ටිකක් මතක් කරලා හිටියේ අද අපි කතා කරන්නෙත් පිරිමින්ගේ මායම් ගැන නිසා.

අද කාලේ ගෑනුන්ගේ හැටහතර මායම ගැන කතා නොකර පිරිමියෙක් නැති තරම්නේ. මොකද සමහරක් පිරිමි ගොඩක් වෙලාවට ගෑනු මොන දේ කළත් කට ගත්තු ගමන් කියන්නේ ඕවා ඕකුන්ගේ මායම් කියලානේ. ගෑනුන්ගේ ඔය මායම් හැට හතරක් ගැන කියලා තියෙන්නේ ඒ කාලේ හිටපු සෘෂිවරු කියලයි කියන්නේ. ඒ ඇත්තෝ ඔය හැටහතර මායම ගැනලා තියෙන්නෙ ගෑනුන්ගේ දේහ ලක්ෂණ පිහිටලා තියෙන විදිය අනුවලු.

හැබැයි ඉතින් ඒ කියන විදියට ගෑනු කරබාගෙන හිටියත්, උඩ බලාගෙන හිටියත් පිරිමින්ට ඒක මායමක්. වැඩි හොඳට ගුණ අගුණ කිව්වත් ඒකත් මායමක්. මනුස්සකමට හිනා වුණා වුණත්, නොහොබිනා දේකට රැවුවත් ඔය සේරම මායම්.

> **සේසතම දැන් දෙන එමා බෝවාරිලා වගේම ගැහැනුන්ගේ සේසතම සූරා කන රැඩෝල්ලත් අපි අතර ඕනතරම් ඉන්නවා**

එහෙම බලනකොට ගෑනු කියන්නෙම තනිකර මායමක් කියලත් කෙනෙකුට හිතෙන්න පුළුවන්. හැබැයි ඔය කියන දේහ ලක්ෂණ දැන් ඉන්න පිරිමින්ටයි ඒ කාලේ හිටිය උන්දැලටයි තිබිලා නැද්ද? ගෑනු මෙච්චරකල් අත්පුඩි ගහලා තියෙන්නෙ තනි අතින්ද?

ඒ ගැන ඇහුවම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා කිව්වෙ මෙන්න මෙහෙම කතාවක්.

ඔය සෘෂිවරු කියලා තියෙනව විදියට ගෑනුන්ට තියෙන්නේ මායම් හැට හතරයිනේ. ඒ හැටහතරත් ඒ උන්දැලගේ ශරීරයේ ලාලිත්‍යත් එක්ක හැදිලා තියෙන දේවල්. හැබැයි ඉතින් ඔය කියන දේවල් ඇත්තනම් ගෑනු හැමෝගෙම නම් විතරක් වෙනස් වෙලා උන් හැමෝම එකම විදියේ ජීවියෝ වෙන්න ඕනෙ. ඒක එහෙමනම් අඩුමතරමේ පිරිමින්ට පොදුවේ ගෑනු සතා මෙහෙම එකෙක් කියලා තේරුම්ගන්න පුළුවන් වාසියවත් තියෙනවා.

හැබැයි ජනශ්‍රැති පර්යේශකයෝ කියන විදියට පිරිමින්ගේ මායම් කාලෙන් කාලෙට වෙනස් වෙනවා. ඒක නිසා කවුරුහරි කෙනෙක් මගෙන් පිරිමි මායම් ගැන ඇහුවොත් මම නම් කියන්නේ උන්ගේ මායම් තාම ගැනලා ඉවර නැති නිසා ඒවා අසංඛෙයියයි කියලා. මුලින්ම ඔය ගෝත්‍රික යුගවලදි පිරිමියා ගෑනු වශී කරගන්න යොදාගෙන තියෙන එකම මායම උන්දැලගේ පුරුෂ ශක්තියලු. ඒකනේ ඒ කාලේ ගමක උත්සවයක් සැණකෙළියක් එහෙම තිබුණොත් පිරිමි ඒවට ගිහින් හරි හරියට අංකෙළිය, කොට්ටපොර, පොරපොල් ගැසීම වගේ ක්‍රීඩාවල යෙදිලා තියෙන්නෙ. ඒකටත් හරියන්නම ගෑනුත් එකෙකුට එකෙක් හොරෙන් ඒවා බලන්න ගිහින් තියෙන්නෙත් ගමේ ඉන්න නියම පිරිමියා මොකාද කියලා දැනගන්නලු. ඒ විතරක් නෙවෙයි ඒ කාලේ පිරිමි සූසැට කලාව ප්‍රගුණ කරලා තියෙන්නෙත් ගෑනු මායම් කරගන්නලු.

ඊටපස්සෙ එකදාස් නවසිය පනහ අසූව වගේ කාලෙ වෙනකොට පිරිමි ගෑනුන්ව දැලේ දාගන්න පුංචිපහේ මායම් ටිකක් පාවිච්චි කරලා තියෙනවා. ඒ තමයි ගෑනුන්ගේ කකුල් පාගන එක, උන්දැලට පේන්න තොල් පටවල් විකාගන්න එක, ගෙදර ගෑනි සලකන්නෙ නෑ කියලා හිත ගිය ගෑනිට දුක කියන එක, ඇස් හීන් කරන එක වගේ දේවල්. ඒ ගැන කියන්න ගියොත් තවත් ඕනතරම් කියන්න පුළුවන් නිසා මං ඔය කිව්වෙ ටිකක් විතරයි.

හැබැයි දැන් කාලේ පිරිමින්ගේ මායම් ඊට වඩා ටිකක් බ්‍රෑන්ඩඩ්. මොකද අද කාලේ කෙල්ලෝ දන්නවා තොල්පටවල් හපන්නයි, කකුල් පාගන්නයි, ඇස් හීන් කොරන්නයි දක්ෂ වුණාට ආර්ථික හයියක් නැති පිරිමියෙක්නම් වැඩකට නෑ කියලා. ඒක නිසා දැන් ඉන්න කෙල්ලෝ ඒ මායම්වලට අහුවෙනවා අඩුයි. හැබැයි ඉතින් නිකමටවත් කොල්ලෙක් ළඟ බ්‍රෑන්ඩඩ් ඔරලෝසුවක්, වාහනයක් එහෙම තිබ්බොත් ඒ ගැන නම් ටිකක් විතර සලකලා බලන්න ඉඩ තියෙනවා. කොල්ලොත් ඒ ගැන දන්න නිසා උන් කරන්නෙත් කෙල්ලෙක් පස්සේ යන්න කලින් ඔය දේවල් අනුන්ගෙන් හරි ඉල්ලගන්න එක.

අන්න ඒකයි මම කතාව පටන්ගන්නකොට මුලින්ම කිව්වෙ පිරිමින්ගේ මායම් අසංඛෙයියයි කියලා. මොකද දැන් අපි කතා කරපු දේවලුත් එක්ක බලනකොට උන්ගේ මායම් කාලෙන් කාලෙට අලුත් වෙනවා. කොටින්ම කිව්වොත් මොඩ් වෙනවා. ආන්න ඒ නිසා ගෑනුන්ගේ මායම්වලට වඩා වෙනස්වෙනසුළු පිරිමි මායම් භයානකයි කියලයි මට හිතෙන්නේ.



■ ලිහිණි මධුෂිකා

# කොහොඹ නොබොන එක නොහොඹිනා වැඩක්



ඉන්දියානු ජනකතාවකට අනුව බොහොම ඉස්සර කළු මිනිස්සු විතරක් ජීවත්වුණු ගම්පළාතක් තිබිලා තියෙනවා. පාටින් මිනිස්සු මනින උදවිය ඔය කාලෙත් ඉඳපු නිසා මේ ගමේ අය නිතරෝම වගේ පිටගම්වල උදවියගේ විහිළු තහළුවට ලක්වුණාලු. ඉතින් ගමේ උදවිය ඉඳලා තියෙන්නේ පශ්චාත්තාපෙන්. ඔහොම ඉන්දැද්දි දවසක් මේ ගමට බොහොම බුද්ධිමත් සෘෂිවරයෙක් ඇවිල්ලා. ගමේ හැමෝම වගේ සොවින් ඉන්න බව වටහගත්තු සෘෂිවරයා එක්කෙනෙක්ට දෙන්නෙක්ට කිට්ටු කරලා දුකට හේතුව අහලා බැලුවාලු.

**"ඕකට මම විසඳුමක් දෙන්නම්. මම මේ කියන දේ ඒ විදියටම කරන්න. ඔයාලා හරියටම ඒක කරලද බලන්න තව මාසෙකින් ආයෙත් මම එනවා."**

ඔය විදියට ගමේ උදවියට රහසකුත් කියලා දීලා සෘෂිවරයා යන්න ගියාලු. ඒ කරලා ආයේ මාසෙකින් ගමට යද්දි මෙන්න කලින් කළුවට හිටපු මිනිස්සු පැහැපත් වෙලා බබළනවලු. කලින්ද සෘෂිවරයා ගමේ උදවියට කියාදීපු රහස මේන් මේකයි.

**"ගමේ හැමෝම හැම උදේම නොකඩවා හිස් බඩට කොහොඹ කොළ යුෂ ස්වල්පයක් පානය කරන්න. එතකොට බලාගෙන ඉන්දැද්දි එළිය වැටේවි."**

ඉන්දියාවේ මිනිස්සු සම පැහැපත් කරගන්න කොහොඹ පාවිච්චි කරන්න ගත්තේ එයින් පස්සෙ කියලයි කතාවට කියන්නේ. ලේඛන අනුව ගත්තත් ඉස්සල්ලාම ඖෂධයක් විදියට කොහොඹ පාවිච්චි කරලා තියෙන්නේ ඉන්දියානුවෝ. කොහොඹ කියන්නේ අදටත් ඉන්දියානු කාන්තාවන්ගේ ප්‍රධාන රූපලාවණ්‍ය අමුද්‍රව්‍යක්. උදේ අවදිවෙච්චි හැටියේ පුරුද්දට කොහොඹ ගුලි, යුෂ පානය කරන කාන්තාවෝ අදටත් එහේ ඉන්නවා.

ඉන්දියාවට විතරක් නෙමෙයි කොහොඹ එක්ක හා වෙච්චි ඉතිහාසයක් අපිටත් තියෙනවා. කොහොඹ කියන්නේ නොම්මර එකේ විෂබීජනාශකයක් කියලා ඉස්සර ඉඳලා අපේ ඇත්තෝ දැනගෙන හිටියා. ගෙදර කෙනෙක්ට බෝවෙන ලෙඩක් හැදිච්ච හැටියේ ඒ උදවිය උළුවස්ස ඉස්සරහින් කොහොඹ අත්තක් එල්ලුවේ ඒකයි.

හැබැයි ඉතින්,

**'කොහොඹ රුකේ මල් පිපුණාට**
**මී මැස්සා රොන් ගනීද?'**

කියලා පරණ කවියක් තියනවා. ඒකෙන් කියන්නේ වටිනා යමක ප්‍රයෝජන නොදන්නා උදවිය ඒ දෙයින් ප්‍රයෝජන ගන්නේ නැහැ කියන එකටනේ. විෂබීජනාෂක ගුණය ඉහළින්ම තියෙන නිසා කුරුලෑවලට, ලපවලට කොහොඹ පංකාදු වුණත් ගෙදර මිදුලේ කොහොඹ ගස් තියාගෙන අපේ මී මැස්සියෝ යන්නෙම සමට අහිතකර දේවල් පස්සෙනේ. හැබැයි මේ ලිපිය කියෙව්වට පස්සේ නම් ඒ කතා වෙනස් වෙයි කියලයි අපිට හිතෙන්නේ.

ඉන්දියානුවෝ කොහොඹවලට කියන්නේ 'සර්ව රෝග නිර්වාරිණී' කියලා. සියලු රෝගවලට කොහොඹ ගුණ නිසයි ඒ නමින් අමතන්නේ. කොහොඹවල ප්‍රතිඔක්සිකාරක කිහිපයක්ම තියෙනවා. මේ ගුණ නිසා සම රැලි වැටීම පාලනය කරන්න පුළුවන්. සම පැහැපත් කරන්නත් ප්‍රතිඔක්සිකාරකවලට පුළුවන්. ඒ වගේම කොහොඹවල විටමින් E බහුලයි. කුරුලෑ ලප, අව් ලප ඉක්මනින්ම ඉවත් කරන්න විටමින් E උදව්වක්. මෙච්චයේ විෂබීජනාෂක නිසා කුරුලෑ හොඳ වෙනවා කිව්වනේ. ඒ වගේම තමයි සමේ ඇතිවෙන දද, කුෂ්ඨ, හොරි රෝගවලටත් කොහොඹ සාරය පංකාදුයි. කොහොඹ ප්‍රයෝජනයට අරන් ලස්සන වෙන්නේ කොහොමද කියලා දැන් බලමු.

මුලින්ම අපි බලමු කොහොඹවලින් කරගන්න පුළුවන් කුරුලෑ සත්කාර. කුරුලෑ ලප තියෙන උදවියටත් මේ සත්කාර පාවිච්චි කරන්න පුළුවන්.



- හොඳ ළපටි කොහොඹ කොළ ටිකක් හොයාගන්න. නැවුම් අමුකහ කෑල්ලකුත් ඕනේ. කහ කෑල්ලයි, කොහොඹ කොළ ටිකයි හොඳට අඹරන්න. කොහොඹ ගෑවහම සමහරුන්ට සම දන්න ගන්නවා. ඒ නිසා හදපු ගමන්ම පැක් එක ගාන්නේ නැතිව විනාඩි 10ක් විතර තියන්න. එතකොට කොහොඹවල සැර ගතිය අඩු වෙනවා. හදගනිපු පැක් එක ඇස් යට නොගා මූණේ ආලේප කරන්න. විනාඩි 20ක් විතර තියලා හෝදලා අරින්න.
- කොහොඹ කොළ ටිකක් උණුවතුරේ දාලා විනාඩි 10ක් විතර තියලා අඹරලා මූණේ ගාන්න. විනාඩි 20ක් තියලා සෝදලා අරින්න.
- වැල්මී කුඩු තේ හැන්දකට මහදුරු කුඩු, මී පැණි, යෝගට්, කොහොඹ යුෂ එක්කාහු කරලා කුරුලෑ ලප තියෙන සමේ ආලේප කරන්න. පැක් එක ගාලා විනාඩි 20ක් තියලා සෝදලා අරින්න.

**පැහැපත් වෙන්න ගාන්න පුළුවන් සත්කාර කිහිපයක් දැන් බලමු.**

- ළපටි කොහොඹ කොළ ටිකක් අරගෙන ඒකට කස්තුරි කහ, මී පැණි, මී කිරි එකතු කරලා සමේ ආලේප කරන්න. විනාඩි 20ක් තියලා සෝදලා අරින්න.
- සම පැහැපත් කරන කොහොඹ පවුඩර් එකක් හදගෙන කාලයක් තියාගෙන පාවිච්චි කරන්න පුළුවන්. ළපටි කොහොඹ කොළ ටිකක් අරගෙන දවසක් විතර අව්වේ වේලගන්න. පස්සේ බ්ලෙන්ඩ් කරලා බෝතලේකට දාගන්න. මේ පවුඩර් එක වතුර, යෝගට්, මී පැණි, රෝස වතුර ඔය ඕනම දෙයක් එක්කලා මිශ්‍ර කරලා සමේ ආලේප කරන්න. බලාගෙන ඉන්දැද්දි සම පැහැපත් වේවි.
- අමු කොහොඹ කොළ ටිකක් අරගෙන බ්ලෙන්ඩ් කරගන්න. මේ වැඩේට පිරිසිදු පොල්තෙල් ටිකකුත් ඕනේ. තෙල් ටික ඩබල් බොයිල් ක්‍රමේට රත් කරගන්න. පස්සේ කොහොඹ කොළ ටික එකතු කරලා හොඳින් රත් කරලා තෙල් ටික බෝතලේකට දාන්න. මූණේ, ඇගේ කළු ලප තියෙනවා නම් මේ කොහොඹ තෙල් ආලේප කරන්න. ඉක්මනින්ම හිසකෙස් වර්ධනය කරගන්න වගේම උකුණු වදෙන් මිදෙන්නත් මේක පාවිච්චි කරන්න පුළුවන්. කොහොඹ තෙල් හිස්කබලේ ආලේප කරලා හොඳින් සම්බාහනය කරලා පැයක් විතර ඉඳලා නාන්න.
- කකුල් පැලුනු කෙනෙක් නම් කොහොඹ කොළ තැම්බුව වතුරේ කකුල් දාගෙන ඉන්න. පැලුම් තුවාල ඉක්මනින් සුවපත් කරන්න කොහොඹවලට පුළුවන්.
- කොහොඹ කොළවලට මුල්තානි මිට්ටි, යෝගට් මිශ්‍ර කරලා මුළු ශරීරයේම ආලේප කරන්න. ඇඟ සේදුවයින් පස්සේ කොහොඹ කොළ තැම්බුව වතුර ටිකකින් ඇඟ සෝදලා ඒක සුළඟින් වේලෙන්න අරින්න.
- ඉන්දියාවේ මිනිස්සු නිතරම කොහොඹ යුෂ බොනවාය කියලා අපි කිව්වනේ. දිනපතාම කොහොඹ යුෂ පානය කරන එක ඒ තරම් ගුණ නැතැයි කියලයි වෛද්‍යවරු කියන්නේ. කොහොඹ පානය කරනවා නම් සතියකට එක පාරක් කොහොඹ යුෂ හැන්දක් පානය කළාම ප්‍රමාණවත්. උණුවතුර කෝප්පෙකට කොහොඹ කොළ 10ක් විතර දාලා හොඳට වහලා තියලා කොහොඹ තේ එකක් හදාගන්න. මේ පානය සතියකට දෙපාරක් බීපුවාම ඇති.
- කොහොඹ කියන්නේ වාතය පවා පිරිසිදු කරන ගහක්. ඉතින් ගේ ඉස්සරහින් කොහොඹ ගහක් හිටෝපුවාම නිවසට සෞභාග්‍යය උදාවෙනවය කියලා ඒ කාලේ විශ්වාසයක් තිබිලා තියෙනවා. අපි අද කියා දීපු කොහොඹ සත්කාර කරලා බැලුවොත් කොහොඹවලින් ගෙදරට විතරක් නෙමෙයි මූණටත් සෞභාග්‍යය උදාවේවි ඕන්.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



# දොස්තර වෙන්න කලින් මුට්ට කරගැහුවා

අතීත කතා හාරවුස්සන්ට අපේ උන්දැලා හරි රුසියෝය. සියලු කෙලෙස් නසා බුදුවුණු ගෞතම බුදුන්ගේ අතීතය හාරවුස්සන්නට උවමනා වූ කාඩ්බෝඩ් වීරයෙකු වරක් මුහුණුපොතේ මෙසේ පාරම් බා තිබෙනු දුටුවෙමි. ‘බුදු වුණත් ඉතින් දරුවෙක් එක්ක ගෑනියෙක් දලා ආපු එකානේ’ බුදු වුණත්, රජ වුණත් යථාර්ථය එයමය. මිනිස්සු ලේසියෙන් ඒ අයවලුන්ගේ අතීතය අමතක කරන්නට සූදනම් නැත.

ඒ ආකාරයටම දෛස්තර මහතෙකුගේ අතීත කතාවකට පහුගිය දෙහක මුහුණුපොතේ තටු ලැබී තිබුණි. තටු ලැබෙන්නට කාරණාව නම් එතුමා වෛද්‍යවරයෙකු වීමට ප්‍රථම මුට්ට කර ගසා තිබීමයි. ඒ කතාව මෙලෙසින් අප ‘ධරණී’ පිටු අතරට ගෙනෙන්නට සිතුවේ මුට්ට කරගැසීම නිසා රිදුම් දෙන ඔහුගේ අතීතය හාරවුස්සන අරමුණින් නොවේ. ඒ නිසා පදම් වූ ඔහුගේ හයිය, ඔබටද හයියක් වනු ඇතැයි හැඟුණු නිසාය.

**“මම ඉපදුණේ මහකනදරාව කියන ගමේ. පවුලේ හිටියේ අම්මයි, අප්පච්චි, මල්ලියි, මමයි විතරයි. අම්මාට රස්සාවක් තිබුණේ නැහැ. අප්පච්චි රස්සාවට කළේ මේසන් වැඩ.”**

අනුරාධපුර සීමාවෙන් ඔබ්බට වන්නට පිහිටි ‘මහකනදරාව’ ගැන කියද්දී අපේ මනෝකාය මුලින්ම ගොස් නතරවෙන්නේ මහකනදරා වැව ළඟය. ඒ වැව්තාවුල්ලේ සුන්දරත්වයට යටින් ප්‍රේමවන්තයින්ගේ දුකත්, අසරණ මිනිස්සුන්ගේ දුඩිය කඳුළුත් සැඟවී ඇති බව නොරහසකි.

මේ පුංචි කොලුගැටයාගේ හිතත් පොතපතේ වැඩට වැඩිපුර නොගියේ ඒ දුකට වැඩිපුර හැටි පදම් වී සිටි නිසා විය යුතුය.

**“මම මුලින්ම ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ අනුරාධපුර යාය දෙක ගැමුණු මහා විද්‍යාලයෙන්. එතකොට හැමෝම මාව උනන්දු කළේ ලොකු ඉස්කෝලෙට යන්න හොඳට ශිෂ්‍යත්වේ පාස් වෙන්න කියලා. ඒ වුණාට ශිෂ්‍යත්වේ නම් පාස් වෙන්න බැරි වුණා.”**

එකට සිටි යහළුවන් ශිෂ්‍යත්ව විභාගය සමත් වී ටවුමේ ඉස්කෝලවලට යද්දි යාය දෙක ගැමුණු මහා විද්‍යාලයේම නතර වෙන්නට ගයාන්ට සිදුවිය. අකුරු කරන්නට ඇති ඇල්ම ටිකෙන් ටික අඩු වෙද්දී හෙතෙම මූර්ති කලාව දෙසට හිත යැව්වේය.

“ඒ දවස්වල ඉස්කෝලේ ඇරිලා ඇවිත් හැමදාම හවසට මම රඹෑව පන්සලට දුවනවා. ඒ කාලෙ රඹෑව පන්සලේ බුදුපිළිම වහන්සේලා නෙළන්න පටන් අරගෙන තිබුණා. මටත් ඉතින් පන්සලට වෙලා කරන්න වෙන විශේෂ වැඩක් තිබුණේ නැති නිසා මම කළේ පිළිම අඹන හැටි බලාගෙන ඉඳපු එක. ඊටපස්සේ හවසට ගෙදර ගිහින් ඒවා තනියම අඹන්න පුරුදු වුණා. කොහොමටත් ඒ වෙනකොට අප්පච්චිගෙන් අහගෙන බදාම ටිකක් එහෙම පදමට අනාගන්න පුරුදු වෙලයි හිටියේ. ඒ නිසා ගෙදරදි මේ වැඩේ කරන්න තවත් ලේසි වුණා.’’


එදා එලෙස ඉගෙනගත් මූර්ති කලාව නිසා අදටත් දෛස්තර ගයාන්ට පිළිම නෙළීමේ අපූරු හැකියාවක් ඇත. කනදරාවැවේ දේවාලේ වැඩසිටින ගණදෙවි පිළිම වහන්සේ ද ඔහුගේ නිර්මාණයකි. කෙසේ හෝ මේ අතරතුර ගයාන්ට රඹෑව මහා විද්‍යාලයට ඇතුළත් වීමට වාසනාව පෑදුනේය. ඒ වාසනාව පිටම රඹෑව මහා විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ කඩයිම ජයගත් ඔහු අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර මහා විද්‍යාලයට ගියේ ජීව විද්‍යා අංශයෙන් උසස්පෙළ හැදෑරීමේ බලාපොරොත්තුව ඇතිවය. නමුත් ඊට පරහක්ද නොතිබුණාම නොවේ.



වෛද්‍ය ගයාන් මූර්ති අඹමින්



මව පියා සමග



බිරිඳ සමග

**“මම උසස් පෙළට ජීව විද්‍යාව තෝරගන්නකොට මුලින්ම අම්මයි තාත්තයි ටිකක් අකමැති වුණා. ඒ වෙන හේතුවක් නිසා නෙවෙයි අමතර පන්තියකටවත් නොයා ගෙදර ප්‍රශ්නත් එක්ක විභාගේ ගොඩදාගන්න බැරිවෙයි කියන බයට. ඒත් මම කොහොමහරි පෙරැත්ත කරලා ඒ දෙන්නාව ඒකට කැමති කරවාගත්තා.**

**අන්තිමට ලොකුම අභියෝගය වුණේ දවස ගානේ ඉස්කෝලේ යන එන එක. මොකද අපේ ගෙවල් ළඟ ඉඳලා ඉස්කෝලෙට දුර කිලෝමීටර් තිහකටත් වැඩිය තිබුණා. හැමදාම යන්න එන්න විතරක් මහපාරටම පැය දෙකක් ගතවෙනවා. ඒත් කොහොමහරි ඉගෙනගෙනම මේකෙන් ගොඩ යනවා කියලා ඒ හැමදේම ඉවසුවා.”**

ඒත් ඔවුන්ගේ ජීවිත නොසිතූ ලෙස පැදුරෙනුත් බිමට වැටුණේ ඔය කාලෙදිමය.

> **එදා මහකනදරාවේ ගාමිණී බාස්ගේ පුතා අද දොස්තර මහත්තයෙක්. එදා අපේ ගෙදරට කට්ටිය කිව්වෙ ගාමිණී බාස්ගේ ගෙදර කියලා. ඒත් අද කියන්නෙ දොස්තර ගයාන්ගෙ ගෙදර කියලා**

**“උසස් පෙළට මාසයක් විතර තියෙද්දී තාත්තා වැටිලා එකතැන් වුණා. ඊටපස්සෙ කරකියාගන්නම දෙයක් නැති තැන අම්මා කුලී වැඩ කරන්න ගියා. එතැන ඉඳලා අම්මා හම්බකරපු කීයකින් හරි තමයි අපි හැමෝම ජීවත්වුණේ.”**

ඒ සියලුම බාධක හමුවේ උසස් පෙළට පෙනී සිටි ගයාන්ට අපේක්ෂා කළ තරමේ ප්‍රතිඵලයක් නොතිබීම නිසා විශ්වවිද්‍යාලයේ දොරටුව වැසී ගියේය.

“ඒ වුණාට මම උත්සාහය අතෑරියේ නැහැ. ඒත් තාත්තත් නැතුව අම්මා ගෙදර ප්‍රශ්න එක්ක ඔට්ටු වෙනවා දකිනකොට මොනවා කරන්නද කියලා හිතාගන්න බැරුව හිටියා. ඒත් කොහොමහරි දෙවැනි පාරත් විභාගේ ලියන්න හිතාගත්තා. ඊටපස්සේ මම පාඩම් කරන ගමන් මිහින්තලේ බඩඉරිඟු ගබඩාවක වැඩට ගියා. එතැන මට කරන්න තිබුණේ කිලෝ පනහේ හැටේ බඩඉරිඟු මුට්ට කරගහන එක. කොටින්ම කියනවා නම් නාට්ටාමි වැඩ. ඒත් මම ඒ වෙලාවේ ඒක කරන්න හිත හදාගත්තා. ඒ ගමන් එතැනම පොත් ටික තියාගෙන ඉඩ ලැබෙන විදියට පාඩම් වැඩ ටිකත් කරගත්තා.”

නමුත් දෙවන වතාවේද සරසවි මෑණියන් ගයාන්ට සරසවි වරම් දීමට කාරුණික වුණේ නැත. නමුත් උත්සාහය අත් නොහැරී ගයාන් තෙවන වතාවේ රජරට වෛද්‍ය විද්‍යාලයට දොරගුලු විවර කරගත්තේය.



වෛද්‍ය ගයාන්

“මම තුන්වැනි පාර උසස් පෙළ ලියලා ප්‍රතිඵල එනකන් ටික කාලයක් මට වගේම අමාරුකම් තිබුණු අසරණ ළමයින්ට අමතර පන්ති කළා. හැබැයි කැම්පස් එකේ වැඩත් එක්ක මට දිගටම ටියුෂන් කරන්න බැරිවුණා. මම ටියුෂන් නතර කළාට ඒ වෙනකොට මම ටියුෂන් ගුරුවරයෙක් විදියට අනුරාධපුරයේ හොඳ නමක් හදාගෙන හිටියා.”


2020 වසරේ වෛද්‍ය විද්‍යාලයේ අවසන් විභාගයද ඉහළින් සමත් වන ගයාන්ට නේවාසික පුහුණුවෙන් අනතුරුව මුල්ම පත්වීම ලැබුණේ අනුරාධපුර ශික්ෂණ රෝහලටය. මේ වනවිට 34 වැනි වියේ පසුවන වෛද්‍ය ගයාන් සෙනවිරත්න අද බොහෝ අභිමානයෙන් යුතුව මෙසේ කියන්නේය.

“එදා මහකනදරාවේ ගාමිණී බාස්ගේ පුතා අද දෛස්තර මහත්තයෙක්. එදා අපේ ගෙදරට කට්ටිය කිව්වෙ ගාමිණී බාස්ගේ ගෙදර කියලා. ඒත් අද කියන්නෙ දෛස්තර ගයාන්ගෙ ගෙදර කියලා. එදා ලෙඩකට දුකකට බෙහෙත් ගන්න විතරක් ඉස්පිරිතාලෙට ගියපු මම අද යන්නෙ දහස් ගාණක් රෝගීන්ව සුවපත් කරන්න කියලා හිතනකොට මට ඇතිවෙන සතුට මෙහෙමයි කියන්න බැහැ. අදටත් මම මගේ අමතර කාලය පුද්ගලික වෛද්‍ය සේවාවක් වෙනුවෙන් යොදවන්නෙ නැහැ. ඒ කාලයත් මම යොදවන්නෙ එදා මම විඳපු දුක අද විඳින අහිංසක දරුවන්ට උගන්නන්න.

මම දැන් ඉන්න තරුණ දරුවන්ට එකම දෙයක් කියනවා. කවදාවත් වාසනාව එනකන් බලාගෙන ඉන්න එපා. ඒ වෙනුවට අවස්ථාවන් හොයාගන්න. අනික දරුවෝ වුණාහම වැඩ කරන්න ඕනේ අම්මා තාත්තගේ නම කිව්වාම තමන්ට ආඩම්බරයක් වෙන විදියට නෙවෙයි. තමන්ගේ නම කිව්වාම අම්මා තාත්තට ආඩම්බර වෙන විදියට.”

ඉස්සර වෛද්‍යවරුන් බිහිවුණේ වලව් පැලැන්තියෙන් පමණි. නමුත් මෑත කාලයේ ගයාන් වැනි දහිරියවන්ත දරුවන් විසින් ඒ ඉතිහාසය වෙනස්කොට ඇත. වෛද්‍ය ගයාන්ගේ කතාවට මුහුණුපොතේ තටු ලැබී ඇත්තේ වෛද්‍යවරයෙකු වීමට පෙර හෝ හෙතෙම මුට්ට කර ගැසූ නිසාය. ඒ වෘත්තීන් දෙක සසඳමින් ඇතැමුන් අමුතු අමන්දානන්දයක් අත්විඳින බව පෙනෙන්නට ඇත. නමුත් වෛද්‍ය වෘත්තීය සේම මුට්ට කරගැසීමද කාහටත් ගෞරවණීය රැකියාවක් බව අවසන සටහන් කොට තැබීමට කැමැත්තෙමි.

■ ලිහිණි මධුෂිකා



# ඒවසරයි

**බියංකා නානායක්කාර ලියයි**

131 කොටස

# අම්මේ... ඔයා දන්නවද... මේ ඉන්නේ තේනුකගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්

සෙනුකා ආපිට හැරී චතුමිණීගේ මුහුණ බැලුවේ ඒ මොහොතේ කටට ආ කේන්තිය වචන කරන්නටය. ඒත් ඇගේ ඇස්වල පැටලුණ ඇස්වල වූයේ දුෂ්ටකමක් නොව අහිංසකකමකි. ඒ නිසා කටට ආ වචන ඇගේ කට තුළ එහෙම්ම ගිලුණෝය. සෙනුකාට ළමාවිය මතක් විය. තේනුක හා මේනක සමඟ මොනවට හෝ දේකට තරහ වෙන ඒ දවස්වල චතුමිණී කරේ එල්ලී විත් නඩු කියනා විට තිබ්බේත් මේ බැල්මය.

**"මං යන්නේ මගෙ යාළුවෙක් බලන්න. එයා මේ දවස්වල ප්‍රෙග්නට්. මං කිව්වා කෑම එකක් අරන් එන්නම් කියලා..."**

සෙනුකා තත්පරේට කල්පනා කර කීවේ හිත් නොරිද ඇය මගහැර මේ ගමන යන්නට ඇති උවමනාව නිසාය.

**"ඉතින් කමක් නෑ. මාත් එන්නම්. අපේ පාටියත් ඉවරයි. දැන් මෙතන වෙන්නෙ වෙන දෙයක්නේ... මටත් කම්මැලියි..."**

චතුමිණී ඒ එන්නට හදන්නේ කම්මැලිකමට නොව මේ යන්නේ තේනුක හමුවන්නට කියා සැකයට බව සෙනුකාට තේරුණි. සෙනෙහෙලතා මැණිකේ විත් ඔවුන් ළඟ නැවතුනේ සිනාවක් නැති මුහුණිනි.

**"ඕන කෙනෙකුට ඕන දෙයක් කරගන්න කියලා බත් ටිකත් අරන් මට මල්ලි බලන්න යන්න හිතෙනවා. අර ලස්සනට කට්ටිය එකතුවෙලා කෑම ටිකක් කාලා යන්න තිබ්බ වැඩේට අප්පච්චි තැබෑරුමකුත් ඇරලා. පොඩි පුතා ගිය එකමයි කාරිය..."**

සෙනෙහෙලතා මැණිකේ සෙනුකාට කීවේ සෙමිනි. ඒ කතාව ඇසුණු චතුමිණී නලියව්වාය.

**"සෙනුකා අක්කා යාළුවෙක් බලන්න යනවලු. අපි දෙන්නා යමු නැන්දම්මේ තේනුක අයියලයි ගෙදර. මටත් මෙතනින් එළියට යන්න ඕනි..."**

සෙනුකා සෙනෙහෙලතා මැණිකේ දෙස බැලුවේ එහෙ නොයන ලෙස කටින් නොකියමිනි. එය නොතේරුණා නම් ඒ ගමන නවත්වන්නට තවත් කාරණයක් ඈ ළඟ තිබුණි. ඒ තේනුකගේ දුරකතනය වැඩ නොකිරීමයි. ඒත් වාසනාවටදෝ සෙනෙහෙලතා මැණිකේට සෙනුකා දෑසින් කී කතාව තේරුණෝය.

**"කටට ආවට කිව්වට ගෙදරට පිට මිනිස්සු ඇවිත් ඉන්න වෙලේ ගෙදරින් මග අරින්න බෑනේ සුදු මැණිකේ. ඔයාට කම්මැලි නම් අම්මයි තාත්තයි එක්ක එළියේ ගිහින් එන්න..."**

සෙනෙහෙලතා මැණිකේ ආදරණීය හඬකින් චතුමිණීට කීවාය. චතුමිණී ඔවුන් කෙරෙන් ඈත්ව ගියේ ඇත්තටම එළියට යන බලාපොරොත්තුවකිනි. නිශ්ශංක රාජපක්ෂ හා සමන්තිනී නොසිටියානම් මේනකත් සමඟ පාර්ලිමන්ට් පිට්ටනියට හෝ ගොස් එන්නට තිබුණා කියා ඇගේ හිත කීවේය. දවස් ගාණකින් සැලෝන් එක නෑරිය නිසා එහි යන්නටද බැරිය. ඇය විසිත්ත කාමරයට යන විට එහි සිටියේ තෙන්නකෝන් බණ්ඩාර මාමාණ්ඩි හා විසෙන්තිආරච්චි ඇමති පමණි. චතුමිණී එහි නොරැඳී එළියට බැස්සේ ගැහැනුන් දෙදෙනා කොහි ගියේදැයි සැක

> **කටට ආවට කිව්වට ගෙදරට පිට මිනිස්සු ඇවිත් ඉන්න වෙලේ ගෙදරින් මග අරින්න බෑනේ සුදු මැණිකේ. ඔයාට කම්මැලි නම් අම්මයි තාත්තයි එක්ක එළියේ ගිහින් එන්න...**

සිතමිනි. මිදුලේ මේනකගේ ජීප් රිය ළඟ වාසුලා හා මේනක තනිව කතා කරමින් හිඳිනු දැක චතුමිණීගේ හිත නොසිතූ ලෙස ගැස්සුණාය. ඈ වටපිට බැලුවේ විසෙන්තිආරච්චි නෝනා සෙවීමටයි. ඇය පෙනෙන මානයක නොවීය. මේනක සමඟ සිනාසෙමින් කතා කරමින් හිඳින වාසුලා දෙස බලා සිටිද්දී චතුමිණීගේ හිතේ සියුම් ඉරිසියාවක් වැන්නක් ඇතිවීගෙන ආවාය. ඇයට ඒ හාම දැනුණේ මේ විසල් බිම ඇය තනිව ඇති බවකි. හිත මත ඇතිකළ පෙළඹවීම නිසාම ඇගේ පා ඔවුන් දෙසට ඇදුණාය.

**"මං ඔයාව හෙව්වා මේනක අයියා..."**

ඔවුන් හමුවට ඇය පැමිණි බව අඟවන්නට සේ චතුමිණී කීවාය. ඒ මොහොතේ වාසුලාගේ මුව දිලුණ සිනාව අතුරුදන් වෙනු චතුමිණී හොඳින්ම දුටුවාය.

**"ඇයි...?"**

මේනක ඇසුවේ චතුමිණී විශේෂයක් කොට නොසලකමිනි.

**"කම්මැලියි අයියෝ... තේනුක අයියත් හදිස්සි වෙලා යන්න ගියා. හැමෝම එක එක්කෙනාගෙ වැඩ. මං තනිවෙලා..."**

ඇගේ කතාවට මේනකට සිනා නැගුණෝය. මේ වෙනද නැති ඇඟෑලුම්කමකි. ඒ වාසුලාට පෙනෙන්නට කියා ඔහුට හොඳින්ම තේරුම් ගියේය.

**"ඉතින් ඔයත් මොනවහරි වැඩක් කරන්න. නැත්තම් ගිහින් ඔයාගේ සැලෝන් එක අරින්න. තේනුකත් ෂොප් එකේ ඇතිනේ. මිනිහව කතාවට අල්ලගන්න. කොහොමත් ඔයාට එයා ඉන්නවනම් අපි ඕන නෑනේ..."**

මේනක තෙන්නකෝන් කපටි මොළය පාවිච්චි කර එක ගලෙන් කුරුල්ලන් දෙන්නෙක් මරා දැම්මේය. ඒ කතාවට චතුමිණී අකමැති නොවුණත් වාසුලාගේ මුහුණ වෙනස් වෙනු චතුමිණී සේම මේනකද දුටුවේය.

**"මාත් ඔය තේනුක දකින්න ආසාවෙන් ආවේ. කෝ අපි එනකොට එයා නෑනේ..."**

වාසුලා කීවේ තේනුක ගැන ඇයත් දන්නා බව අඟවමිනි. ඔවුන් ආ මොහොතේ පටන් කුතුහලයෙන් හා සැකෙන් තිබූ චතුමිණීගේ හිත ඒ කතාවෙන් තවත් අවුල් වුණාය. ඔහු උපන්දින සාදය දමා පැන යාම හොඳ දෙයක් නොවුණත් ඔහු එහෙම කළ එක හොඳයි කියා ඒ මොහොතේ චතුමිණීට සිතුණි.

**"ඒ මොකටද විශේෂයෙන් එයාව දකින්න ආසාවක්..."**

ඈ ගණනක් නැතුව සේ ඇසුවත් හිත තුළ වූයේ තරහකි.

**"මං කිව්වේ... චතු ආස නෑ මල්ලි ගැන වෙන ගෑනු ළමයි හොයනවට බලනවට..."**

මේනක තෙන්නකෝන් එහෙම කීවේ ඔහුගේ වාසියට වුණත් ඒ කතාවට චතුමිණී සතුටු වුණාය. වාසුලාගේ හිත හෙළවුණේ අද මෙවන් ගමනක් එන්නට හේතුවත් ඔහු වීම නිසාය. තාත්තත් අම්මාත් තේනුක ගැන මුලින්ම කතා කළේ කවදදැයි වාසුලාට මතක නැති මුත් ඇගේ විවාහය ගැන කතා කළ හැම අවස්ථාවකදීම ඔවුන් වර්ණනා කළේ තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගේ බාල පුතු තේනුක බණ්ඩාර තෙන්නකෝන් ගැනය. මේනක ගැන කතා කළත් ඔහු ගැන එතරම් පැහැදීමක් ඔවුන් තුළ වූයේ නැත. ඒ නිසා මේ කතාව ඇගේ හිත බිඳ දැම්මේය. ඒත් එහි අගක් මුලක් සොයාගන්නට ගැහැනුකම ඇයව පෙළඹෙව්වාය.

**"ඇත්තටම ඇයි ඒ තේනුක එක්ක වෙන ගෑනු ළමයි කතා කරනවට අකමැති... ඔයා එයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්ද...?"**

වාසුලා කෙළින්ම ප්‍රශ්නය ඇසුවේ ඇයට වටෙන් කතා හුරු නැති නිසාය. චතුමිණීට බැලුනේ මේනක තෙන්නකෝන් දෙසය. ඔහුගේ බැල්ම කීවේ ඔව් කියන්න කියන්නා වැනි ඉඟියකි. ඇය ඒ සැනින් වාසුලා දෙසට නෙතු යොමු කළාය. වාසුලා එක එල්ලේ බලා සිටි බැල්මේ වූයේ උත්තරයක් බලාපොරොත්තුවන නොඉවසිල්ලයි. වචනයක් නොකී චතුමිණී මද සිනා ඇතුව හිස දෙපසට වැනුවාය.

**"මං දැනන් හිටියෙ නෑනේ, ඔයා තේනුකගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා. හැබැයි තෙන්නකෝන් අංකල් දන්නෙත් නෑ නේද..?"**

මේ බොරුව අන්තිමට මේ වහල යට ඉඳීමද නැති කරවයි කියා චතුමිණීගේ හිත කීවේය.ඒ නිසා මේ කතාව තෙන්නකෝන් බණ්ඩාරගේ කනට යෑම වළක්වන්නට ඇයට උවමනා විය. ඒ නිසා මුහුණේ පෙනුම වෙනස් කරගෙන ඇය බයාදු බැල්මක් ලියාගත්තාය.

**"මාමණ්ඩි දන්නෙ නෑ. හැබැයි නැන්දම්මයි, මේනක අයියයි, සෙනුකයි ඔක්කොමලා දන්නවා. මේකනේ වාසුලා, අපි ඇවැස්ස නෑනයි මස්සිනයි. ඒක හින්ද මාමණ්ඩි මේ වගේ දේකට අකමැතිවෙයි කියලයි තාම හංගන් ඉන්නේ..."**

චතුමිණී කීවේ වටපිටද බලමිනි. උද්‍යානයේ මිදුල දෙසට ඇති පිවිසුම් දොරින් සමන්තිකා රාජපක්ෂ සමඟ කතා කරමින් එන විසෙන්තිආරච්චි නෝනා ඇයට පෙනුණි. ඔවුන් දෙදෙනා කතා කරමින් ආවේ මේනකත් තරුණියන් දෙදෙනාත් සිටි තැනටය. වසුලාගේ මුහුණේ මුලින් තිබූ පිපුණු බව අතුරුදන්ව අඳුරක් ඉහිර ඇති අන්දම සමන්තිනී වගේම විසෙන්තිආරච්චි නෝනාද දුටුවාය.

**"අම්මේ... ඔයා දන්නවද... මේ ඉන්නේ තේනුකගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්..."**

සිනාසීගෙන ඔවුන් හමුවට ආ විසෙන්තිආරච්චි නෝනාගේ සිනාව සැනින් මැකී කට තද වුණාය.

ලබන සතියට

# කවි යාය

සංස්කරණය **ලිහිණි මධුෂිකා**

## අස්වැසුම

දුප්පතාගේ හිස්වැසුම
ගලවා
ධනපති පන්තියට
පැළඳූ අපූරුව

**අනුර ප්‍රියන්ත ලියනගේ**
**හිනටිගල**
**තල්පේ**

## මහවැලි අම්මා

නිල්ල නගන කෙත් යායයි
පින්බර සිත් මා
හිතේ තියන් දුක් කරදර
මෙතැකැයි නිම්මා
පීදෙන රන්වන් ගොයමේ
සුවඳැල් සේ මා
සාරකෙතේ නුඹයි අපේ
මහවැලි අම්මා

**ප්‍රියන්ත සමරකෝන්**
**ගිරාඳුරුකෝට්ටේ**

## නොමග ගිය තාරුණ්‍යය

වදපු හින්දයි මව්පියෝ මට දලා තිබ්බේ දිග නමක්
හැදුනෙ වැඩුනෙත් පිටිසරයි ඒක ලස්සන පොඩි ගමක්
අකුරු කරනට ගියේ පාසැල් පේන නොපෙනෙන කෙටි දුරක්
ලියන පොත් ටික ගත්තෙ ණයටයි ඒක ඇත්තට මහ බරක්

හිටියෙ පුංචිම ලැලි ගෙදරක තිබ්බෙ නැහැ ඒකට දොරක්
අවට ඉන්නෙත් ඉබාගාතේ පිනට අත්හල එළ හරක්
අගුල බිඳගෙන පුංචි වස්සා හිටියෙ ගේ තුළ එක වරක්
ඌව ගන්නත් දොරෙන් එළියට දැරුවෙ තනියම මහ
වෙරක්

ගමෙන් නගරෙට ආවෙ තනියම ගෙවාගෙන ඇවිදන් දුරක්
කෙමින් තනියම හැඳිනගත්තා හිතක් පපුවක් නැති රැළක්
හොරෙන් හිතුණා මටත් වෙන්නට බජාර් එකටම ලොකු පොරක්
බලෙන් හැමවිට අංචි ඇද්දේ හිතේ නැති ලෙස කිසි
බියක්

දැනන් හිටියත් හොඳයි නරකයි ඒත් මට නම් නැහැ වැඩක්
උගත්කමකට මිලක් නැත්නම් කුමට ලත වී නැත පලක්
බුදුන් වැන්දත් දහම් රැක්කත් තොලේ ගානව මදු විතක්
මෙහෙම දිවියක් උරුම වූයේ නැති නිසයි මට හොඳ රටක්

**ජයන්ත දිසානායක**
**මාකුඹුර**
**පන්නිපිටිය**




ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?
- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

රු. 35000/- කට වැඩි ආදායමක්
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.
- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ
වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955

උගස් රන් භාණ්ඩ
උගසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන් පවුම 195,000
077 410 78 45
SL PROMO

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 180,000/- කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

උකස් රත්තරං
සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවය
පවුම - 200,000/-
077 944 51 20
SL PROMO



ගෙදර ඉදන් සල්ලි හොයමුද?
60000 කට වැඩි පිරිසක් 100% ක් සාර්ථකව ආදායම් ලබන කණ්ඩායමේ සාමජිකයෙක් වෙන්න එන්න..
හොඳ මාසික ආදායමක් උපයන විදිය හරියටම කියලා දෙන වැඩමුළුව
2023/07/29 වන දින සවස 1 ට
ගොඩගම Avana Grand හෝටලයේදී පැවැත්වේ
නොමිලේ ඔබේ ආසනය වෙන් කරවා ගන්න. (ආසන සීමිතයි)
වැඩිවිස්තර සඳහා WhatsAapp 076 777 16 62

ටික් ටොක් කරන්න තෑගි දිනාගන්න
හොඳම ටික් ටොක් තරුව වන්න මුදලින් තෑගි දිනාගන්න
තරඟය සඳහා ඉදිරිපත් වීමට විමසන්න
071 414 28 04
වේයන්ගොඩ

වෘත්තීය බැංකු ඇබෑර්තු
★ ප්‍රමුඛතාවයට පත්වෙමින් පවතින ආධුනික බැංකු පුරප්පාඩු සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
වැටුප 40,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0742 916 140 | 0774 024 155

ජීවිතේම ගොඩගැසූ හීන එක් මොහොතකින් සුනුවිසුනු වුනාද?
ජීවිතේ වගේ ආදරය කල සැමියා/බිරිඳ, පෙම්වතා/පෙම්වතිය හැර ගියාද?
ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද?
ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?
❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
❖ රැකියා ලබා ගැනීමට ❖ හැර ගිය අය ගෙන්වීම
පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: 071-0 314 878
මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී
උපන් දිනය / උපන් වේලාව සමග අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්
පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)





සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

**පාඩම් අංක 78**

# අඟුරු විකුණන්නෙ තොපිට පිස්සුද?

බුදුහාමුදුරුවෝ දෙව්රමේ වැඩ වසපු කාලේ සැවැත්නුවර සතළිස් කෙලක් රත්තරං තියෙන සිටු පවුලක් හිටියා. දවසක් මේ සිටුතුමා රත්තරං ගබඩාව ඇරලා බලද්දි රත්තරං සේරම අඟුරු බවට පත්වෙලාලු. අනේ ඉතින් මේ සිටුතුමා කෑමබීම අතෑරලා ඇඬූ කඳුළෙන් කල්ගෙව්වා. සිටුතුමාගේ සංතාපේ දැකපු හිතවතෙක් සිටුතුමාට මේන් මෙහෙම සැනසිලි බස් දෙඩුවා.

"යාළුවා, දැන් ඉතින් අඬලා වැඩක් නැහැ. මේ අඟුරු ආයෙත් රත්තරං කරන්න පුළුවන් උපායක් මම කියන්නම්. අපි මේ අඟුරු පොළට අරන් යමු."

සිටුතුමාත් ඇඬිල්ල නතර කරලා යාළුවාගේ අදහසට කන් දුන්නා.

"මොකද මේ අඟුරු විකුණන්නෙ තොපිට පිස්සුද? කියලා කවුරු හරි ඇහුවොත් අපි විකුණන්නේ අපිට තියෙන දේනේ කියලා කියන්න. හැබැයි කවුරුහරි ඇවිල්ලා මොකද මේ රත්තරං විකුණන්නේ කියලා ඇහුවොත්, කොහේ තියෙන රත්තරංද? අතට අරන් පෙන්වන්න කියලා කියන්න. ආන්න ඒ කෙනා අත තිබ්බ ගමන් මේ අඟුරු සේරම රත්තරං වෙයි. ඒ කෙනා කුමාරිකාවක් නම් ඔබතුමාගේ පුතුට විවාහ කර දෙන්න. කුමාරයෙක් නම් දියණියට විවාහ කර දෙන්න."

හිතවතාගේ උපදෙස් ඉස්මුදුනින් පිළිගත්තු සිටුතුමා අඟුරු ටික ගැල්වලට පටවන් පොළට ගියා. හිතවතා කිව්වත් වගේ අඟුරු විකුණන පිස්සෙක් කියලා මිනිස්සු සිටුතුමාට කයිකතා කිව්වා. ඔන්න ඒ අතරේ දුප්පත් වුණු සිටුපවුලක කෙට්ටු කුමාරිකාවක් සිටුවරයා ළඟට ආවා.

"ඔබතුමා ඇයි මේ පොළේ තියාගෙන රත්තරං විකුණන්නේ?"

"කෝ කොහේ තියෙන රත්තරංද? අතට අරන් පෙන්වන්න."

සිටුතුමා කිව්වහම කුමාරිකාව අඟුරු ගොඩට අත තිබ්බා. කුමාරිකාව අත තියාපු හැටියේ අර අඟුරු සේරෝම ආයෙම රත්තරං බවට පත්වුණා. පස්සේ මේ සිටුතුමා ඇයව ඔහුගේ පුත්‍රයට සරණපාවා දුන්නා. ඔය කියාපු කුමාරිකාව තමයි පස්සේ කාලෙක කිසාගෝතමිය විදියට මැරිච්ච පුතු සුව කරන්න නොමල ගේකින් අබ හොය හොයා දිව්වේ.

කතාවේ කියන හැටියට කිසාගෝතමී අත තියාපුවාහම අඟුරු රත්තරං බවට පත්වෙනවාලු. ඒ කතාවල ඇත්ත නැත්ත නොදත්තත් අඟුරු රත්තරං කරන්න පුළුවන් අපූරු ක්‍රමයක් අපි දන්නවා. අද ස්වයං රැකියා පාඩමෙන් කියලා දෙන්නේ ඒක.

අඟුරු විකුණන්න පිස්සුද? කියලා කිසාගෝතමීගේ කතාවේ කියලා තිබුණට අද වෙනකොට අඟුරු විකුණන එක මහා පරිමාණ කර්මාන්තයක්. බලශක්ති අර්බුදයට විසඳුමක් විදියට ලෝකේ පුරාම රටවලින් අඟුරුවලට ලොකු ඉල්ලුමක් තියෙනවා.

අඟුරු කියලා කිව්වට අපි මේ කතා කරන්නේ අඟුරු කැට (Briquettes) ගැන. අඟුරු කැට කියන්නේ අඟුරුවලින් හදන කැට වර්ගයක්.

මේ අගුරු කැටවලින් ගන්න පුළුවන් වැඩ ඕසෙට. බාබකියු දද්දි ගොඩක් උදවිය පාවිච්චි කරන්නේ අඟුරු කැට. පිටරටවල ට්‍රැවල් කරන ඈයෝ කෑම පිහගන්න, ගිනිගොඩවල් ගහගන්න අඟුරු කැට පැකට් අරගෙන යනවා. ඒ අය සීත කාලෙට උදුන් ගහන්න ගන්නෙත් මෙව්වා. ඒ නිසා පිටරටවලින් අඟුරු කැටවලට ලොකු ඉල්ලුමක් තියෙනවා. ඉන්දුනීසියාව, උගන්ඩාව, ඉන්දියාව වගේ රටවලින් තමයි පිටරටට අඟුරු කැට පටවන්නේ. අවාසනාවකට ලංකාවටම තියෙන්නේ එකම එක අඟුරු කැට ෆැක්ටරියයි. පහුගිය දවස්වල අපේ රටේ විශාල බලශක්ති අර්බුදයක් ඇති වුණානේ. එවෙලේත් මේ අඟුරු කැටවලට බරසාර ඉල්ලුමක් තිබුණා. හැබැයි අඟුරු කැට නිෂ්පාදකයෝ අඩු නිසා ඒ ඉල්ලුමට සරිලන සැපයුමක් තිබුණේ නෑ. අනික මේ අඟුරු කැටවල දුම නැහැ. පැය ගාණක් පත්තු කරගන්න පුළුවන්. අරගෙන යන්න කාරිය පහසු නිසා ඉල්ලුම වැඩියි. මහල් නිවාසවල ජීවත්වෙන අයටත් මේක හොඳ බලශක්ති විකල්පයක්. හරියට කරගන්න පුළුවන් නම් මේක අඟුරු රත්තරං කරන්න පුළුවන් විදියේ බිස්නස් වැඩක්.

හැබැයි ඉතින් මේක බොහොම ප්‍රමිතියට කරන්න ඕන. අඟුරු කැටයක ප්‍රමිතිය බලන සාධක තුනක් තියෙනවා. එකක් තමයි අඟුරු කැටේ බර. මිලිමීටර් 25ක අඟුරු කැටයක් 16gක් හෝ ඊට වඩා බර වෙන්න ඕනේ. ඊළඟ දේ අඟුරු කැටේ පත්තු වෙන වෙලාව. සල්ලි දීලා අඟුරු කැට අරන් ගියාම ඒක පත්තු වුණේ විනාඩි 5ක් නම් ආයෙත් කවුද එතැනින් අඟුරු ගන්නේ? සාමාන්‍ය අඟුරු කැටයක් පැය 2 ක් හෝ ඊට වඩා වැඩි වෙලාවක් පත්තු වෙන්න ඕන. අවසාන කාරණාව අඟුරු කැටේ පත්තුකරලා බිම අතෑරියාහම ඒක නොකැඩෙන්න ඕනේ. මොකද පත්තු කරපු අඟුරු කැට උඩ ඉඳලා බිමට වැටුණොත් ඒවා ගින්දර එක්ක තැන තැන විසිරිලා අනතුරක් වෙන්න පුළුවන්. ඒ නිසා පාරිභෝගිකයෝ මේ කාරණා ගැනත් සැලකිලිමත්.

හරි ඔය කියාපු ප්‍රමිතියට අඟුරු කැට හදන්නේ කොහොමද කියලා දැන් බලමු.





අඟුරු කැට හදන්න අපිට පාවිච්චි කරන්න පුළුවන් අමුද්‍රව්‍ය කිහිපයක් තියෙනවා. පොල්කටු, පොල් ලෙලි, දහයියා, දැව. මේ අමුද්‍රව්‍ය ඕන එකක් අඟුරු කැට හදන්න පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි පොල්කටු අඟුරුවලින් හදන අඟුරු කැටවලින් හොඳ බරක් ගන්න පුළුවන්. කිසිම වෙලාවක මේ සේරම ජාති කලවම් කරලා කැට හදන්න යන්න එපා. එතකොට එන්නේ බාල අඟුරක්. වැටිච්චි හැටියේ කැඩෙනවා. පොල්කටු ප්‍රමිතිය වැඩි නිසා පොල්කටු අඟුරින් අඟුරු කැට හදන හැටි අද කියලා දෙන්නම්. පොල්කටු අඟුරු 1kg 250gක් එන තරමට පොල්කටු පුච්චගන්න. වාතය නොවදින විදියට පොල්කටු ආවරණය කරලා පුච්චගන්න තරමට කොලිටිය වැඩියි. ඒකට ලොකු බැරල් එකක් පාවිච්චි කරන්න පුළුවන්. හරියට පොල්කටු අඟුරු හදාගන්න හැටිත් මීට කලින් අපි කියලා දීලා තියෙනවා.

පොල්කටු අඟුරු 1kg 250gට අමතරව කෝර්න් පිටි (food starch) 500g, වතුර 1l ක්, අවශ්‍ය වෙනවා. අඟුරු කැට හදන්න අච්චුව හදාගන්න හැටි මිශ්‍රණය හදාගත්තට පස්සේ කතා කරමු.


මුලින්ම පොල්කටු අඟුරු ටික පිටි වෙන්න කුඩු කරගන්න. ග්‍රයින්ඩර් එකකින් කුඩු කරගන්න පුළුවන් නම් වැඩිය හොඳයි. මොකද කුඩුවෙන තරමට අඟුර කැඩෙන්න තියෙන ඉඩ අඩුයි. කුඩු කළ අඟුරු ටික පැත්තක තියලා භාජනයක් ලිපෙන් තියලා කෝර්න් පිටියි, වතුර 1l යි එකතු කරලා හැඳි ගාන්න. මිශ්‍රණය හොඳට ඝනකම් වුණාට පස්සේ අර අඟුරු කුඩුවලට කෝර්න් පිටි මිශ්‍රණය දාලා හොඳට මිශ්‍ර කරන්න.

අඟුරු කැට හදන්න අපිට යකඩ රවුම් බට කෑල්ලක් අවශ්‍යයි. රවුම ඇතුළට ඇතුළු කරන්න පුළුවන් විදියේ යකඩ රවුමක් කපලා ඒකට යකඩ මිටක් හයි කරගන්න. හදාගත්තු මිශ්‍රණේ යකඩ බට කෑල්ල ඇතුළට දාලා අර අච්චුවෙන් තලලා හොඳට පීඩනය ලබාදෙන්න. එතකොට තමයි අඟුරු කැටේ සෙට්වෙන්නේ. හොඳට තලන තරමට අඟුරු කැටේ ශක්තිය වැඩි වෙනවා. තලාගත්තට පස්සේ පිට්ටු බම්බුවෙන් පිට්ටු අහක් කරනවා වගේ අච්චුවෙන්ම අඟුරු කැටේ එළියට ගන්න. ඔහොම හදාගන්න අඟුරු කැට ටික කම්බි දැලක් උඩින් තියලා දවස් 2/3ක් හොඳට වේලගන්න. එච්චරයි.


10kgක අඟුරු කැට පැකට් එකක් හදන්න වියදම් වෙන්නේ රුපියල් 800ක වගේ මුදලක්. හැබැයි මේ පැකට් එක රුපියල් 6000කට අලෙවි කරන්න පුළුවන්. ඉතින් අඟුරු රත්තරං කිව්ව කතාව බොරුද මං අහන්නේ? අඟුරු රත්තරං කරන්න කැමති නම් තව විස්තර දැනගන්න 0714766819ට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි












කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.